# මහ සභා රැස්වීම - 2025.07.11 දින
# අලව්ව ප්‍රාදේශීය සභාව

2025.07.11 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ තෙවන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ  ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
2. ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්. අකිල මධුජිත් කුමාර මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.පී. චන්ද්‍රසිරි මිගාර් පතිරණ මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සිසිර කුමාර රාජපක්ෂ මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.එච්. කපිල පද්මසිරි යාපා මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.පී. අජන්තා නීලකුමාරි මැතිනිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එම්.ඒ. චන්දිමා ලක්මාලි මල්ලව ආරච්චි මැතිනිය

**මෙදින සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා / මන්ත්‍රීතුමියන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.චමින්ද මාල් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එස්.එම්. යසින්තා සජීවනී සේනාරත්න මැතිනිය

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VII වන සැසිවාරයේ තෙවන  මහ සභා රැස්වීම සඳහා පැමිණි ගරු උප සභාපතිතුමිය ප්‍රධාන සියලු ගරු මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලා මා ඉතාමත් ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා. එමෙන්ම, අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය සහ එම නිළධාරීන් සියලු දෙනාත්, මේ අවස්ථාවට සම්බන්ධවන මාධ්‍යවේදීන් සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

**01.2025.06.26 වන දින මහ සභා රැස්වීම් වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

2025.06.26 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව සභා සම්මත කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, 2025.06.26 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධනවලට යටත්ව ස්ථිර කිරීම සුදුසු බවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

**2025.06.26 දින මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන**

I. මහ සභා රැස්වීම් වාර්තාවේ 22 පිටුවෙහි සඳහන් 2025 මැයි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ස්ථිර කිරීම සිදු කිරීම නිවැරදි කිරීම.

ඒ අනුව, 2025 මැයි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා විසින් ස්ථිර කරන බවට නිවැරදි කරමින් සංශෝධනය කෙරේ.

ඒ අනුව, 2025.06.26 දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධනවලට යටත්ව පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**02.ගරු සභාපති තුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**2.1** පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් සංවිධානය කරනු ලබන පළාත් පාලනය පිළිබඳ දෙවන අන්තර්ජාතික සමුළුව 2025

පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ අධ්‍යක්ෂ විසින් යොමු කර ඇති SLILG/RD/ConF/02/2025 හා 2025.07.01 දිනැති ලිපියෙන් පළාත් පාලන ක්ෂේත්‍රයේ කටයුතු කරනු ලබන මහජන නියෝජිතයින් , වෘත්තිකයින් , විද්‍යාර්ථයින් මෙන්ම එම විෂය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන වෙනත් තැනැත්තන්ට පර්යේෂණ එළි දැක්වීම සඳහා අවස්ථාවක් ලබා දීමේ අරමුණින් පළාත් පාලන පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය මගින් සංවිධානය කරනු ලබන පළාත් පාලනය පිළිබද දෙවන අන්තර්ජාතික සමුළුව **2025 සැප්තැම්බර් 11 (බ්‍රහස්පතින්දා) සහ 12 (සිකුරාදා)** දිනයන්හිදී ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත්වීමට නියමිතය. ඒ සඳහා පළාත් පාලන ආයතන /මහජන නියෝජිතයින් සහ නිලධාරීන් විසින් සිදු කරන ලද පරීක්ෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට හැකියාව ඇත. සමුළුව සඳහා සහභාගී විය හැක්කේ පරීක්ෂණ පත්‍රිකා ඉදිරිපත් කරන්නන් සඳහා පමණක් බවද , පරීක්ෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට අදාල සියලු තොරතුරු ඇතුලත් පත්‍රිකාව ප්‍රධාන කාර්ලයෙන් ලබා ගත හැකි බව දැනුම් දීම සභාගත කරන ලදී.

**03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම - නැත**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**

**05. යථා පරිදි කල්දී ඇති යෝජනා**

**(05-1)** ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක **07/03/05/01** දරණ යෝජනාව

අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 985 - කන්දෙගෙදර උතුර ග්‍රාම නිලධාරී වසමේ කන්දෙගෙදර ගමෙහි අ.ග.පි.444 හි කැබලි අංක 648 හා 650 න් අක්කර 01 පර්චස් 28 ක පමණ ඉඩම් කොටසක්(වැලිකරේ සමෘද්ධි බැංකුව අසල) කොහුබත් ආශ්‍රිත කර්මාන්ත ශාලාවක් ඉදි

කිරීම සඳහා දීර්ඝ කාලීන බදු පදනම යටතේ ලබා දෙන ලෙස පන්ගොල්ල, මහරච්චිමුල්ල යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ.ගයාන් ප්‍රසන්න කාරුණාතිලක යන අය විසින් ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, අදාල ඉඩම් කොටස ලබා දීම සඳහා අලව්ව ප්‍රාදේශීය සභාවේ එකඟතාවය ලබා දීම සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස අලව්ව ප්‍රාදේශීය ලේකම් විසින් 2025.06.14 වන දින අංක DIVAL/LND/LTLEA/8/1/22 යටතේ මා වෙත ලිපියකින් දන්වා ඇත. ඒ අනුව, ඉහත සඳහන් ඉඩම බදු පදනම යටතේ ලබා දීමට සභාවේ එකඟතාවය ලබා දීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව ස්ථිර කිරීමත් සමඟම විරෝධතාවය ගොනු කරනවා. මෙහි අතීතයට යනවා නම් යූ.බී. විජේකෝන් අමාත්‍යවරයා , වැත්තෑවේ ගරු මන්ත්‍රීතුමන්ලා ඉන්න කාලයේ සිට උප සංස්කෘතියකට උප නගරයකට වෙන් වුණ භූමියක්. එහෙම තිබිලා පසුගිය කාලයේ මතක හැටියට, ප්‍රාදේශීය ලේකම්වරයා සමඟ කටයුතු කරපු ලලිත් ඇතුලත් මුදලිතුමාගේ කාලයේ ගාමිණී ගුණදාස මහතාගේ කාලයේ කරුණාරත්න කළුආරච්චි මහතා කතා කරයි, ගමෙන් ඉල්ලීමක් ආවා රැකියා 500ට වැඩිය දෙන්න පුළුවන් අවස්ථාවක් උදා කරලා දෙන්න කියලා. ඊට පස්සේ ඒකට අවශ්‍ය කරන පසුබිම සකස් කරලා කොළඹින් කර්මාන්ත ශාලාවක් ගේන්න ආයෝජකයෙක් ඇවිල්ලා ඒ කටයුත්ත කරන්න හැදුවාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉඩම මැන්නෙත් නැහැ. ඉඩමේ වාර්ෂික බදු පදනමට මඤ්ඤොක්කා ගහක් , කෙහෙල් ගහක් හදපු අයව අයින් කරන්න බැහැ කියන ප්‍රශ්නය ගෙනාවා. එහෙම එක දිගට ඇවිල්ලා පස්සේ කාලයක නැවත වතාවක් තෙල් මෝලක් හරි මොකක් හරි ඉදි කලා. ඒ හැම වෙලාවකම මේ සභාවෙන් අහපු දෙයක් තමා කොපමණ රැකියා ප්‍රමාණයක් උත්පාදනය වෙනවාද කියලා . කර්මාන්ත ශාලාවක් හදන්න රජය සතු ඉඩමක් කවදා හරි ලබා දෙන කොට මේකේ දීර්ඝ කාලීන බද්ද ගැන කතා කරලා ඇති. ඩිස්කවුන්ට් එක ගැන. හැබැයි ගරු සභාපතිතුමනි මෙතැන රැකියා කොපමණ ප්‍රමාණයක් උත්පාදනය වෙනවාද කියන එක මේ ඔක්කොටම වැඩිය එහා ගිය ප්‍රශ්නයක් තියනවා. ඔබතුමාට මතක ඇති ගිය සභාවේ ඉන්නකොට සභාවෙන් අහන්නේ නැතිව බෝයවලාන පොලිසිය ඉදි කරන්න ඉඩම දුන්නා. අවසානයේ එච්.එම්.ජයතිලක මන්ත්‍රීතුමත් , නාරද සිරිවර්ධන මන්ත්‍රීතුමත් කතා කරාම ප්‍රතිඵලය වුනේ ඒ ඉඩම දීපු එක නිසා පොලිසියට අවශ්‍ය කරන අනෙක් කටයුතු කර ගන්න විදිහක් නැහැ. සභා අවසරයකින් තොරව ඉඩම දීපු නිසා ගොඩනැගිල්ල රෙපයාර් කර ගන්න විදිහක් නැතිව ගියා. අවසානයට මේ සභාවට යෝජනාව එව්වා. අවසානයේ මේ සභාවෙන්, අපෙන් සමාව ඉල්ලලා ඒකට යන්නේ. ඒක රාජ්‍ය ආයතනයක් සහෝදර ආයතනයක් නිසා ගැටලුවක් මතු වුණේ නැහැ. මට තියෙන ප්‍රශ්නය ප්‍රදේශයේ ජනතාව තමන්ගේ ඉඩමේ පදිංචි වෙලා ඉන්නවා, ස්වර්ණභූමි ඉඩමේ හතරදෙනෙක් ඒක නිරවුල් කරගන්න, ඒ ගෙදර ඉන්න වයසක අම්මා ප්‍රාදේශීය ලේකම්තුමියට කතා කලා. එහෙත් ඒක පෙරටු කාර්යාලයට දාලා අවුරුද්දක් දෙකක් යනවා නිරවුල් කරගන්න. මේක මේ අප්‍රේල් මාසයේ 30 වෙනිදා වෙනකොට ඉඩම බදු දෙන්න මිනුම් කටයුතු කරලා ඔක්කොම කරලා බොහොම උනන්දුවකින් තමා තීරණය කරලා තියෙන්නේ. හරියට මේ ගොඩනැගිල්ලක් ඉදි කර ගන්න අපේ සභාව, අපේ කට්ටිය මහන්සි වෙලා කට්ටිය දාලා මේ ගොඩනැගිල්ල ඉදි කර ගත්තොත් තමා සභාවට වරිපනම් එන්නේ කියලා අපි වැඩ කරනවා වගේ ඒ වැඩ පිළිවෙල ඒ විදිහට තමා ගියේ.

ගරු සභාපතිතුමනි , මෙතැන අනික් මහජන නියෝජිතයින් මොනවා කියනවාද දන්නේ නැහැ. අපිට ප්‍රශ්නයක් තියනවා. මම ඔබෙන් ඉල්ලීමක් කරනවා. රජයේ ඉඩම් බදු දීමේදී ප්‍රාදේශීය සභාවට යොමු කරන්නේ මහජන නියෝජිතයින්ටයි. මහජන මන්ත්‍රී මණ්ඩලය තමා ගමට වග කියන්නේ. නිලධාරීන් එනවා. රජයේ නිලධාරීන් යනවා. නිලධාරීවාදයත් එක්ක ගිය එකක් තමා මට පේන්නේ. මම ඔබෙන් ඉල්ලීමක් කරනවා අද මේ සභාවේ කවුරුත් එකඟ වෙයි. මේක මේ සභාවෙන් නැවත වතාවක් කමිටුවට යොමු කරලා. කමිටුවේ සාකච්ඡා කරලා සභාවේ ගරු සභාපතිතුමා, කාර්මික නිලධාරීන් සහ ඒ ප්‍රදේශය භාරව ඉන්න මහජන නියෝජිතයින් සම්බන්ධ කර ගනිමින් ස්ථානීය පරීක්ෂණයක් කරමු. ඒ ප්‍රදේශය භාරව අරුණ මන්ත්‍රීතුමා ඊළගට අනිල් කරුණාරත්න මන්ත්‍රීතුමත් ඉන්නවා. ඊට පස්සේ තමුන්නාසේලාගේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමත් ඉන්නවා. මේ මන්ත්‍රීවරු තුන්දෙනාගෙන් යම්කිසි දවසක මිනිස්සු ඇහුවොත් " අපි පොදු වැඩක් කෙරුවාම ඒ පොදු වැඩේ කර ගන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අවුරුදු තුන හතරක් කල් මරනවාද මේක අප්‍රේල් මාසයේ 30වෙනිදා ඉතා

ක්ෂණිකව ක්‍රියාත්මක වෙන්න තිබුනේ. තමුන්නාසේලා බුදියගෙනද හිටියේ කියලා". මහජන නියෝජිතයින් තුන්දෙනා දැඩි සේ දෝෂ දර්ශනයට ලක් වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි , කමිටුවකට ලක් කරන්න. මෙම ව්‍යාපාරය වෙනුවෙන් බදු ඉල්ලපු පුද්ගලයා කවුද කියන්න මම දන්නේ නැහැ. මට අදාලත් නැහැ. ඒ සම්බන්ධව මගේ කිසිම ගැටළුවකුත් නැහැ. ඒ කමිටුවේදී සාකච්ඡා කරලා අවසන් තීරණයකට ඇවිල්ලා ඒ තීන්දුව අනුව ඊලග මහ සභාවේ මේ සම්බන්ධව යෝජනාව සම්මත කරලා යවන එකයි සුදුසු කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා**

ගරු සභාපතිතුමනි , ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා මතු කරපු කාරණය සමඟ මම එකඟ වෙනවා. අපිටත් මේක ප්‍රශ්නයක් වෙනවා. මොකද මෙච්චර විශාල ප්‍රමාණයේ ඉඩමක් කර්මාන්ත ශාලාවකට අවශ්‍ය නැහැ. අනෙක් කාරණය තමයි මේ ඉඩම වටිනා කියන තැනක පිහිටි ඉඩමක් . ඒ නිසා මම හිතන්නේ ඒ පිළිබදව සුදුසු ක්‍රියාමාර්ග ගමු. හේතුව මේක වටිනා ඉඩමක් සහ මීට වැඩිය මේකේ ලොකු ව්‍යාපෘතියකට යන්න පුළුවන් ඉඩමක්. ඒ නිසා මම යෝජනා කරනවා. මේ විදිහට අපි සාකච්ජා කරලා ඉදිරියේදී කටයුතු කරමු කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. අපේ ජ්‍යෙෂ්ඨ මොහාන් මන්ත්‍රීතුමා ගෙන ආව යෝජනාවට මම එකඟ වෙනවා. මේ ගැන කොහොමත් මම කමිටුවකදී හෝ කතා කරන්න හිටියේ. මේ ඉඩම පිටුපස තියෙන්නේ ලොකු වැවක්. මම මේ භූමිය පරීක්ෂා කලා. ඒ වැව කන්දෙගෙදර උතුර ප්‍රදේශයේ තියෙන්නේ. මේ කොහුබත් කර්මාන්ත ශාලාවෙන් ඒකට හානියක් වෙන්නත් ඉඩ තියෙනවා. ඒ නිසා මම වැඩිදුර කියන්නේ නැහැ. අපේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා කියන විදිහට, ප්‍රාදේශීය සභා මන්ත්‍රී මණ්ඩලය කියන විදිහට ස්ථානීය පරීක්ෂණයක් කරමු. මම කන්දෙගෙදර කොට්ඨාශයේ මහජන නියෝජිතයෙක් විදිහට කන්දෙගෙදර උතුර ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රියාවලිය අපි ගන්න වෙලාවේ, ගොවි මහත්වරු ටික ඉල්ලීමක් කරා අපිට කෘෂි කර්මය සම්බන්ධයෙන් මොනවා හරි වගාවක් කර ගන්න මේ ඉඩම අපිට බදු අරන් දෙන්න කියලා. ඒ ගැනත් සලකා බලමු කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මොහාන් මන්ත්‍රීතුමා මතු කරපු ප්‍රශ්නය ගැන සඳහන් කරනවා නම් ඇත්තටම ඔබ තුමාගේ නායකතුමා කියන විදිහට අපි මේ රටේ කර්මාන්ත ශාලා මේකේ බිහි කරන්න ඕනි. ඒක අපි විවාදයකින් තොරව පිළිගන්න ඕනා. ඒ නිසා ඒ කටයුත්ත ගැන නෙවෙයි අප කතා කරන්නේ. ඇත්තටම මේ රට දියුණු වෙන්න ඕනි නම්, විදේශ ප්‍රේෂණ අපේ වැඩි වෙන්න ඕනි නම් ග්‍රාමීය කර්මාන්ත කොටස වැඩි වෙන්න ඕනා. එහෙම නැතිව කවදාවත් මේ රට හදන්න බැහැ. දැනටමත් මේ රටේ ආර්ථිකයෙන් 70% තියෙන්නේ සේවා. 30% වත් කර්මාන්ත නැහැ. එතකොට මේ රටේ ආදායම් තුලනය අපිට ගණනය කරන්න බැහැ. ඉතින් ඒක නිසා කර්මාන්ත කියන කොට මහලොකු බිල්ලෙක් මවනවා. අපි ඕනෑම කර්මාන්තයක් මේ රට තුළ ඇති කරන්න යහපත් නිර්ණායක තියනවා. ඕනම කර්මාන්තයක් ගත්තහම ප්‍රදේශයේ යම් විරෝධතා එන්න පුලුවන්. ඒ වගේම නොයෙකුත් ආකාරයේ විරෝධතා ගන්න පුළුවන්. කර්මාන්ත ශාලාවකට යනවට විරෝධතාවයක් නැහැ. නමුත් මේකේ යම්කිසි ක්‍රමවේදයක් තියෙන්න ඕන.රජයේ ඉඩමක් නිසා. මම හිතන්නේ මෙතන ඉස්සර වෙලා පළතුරු ව්‍යාපෘතියත් එක්ක පේර හදපු ව්‍යාපෘතියක් තිබුණේ. මට මතකයි. ඉතින් ඊට මෙහා පැත්තේ තියනවා. ඔබතුමා අවධානයට ලක් කරන්න , අවුරුදු ගණනාවක් තිස්සේ පස් කපපු අක්කර 2ක විතර ලොකු වලක් තියනවා. ඔබතුමා අවධානයට ලක් කරන්න. ඒ ප්‍රදේශයේ මන්ත්‍රීවරු ඉන්නවා නම් ඒ ගැන දන්නවා ඇති. අන්න ඒවා සංවර්ධනය කරල ගන්න පුලුවන්නම් ආයෝජකයෙක් දෙනවා නම් ඒ ඉඩමේ වටිනාකම වැඩි වෙනවා. මම හිතන්නේ අපේ මොහාන් මන්ත්‍රීතුමා ප්‍රශ්නය මතු කරේ, අපිට මේකේ දීර්ඝ කාලීනව බදු දෙනවද එහෙම තැත්නම් අවුරුදු තුනකට වගේ බද්දකට ඇවිල්ලා ඊට පස්සේ යම්කිසි අවස්ථාවක රටේ ප්‍රදේශයේ යම් කිසි රජයේ ව්‍යාපෘතියක් ආවොත් ඒ කොටස අපිට ගන්න පුළුවන්ද . එහෙම නැත්නම් මේ යන ක්‍රමවේදය ගැන පොඩි පසු විපරමක් කරලා අපි මේකට අනුමැතිය ලබා දීම සුදුසුයි කියන එක තමයි අපේ සාකච්ඡාව . ඒක නිසා, මම හිතන්නේ අපි වැරදි මතයක ඉන්න ඕනි නැහැ. කර්මාන්ත ගත්තහම අපි යකෙක් වගේ දකින්නේ. හැම වෙලාවෙම ගමක් ඇතුලේ කර්මාන්තයක් ගත්තහම කොහොමද ගමේ මිනිහා ඔලුව උස්සනවාද කොහොමද පෙත්සමක් ගහන්නේ කියලා. විශේෂයෙන්ම කර්මාන්ත කරුවෙක් විදිහට මම හිටපු කර්මාන්ත අංශයේ ඉහළ තනතුරක් දරපු අයෙක් විදිහට

කර්මාන්තයක් ඉස්සරහට ගෙනියන්න විශාල පරිශ්‍රයමක් යොදන්න ඕන. ඒවගේම ප්‍රාග්ධනය , සේවකයෝ යොදන්න ඕනා. අප මතු කරන තර්කය තියෙන්නේ එක පාරටම මේක ලබා දෙන්නේ නැතිව අපේ මන්ත්‍රී මණ්ඩලයේ 26 දෙනාටම පොදු ප්‍රශ්නයක් මේක. ඒ නිසා මේක තිස් අවුරුදු බද්දකට වගේ යන්නේ නැතිව අවුරුදු තුනකට, අවුරුදු පහකට වගේ ගිහිල්ලා. තව පොඩි ගැටළුවක් තියනවා. මේ කර්මාන්තකරු ආයෝජනය කරන ප්‍රමාණය , අපි කියමුකෝ කෝටි 05-10 ක් කියලා. ඒ මනුස්සයා අවුරුදු තුනකට කැමති නැති වෙන්නත් පුළුවන්. ඒ නිසා අන්න ඒ සියලුම දේවල් පොදුවේ පක්ෂ විපක්ෂ අපි සියලු දෙනාම සාකච්ඡා කරලා පිළිගත හැකි ක්‍රමවේදයකට එනවා නම් හොඳයි. මම හිතන්නේ පළාතේ සෑම ගමකම කර්මාන්ත ඉදි වෙනවා නම් හොඳයි. ඒකට අනවශ්‍ය සාධක තියෙනවා නම් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය නිලධාරීන් විදිහට , පරිසර නිලධාරීන් විදිහට මේකට කටයුතු කරන්න පුළුවන්. පරිසරය අපවිත්‍ර වන දේවලට වෙනම නිර්ණායක තියනවා. හැබැයි ඒ යන අතරේ මේ කර්මාන්තය යන්නත් ඕනා. ඒක තමා රටක ආර්ථික දියුණුව කියන්නේ. ඒක නිසා තමා අනෙක් රටවල් දියුණු වෙලා තියෙන්නේ. ඉන්දියාව වගේ රටවල මේ හැම දෙයක්ම බලාපොරොත්තු වෙනවා. නමුත් කර්මාන්තත් යනවා. දැන් අපේ රටේ වෙලා තියෙන්නේ කොහේ හරි එකක් දැක්කොත් උද්ඝෝෂණය කරනවා. එහෙම නැතිනම් පෙත්සම් ගහනවා. ගහලා ඒ කර්මාන්තකරුවා සමතලා කරලා දානවා. ඒක නෙවේ රටක පැවැත්ම , රටක සංවර්ධනය කියන්නේ. ඒක නිසා අපි කියන්නේ පිළිගත් ක්‍රමවේදයකට මේක සභාවේ, අපේ කමිටුවක් පත් කරලා ඉන්න කර්මාන්තකරුවන්ගේ ඒ ප්‍රශ්න බලලා ඒ අයටත් සහයෝගයක් වෙන විදිහට මේ කටයුත්ත කරමුයි කියලා තමයි අපේ කණ්ඩායමේ අදහස වෙන්නේ.ස්තූතියි .

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. ඒ. කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමා ප්‍රමුඛ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, මේ ව්‍යාපෘතිය පිළිබඳව මාත් ටිකක් හොයලා බැලුවහම අපේ ගරු අතුකෝරල මන්ත්‍රීතුමා පැවසුව පරිදි , පස් කපපු වලක් මේක . මේ වල තියෙන ස්ථානය තමයි දැන් මෙයාලා තෝරාගෙන තියෙන්නේ. කොහු මෝලක් හෝ පොල් මෝලක් වැනි ව්‍යාපාරයක් තිබිලා තියනවා. නමුත් මෙය දැන් අතුකෝරල මන්ත්‍රීතුමා කියනවා වගේ පස් කපලා ලොකු වලක් තියෙන්නේ. ඒ වල දැන් කැලෑ වැහිලා තියෙන්නේ. මම හොයලා බලපුවාහ ඒකයි ඇත්ත කතාව. එතකොට සමෘද්ධි බැංකුවට පිටි පස්සේ තමා මේක තියෙන්නේ. එතකොට ඒ ප්‍රදේශයේ අයත් මේකට අකමැත්තක් නැති කතාවක් තියෙන්නේ. හින්දා අර මොහාන් මන්ත්‍රීතුමා පැවසුව පරිදි , කණ්ඩායමක් විදිහට අපි ගිහිල්ලා පරීක්ෂා කරලා, බදු පදනම මත ඒක දෙන්න සුදුසුද කියලා බලමු. මෙයාගේ ඉන්නවා කුලියාපිටියේ ඥාති වෙන කෙනෙක් එයා දැනට ලොකු ව්‍යාපාරිකයෙක්. එයා භාණ්ඩ රට යවන වැඩ කරන්නේ. එයා දැන් විදේශ විනිමය ලංකාවට ගේනවා. ඒ වගේම බවර් සමාගම එක්කත් එයාගේ සම්බන්ධයක් තියනවා. ඒ අනුව තමයි මෙයා මේ ව්‍යාපාරය පටන් ගන්න උත්සාහ කරේ. එයාගේ බලාපොරොත්තුව තියෙන්නේ රැකියා 50ක්වත් උත්පාදනය කරලා මේ ව්‍යාපාරය පටන් ගන්න.ඒ හින්ද අපි කීව විදිහට ගිහිල්ලා සොයා බලලා මේක සුදුසු නම් බදු පදනම මත දෙමු කියලා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි , ඇත්ත වශයෙන්ම මේ කර්මාන්ත ඉඩම තියෙන්නේ මගේ කොට්ඨාශයේ . ගල්ගමුව කොට්ඨාශයේ වැලිකරේ කියන ග්‍රාමයට තමයි අයිති. අක්කර හතකට ආසන්න ප්‍රමාණයක් තියෙන ඉතාම වටිනා භූමියක්. එකේ රජයේ බෙහෙත් ශාලාව, සමිති සමාගම්, සමූපකාර ගොඩනැගිල්ලක් තියනවා. සමෘද්ධි බැංකුව තියනවා. අනෙක් පසකින් වැව තියනවා. ඉතින් මේ භූමිය ඉතාම වටිනා භූමියක්. ඉතිහාසයේ මෙය තෙල් මෝලකට දීලා තියනවා. පසු ගිය කාලයේ රැකියා 50-100ක් වක්‍ර හා සෘජු රැකියා ලැබුණා. නමුත් ඒ කාලයේ පොල් අර්බුදය නිසා යම් මට්ටමකට එය කඩා වැටීමක් වෙලා තියනවා. නමුත් ඒ ආයතනයෙන් ලොකු සේවයක් උනා. ඉතින් මගේ පන්ගොල්ල කොට්ඨාශයෙන් තමා ඉල්ලලා තියෙන්නේ. ඒ ගොල්ලෝ මම නම් කවුද කියලා දන්නේ නැහැ. අතුකෝරළ මන්ත්‍රීතුමා කීවා වගේ මේ රටේ විදේශ විනිමය උපයන්න ඩොලර් ගේන්න හොඳ ව්‍යාපෘතියක් තමයි මේ කොහුබත් ආශ්‍රිත කර්මාන්තයක් කියන්නේ. ඉතිං මම දන්නැහැ මේක කොහොම කරනවාද කියලා. මේ රටේ කොරෝනා අර්බුදයක් උනා. ඒ කාලයේ මේ රට සම්පූර්ණයෙන් දිව්වේ ඇඟළුම් කර්මාන්තවලින් එන ඩොලර්වලින්. ඒ නිසා අපේ ඩොලර් මිලියන 06ක වගේ සංචිතයක් තියෙන්නේ. මූල්‍ය අතින් ලොකු තැනක අපේ රට නැහැ. අපිට සංචාරක ව්‍යාපාරය, අපනයන විදේශ ප්‍රේෂණ , ණය හා ආධාර බදු වලින් තමයි අපේ රටේ ආර්ථිකය උඩට ගන්න වෙන්නේ. ඒ මත යන්න වෙන්නේ.

එතකොට දේශීය වශයෙන් ශක්තිමත් ආර්ථිකයක් හදන්න අනිවාර්යෙන්ම අපි කර්මාන්ත නගා සිටුවන්න ඕනා. ඒකට සහයෝගය දෙන්න ඕනා. එතකොට මමත් යෝජනා කරන්නේ. අපි දන්නේ හැනැ කොතැනද කරන්නේ, මොන විදිහටද කරන්නේ කියලා. ඉස්සර වෙලාම අපි සභාපතිතුමාගේ නායකත්වයෙන් කමිටුවක් දාගමු. ඒ කමිටුවෙන් එයා මොකක්ද කරන්න යන්නේ, එයා මේකේ යන්ත්‍ර කොච්චර දානවද?, සේවකයෝ කීයක් ගන්නවාද , ඒයාගේ ඉලක්කය මොකක්ද කියලා අහමු. ඊට පස්සේ එම කටයුතු අපිට සුදුසු නම් අලි සියලු දෙනාටම එකතු වෙන්න පුළුවන් නම් එයාට අවස්ථාවක් දීමට තීරණයක් ගමු. ඉතින් අපේ සභාවේ ගෞරවයත් ආරක්ෂා වෙලා අපේ භූමියේ වටිනාකමත් ආරක්ෂා වෙලා අපේ රටට යහපතක් වෙනවානම්, අපේ ගමට යහපතක් වෙනවානම් මේ වැඩේ කරන්න ඉඩ දෙමු. මේ රටේ අනිවාර්යෙන්ම දේශීය ආර්ථිකය ශක්තිමත් වෙන්න ඕනි. ට්‍රම්ප් මහතා ඊයේ පෙරේදා ගහපු බද්ද දැකපුවහම කර්මාන්ත ගණනාවකටම හානියක් වෙනවා. ඒ අනුව ඉන්දියාවට 25%යි වියට්නාමයට 20%යි අපිට 30%ක් ගහලා තියෙන්නේ. අපිට ආයෝජනය කරන්න ගිහාම ලොකු ගැටලුවක් වෙනවා. ඉදිරියේදී විදේශ විනිමයේ අර්බුදයක් අනිවාර්යෙන්ම ඇති වෙනවා. අපිට ඒකට ශක්තිමත්ව මුහුණ දෙන්න සිදු වෙනවා. ඒ නිසා අපි ගම් මට්ටමින් ඩොලර් මිලියන 10ක් හෝ අඩුම ඩොලර් මිලියනයක් හරි ගේන්න පුළුවන් නම්, ඒක තමා මේ රටට වටින්නේ. ඉතිහාසයේ මට මතකයි, ආර්ථික අර්බුදයක් වුණ වෙලාවේ ගෑස් නවත්තලා . අපේ සංචිත ඩොලර් මිලියන 2.2 -5ක් අතර තිබුනේ. ඒ කියන්නේ ඩොලර් ලක්ෂ 25ක්. සාමාන්‍යයෙන් අපේ රට ඩොලර් ලක්ෂ 500ක වගේ තැනක ආර්ථිකයක් තිබුණා. ඒ නිසා අපි කමිටුවක් තියලා හොඳ අදහසක් දෙමුයි කියන යෝජනාව ගේනවා. ස්තූතියි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රී තුමනි, තුමියනි, මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා කීපදෙනෙක්ම අදහස් දැක්වූවා. මේක සම්පිණ්ඩනය කරලා බැලුවහම කිසිම කෙනෙක් මේ යෝජනාවට විරුද්ධ නෑ. අපිට තියෙන ප්‍රශ්නය මේක හදිසියේ කඩා වැදීම සහ මේ පිළිබඳව අපි සියලු දෙනාටම ඇත්ත අවබෝධයක් නැති එක. එතන ස්ථානීය පරීක්ෂණයක් කරලා ඊට අදාල සෙසු දේවල් ටික සොයාබලා අපි එකඟතාවයකට යමු . මේක අපිට අවශ්‍ය නම්, පරිසර හා පොදු පහසුකම් කමිටුව වෙත යොමු කරලා ඊට අවශ්‍ය අදාල තොරතුරු ටික සොයාගෙන ඉදිරියේදී එම කමිටුව හරහා තීන්දුවක් ගන්න තැනට අපි මේ යෝජනාව රදවා තබමු. ගරු උපසභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 985 - කන්දෙගෙදර උතුර ග්‍රාම නිලධාරී වසමේ කන්දෙගෙදර ගමෙහි අ.ග.පි.444 හි කැබලි අංක 648 හා 650 න් අක්කර 01 පර්චස් 28 ක පමණ ඉඩම් කොටසක්(වැලිකරේ සමෘද්ධි බැංකුව අසල) කොහුබත් ආශ්‍රිත කර්මාන්ත ශාලාවක් ඉදි කිරීම සඳහා දීර්ඝ කාලීන බදු පදනම යටතේ ලබා දෙන ලෙස පන්ගොල්ල, මහරච්චිමුල්ල යන ලිපිනයෙහි පදිංචි කේ.ඒ.ගයාන් ප්‍රසන්න කාරුණාතිලක යන අය විසින් ප්‍රාදේශීය ලේකම් වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, අදාල ඉඩම් කොටස ලබා දීම සඳහා අලව්ව ප්‍රාදේශීය සභාවේ එකඟතාවය ලබා දීම සම්බන්ධයෙන් දැනුවත් කරන ලෙස අලව්ව ප්‍රාදේශීය ලේකම් පී.ඩී.එස්.කේ ගුණපාල මෙනවිය විසින් 2025.06.14 වන දින අංක DIVAL/LND/LTLEA/8/1/22 යටතේ ලිපියකින් දන්වා ඇති අතර ඒ අනුව, මේ සම්බන්ධයෙන් පරිසර හා පොදු පහසුකම් කමිටුව හරහා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර තීරණයකට එළඹීම සුදුසු බවට පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**05.02 ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන අංක 07/03/05/02 දරණ යෝජනාව**

වත්කම් බදුදීමේ දී පලාත් පාලන කොමසාරිස්ගේ (වයඹ) අංක 2019/1 චක්‍රලේඛයට අනුව බදු ලබාදෙන වත්කම් ලේඛනය භාෂා ත්‍රිත්වයෙන් ම ප්‍රසිද්ධ කළ යුතු බැවින්, 2026 වර්ෂයට අදාල ප්‍රසම්පාදන දැන්වීම මේ සමඟ ඉදිරිපත් කරන අතර, එම දැන්වීම සිංහල භාෂාවෙන් දිණමිණ පුවත්පතේ ද, දමිල භාෂාවෙන් තිනකරන් පුවත් පතේද, ඉංග්‍රීසි භාෂාවෙන් ඩේලි නිව්ස්පුවත් පතේ ද, 2025.08.15 වන දින පල කිරීම සහ 2025.08.18 වන දින සිට පළමු වර ටෙන්ඩර් පෝරමය නිකුත් කර ඊට අදාළ ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය ඉදිරියට කරගෙන යාමට සුදුසු බවට යෝජනා කරමි.

## ප්‍රසම්පාදන දැන්වීමයි

**<u>2026 වර්ෂය සඳහා වත්කම් බදු දීම - අලව්ව ප්‍රාදේශීය සභාව</u>**

2026 වර්ෂයට අලව්ව ප්‍රාදේශීය සභාවේ වත්කම් බදු දීම සඳහා 2025.08.18 දින සිට 2025.09.19 දින පෙ.ව 10.00 දක්වා මා විසින් ලංසු බාර ගනු ලබන අතර, එදිනම පෙ.ව 10.15 ට ලංසු විවෘත කරනු ලැබේ.ලංසු ඉල්ලුම්පත් 2025.08.18 සිට 2025.09.18 දින දක්වා අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයෙන් සතියේ වැඩ කරන දිනවලදී පෙ.ව 8.30 සිට ප.ව 3.00 දක්වා ලබා ගත හැක. විස්තර අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයෙන් හෝ 037-2278175 ,037-2278747 දුරකථන අංකවලින් දැනගත හැකිය.

| | අලව්ව ප්‍රධාන කාර්යාලය | | | |
|---|---|---|---|---|
| අ.අං | වත්කම | 2026 අවම වර්ෂයේ ලංසුව රු. | ටෙන්ඩර් පෝරම ගාස්ත (ආපසු නොගෙවන)රු. | ලංසු ඇප තැම්පත් මුදල (ආපසු ගෙවන) රු. |
| 01 | අලව්ව සතිපොල ආපනශාලාව | 152460.00 | 500.00 | 12196.80 |
| 02 | අලව්ව සතිපොල පොදු වැසිකිලිය | 28600.00 | 500.00 | 2860.00 |
| 03 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 01 | 90750.00 | 500.00 | 9075.00 |
| 04 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 02 | 82500.00 | 500.00 | 8250.00 |
| 05 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 03 | 82500.00 | 500.00 | 8250.00 |
| 06 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 04 | 82500.00 | 500.00 | 8250.00 |
| 07 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 05 | 90750.00 | 500.00 | 9075.00 |
| 08 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 06 | 90750.00 | 500.00 | 9075.00 |
| 09 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 07 | 82500.00 | 500.00 | 8250.00 |
| 10 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 08 | 82500.00 | 500.00 | 8250.00 |
| 11 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 09 | 82500.00 | 500.00 | 8250.00 |
| 12 | අලව්ව සතිපොල මස්/මාළු කඩ 10 | 82500.00 | 500.00 | 8250.00 |
| 13 | අලව්ව පොදු වෙළඳපොල එළු මස් කඩය | 228000.00 | 500.00 | 18240.00 |
| 14 | අලව්ව පොදු වෙළඳපොල කුකුල් මස් කඩය (එකවර වසර 3ක් සඳහා වසරකට 10% බැගින් වැඩිවීමේ පදනම මත ටෙන්ඩර් කිරීම 2026-2028 ) | 95986.40 | 1500.00 | 27336.92 |
| 15 | අලව්ව පොදු වෙළඳපොල ඌරු මස් කඩය(එකවර වසර 3ක් සඳහා වසරකට 10% බැගින් වැඩිවීමේ පදනම මත ටෙන්ඩර් කිරීම 2026-2028) | 225310.35 | 1500.00 | 59661.63 |
| 16 | අලව්ව පොදු වෙළඳපොල එළහරක් මස් කඩය මස් කඩය | 1331000.00 | 1000.00 | 66550.00 |
| 17 | අලව්ව බස් නැවතුම්පල පොදු වැසිකිලිය | 108900.00 | 500.00 | 8712.00 |
| 18 | අලව්ව දුම්රියපොල පොදු වැසිකිලිය | 65340.00 | 500.00 | 6534.00 |
| 19 | අලව්ව නගරයේ මාළු කඩ අංක 01 | 145200.00 | 500.00 | 11616.00 |
| 20 | අලව්ව නගරයේ මාළු කඩ අංක 02 | 145200.00 | 500.00 | 11616.00 |
| 21 | අලව්ව නගරයේ මාළු කඩ අංක 03 | 121000.00 | 500.00 | 9680.00 |
| 22 | අලව්ව නගරයේ මාළු කඩ අංක 04 | 121000.00 | 500.00 | 9680.00 |
| 23 | ගල්වාරම සැනසුම පියස සහා ඉඩමේ පොල් එළදාව | 2904.00 | 500.00 | 290.40 |
| | කැප්පිටිවලාන උපකාර්යාලය | | | |
| 01 | බෝයවලාන සතිපොල භූමියේ මාළු ලැල්ල | 34303.50 | 500.00 | 3430.35 |
| 02 | මොරටු කන්ද සුසාන භූමියේ පොල් එළදාව | 26741.00 | 500.00 | 2674.10 |
| 03 | ඉඹුල්ගොඩ ගල්කඩුල්ල හේන කැබලි අංක 01 | 2420.00 | 500.00 | 242.00 |
| 04 | බෝයවලාන නගරයේ කුකුල් මස් කඩය | 26620.00 | 500.00 | 2662.00 |
| 05 | බෝයවලාන නගරයේ ඌරු මස් කඩය | 11275.00 | 500.00 | 1127.50 |
| 06 | මිල්ලගහවත්ත ඉඩමේ සභාව සතු කොටස බදු දීම | 1210.00 | 500.00 | 121.00 |
| 07 | කැප්පිටිවලාන සුසාන භූමියේ පොල් එළදාව | 3300.00 | 500.00 | 330.00 |
| | මහරච්චිමුල්ල උපකාර්යාලය | | | |
| 01 | තිත්තරපොල කොහොල්ලැපිටිය සභාව සතු ඉඩම | 6655.00 | 500.00 | 665.50 |
| 02 | මහරච්චිමුල්ල විල්ගමුව එස්ටේට් වෙන්දෙසි ඉඩමේ සභාව සතු කොටස | 2420.00 | 500.00 | 242.00 |
| .03 | මහරච්චිමුල්ල උප කාර්යාල භූමියේ පොල් එළදාව | 1210.00 | 500.00 | 121.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න.

ඒ අනුව, වත්කම් බදුදීමේ දී පලාත් පාලන කොමසාරිස්ගේ (වයඹ) අංක 2019/1 චක්‍රලේඛයට අනුව බදු ලබාදෙන වත්කම් ලේඛනය භාෂා ත්‍රිත්වයෙන් ම ප්‍රසිද්ධ කළ යුතු බැවින්, 2026 වර්ෂයට අදාල ප්‍රසම්පාදන දැන්වීම මේ සමඟ ඉදිරිපත් කරන අතර, එම දැන්වීම සිංහල භාෂාවෙන් දිණමිණ පුවත්පතේ ද, දමිල භාෂාවෙන් තිනකරන් පුවත් පතේද, ඉංග්‍රීසි භාෂාවෙන් ඩේලි නිව්ස්පුවත් පතේ ද, 2025.08.15 වන දින පල කිරීම සහ 2025.08.18 වන දින සිට පළමු වර ටෙන්ඩර් පෝරමය නිකුත් කර ඊට අදාළ ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය ඉදිරියට කරගෙන යාමට සුදුසු බවට පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සහා සම්මත විය.

<u>**05.03 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව - අංක 07/03/05/03 දරණ යෝජනාව**</u>
කාරක සභා සඳහා නම ඇතුළත් කර ගැනීම සඳහා යෝජනා කරමි. පහත සඳහන් කාරක සභා වන,
01.නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව
02. ටෙන්ඩර් මණ්ඩලය
සඳහා මගේ කැමැත්ත පලකර සිටින අතර ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔබතුමාට ගෞරවයෙන් ස්තූතිවන්ත වෙනවා. මගේ යෝජනාව පැත්තකට නොදා පසුවට භාර ගැනීම සම්බන්ධව ඔබතුමාට මා ගෞරව කරනවා. සභාවේ කාරක සභාවලට කැමති අයට නම් දෙන්න කීවහම සභාපති තුමා කීවා මේක යෝජනාවක් හැටියට ලිඛිතව සභාවට දාමු කියලා. ගරු සභාව මේ යෝජනාව ප්‍රතික්ෂේප කරත් කමක් නැහැ කියලා මගේ යෝජනාව ඉදිරිපත් කරා. ගරු සභාපතිතුමනි, මේ කාරක සභාවලට ටෙන්ඩර් මණ්ඩලය වගේ ඒවට අත්දැකීම් තියන අය ඇතුළත් වෙනවා නම් හොඳයි කියලා හිතනවා. නැවතත් මේ කාරක සභා දෙකට ඇතුළත් කිරීම පිළිබඳව ස්තූතිවන්ත වෙනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජේ. චමින්ද වර්ණසූරිය මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපියට අනුව, නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව සහ ප්‍රසම්පාදන කමිටුව/ටෙන්ඩර් මණ්ඩලය යන කාරක සභා දෙක සඳහා සාමාජිකයෙක් වශයෙන් පත් කිරීම සුදුසු බවට පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සහා සම්මත විය.

<u>**යථා පරිදි කල් දී නොමැති යෝජනා**</u>

<u>**05.04 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අංක 07/03/05/04 - I දරණ යෝජනාව.**</u>
2025.07.01 වන දින ලිපියෙන් 2025.07.11 වන දින පැවැත්වීමට නියමිත මහසභා රැස්වීම සඳහා පහත සඳහන් යෝජනා දෙක න්‍යාය පත්‍රයට ඇතුළත් කර දෙන ලෙස කරනු ලබන ඉල්ලීම.
මම ඉදිරිපත් කරන්නේ පළමු වෙනි යෝජනාව,

01. කිරිවානාපොල පොදු සුසාන භූමිය අලව්ව ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සුදුසු යැයි යෝජනා කිරීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ භූමිය අක්කර 3-4 ආසන්න ප්‍රමාණයක් තියනවා. ඒ භූමියේ යම් යම් ආයතනවලට කැලි වෙන් කරලා දීලා තියනවා. මුල්ම කොටස සණස බැංකුවටත් , ඊලග කොටස ජල ව්‍යාපෘතියකටත් , ඊලගට කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවටත් , ඒවගේම සුසාන භූමියටත් කැල්ලක් වෙන් කරලා දීලා තියනවා. ගරු සභාපතිතුමනි, මේ සුසාන භූමියේ වලක් කපලා තැන්පත් කරන්න කීවොත් ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ඕනි නැත්නම් තැන්පත් කරන කටයුතු කරන්න බැහැ. නිකන් භූමදානය කරනවා නම් ප්‍රශ්නයක් නැහැ. ඒවගේම ඒකේ තියෙන ගහක් වැටිලා හදිසියේ කපන්න උනොත්, ඒක වැටිච්ච ගහ කපා ගන්න අයිතිය තියෙන්නේ ප්‍රාදේශීය ලේකම් හරහා දැව සංස්ථාවට. ඒක ලොකු ගැටළුවක්. දැන් මේකේ ඔය වගේ ගහක් තිබුණා. සමිතියේ ගමේ අය ඒ ගහ කපා ගන්න හැදුවා. නමුත් ඒකට ඉඩ දුන්නේ නැහැ. දැව සංස්ථාවට යවන්න කීවා. දැනුත් සුළගට ගහක් වැටිලා තියනවා. ඒ සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරීතුමාත් එක්ක කතා කලා. මේක ප්‍රාදේශීය සභාවේ සුසාන භූමිය නෙවේ. මේක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයිති එකක් නිසා මේක දැව සංස්ථාවට යොමු කරන්න වෙන බව එතුමා ප්‍රකාශ කලා. ඉතින් ඕකත් ඔහොම්ම දිරලා යනවා. ඉතින් මම මේ යෝජනා කලේ ගරු සභාපතිතුමනි , අපේ ගල් කන්ද රජමහා විහාරයේ විහාරාධිපති වහන්සේගේ පියා වැත්තෑ කන්ද පාමුල එයාගේ මල්ලිගේ ගෙදර හිටියේ . එයා නැති උනා. එයාගේ දේහය ගෙනියන්න උනේ වැත්තෑ කන්ද මුදුනේ සුසාන භූමියටයි. නමුත් ඒකට ගෙනියන්න අපහසු නිසා, කිරුවානාපොල තමා ළගම සුසාන භූමිය. නමුත් සභාවට අයිති එකක් නෙවේ නිසා ඒකට ගෙනියන්න විදිහක් නැහැ. ඒ නිසා අපේ ස්වාමීන් වහන්සේගේ පියාගේ දේහය අලව්වට ගෙනාවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, කිරුවානාපොල සුසාන භූමිය අලව්ව ප්‍රාදේශීය සභාවට පවාරා ගැනීම සුදුසුයි කියලා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා. 2006 අපි ප්‍රාදේශීය සභාවට ගියාමත් ඕකමයි උනේ. ගරු සමන්ත යත්තල්ගොඩ මන්ත්‍රීතුමාත් , ගරු ගාමිණී ගුණදාස මහතාත් සමඟ අනුමැතිය සඳහා කටයුතු කරා. එවකට හිටපු ප්‍රාදේශීය ලේකම් ඇතුළත්මුදලි මහතා, ගාමිණී ගුණදාස මහතාගේ නිවසේදී සිදුකල සාකච්ඡාවේදී මේ ඉඩම් අයිති මට බවට ප්‍රකාශ කලා. ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට ගාමිණී ගුණදාස මැතිතුමා සුසාන භූමි ආඥා පනතින් අයිති මට ඇතුළු මහජන නියෝජිතයින්ටත් බව ප්‍රකාශ කලා. පළාත් පාලනයෙන් ඇවිල්ලා මේ රටේ ගම් සභා ක්‍රමය ඇති කලා. ගම් සභාවේ සභාපතිතුමා පත්වෙච්ච දවසේ ඉඳලා ගමට දීමනා නොගත්තු මෙම්බර් මහත්වරු පත්වෙච්ච දවසේ ඉදලා අපි මේ සම්බන්ධව තීන්දු තීරණ ගත්තේ. ඒ නිසා භූමිය ඔබේ කියන අයිතිය තියාගන්න. හැබැයි සුසාන භූමියේ ගහකටවත් අත තියන්න බෑ. ඒකේ තීන්දු තීරණ ගන්නේ අපේ සභාව කියලා එදා ප්‍රකාශ කලා. හිටපු ගරු සභාපති රත්නායක මහතාත් ඒ බලය පාවිච්චි කලා. ඔබ තුමාට මතක ඇති. හිටපු කිසිම ප්‍රාදේශීය ලේකම්වරයෙක් ඒ කාල පරාසය තුල ප්‍රාදේශීය සභාවත් එක්ක ගැටිලා ප්‍රශ්නයකට ආවේ නැහැ. දෙවක්කර සුසාන භූමියේ තිබුන විශාල කොස් ගහක් පිළිබඳව මට මතක් වෙනවා. වෙන්නොරුවේ පදිංචි වෙලා ඉන්න නාරම්මල සභාවේ හිටපු ලේකම් මහත්තයා, නායක හාමුදුරුවෝ සමග ඇවිල්ලා එවකට හිටිය සුමනසිරි සභාපතිවරයාගෙන් ඉල්ලීමක් කලා. එවෙලෙහි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීමක් කරන්න වෙයිද කියලා උන් වහන්සේ විමසුවා. මේක සභාවට අයිති පිට්ටනියක් නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අහන්න අවශ්‍ය නැති බව එවකට හිටපු ගරු සභාපතිතුමා ප්‍රකාශ කලා. උන්වහන්සේට අපි කොස් ගස් 10ක් වැට අයිනේ ඉන්දවීමේ කොන්දේසිය මත මාස 3න් පසුව කොස් ගහක් කපා ගන්න කියලා දැනුවත් කලා. දැව සංස්ථාවවත්, කවුරුවත් කියන දේ ඇහුවේ නැහැ පන්සලට දුන්නා. ගල්වාරම රජ මහා විහාරයේ නායක හාමුදුරුවන් ඇතුළු දායකයින්ගෙන් ගල්වාරමට අයිති මිනීපිට්ටනිය සම්බන්ධයෙන් ඉල්ලීම් ලිපි මේ සභාවට ඉදිරිපත් කලා. ගල්වාරමට අයිති මිරිහෙලිය මිනී පිට්ටනිය වට අඩි 20ක පමණ තේක්ක ගසක් තිබුණා. එවකට දැව සංස්ථාවේ හිටපු මහත්තයෙක් තේක්ක ගසේ වටිනාකම නිසාවෙන් තේක්ක ගස කැපුවා. ප්‍රාදේශීය ලේකම්තුමිය එම ගස කැපීම පිළිබඳව අපෙන් විමසීමක් සිදු කලේ නැහැ.ගහ කපලා දැම්මා. එම ගහ කපලා ගෙනියන්න හදන කොට හිටපු ජයසිංහ ලේකම්තුමිය දුරකථන ඇමතුමක් දීලා ඒ සම්බන්ධව මාව දැනුවත් කලා. එතුමිය මැදිහත් වෙලා සුසාන භූමි ආඥා පනත හරහා එම ගස අයිති අපිට ,ඒ අනුව ගස පැටවීම නතර කලා. ඒකයි රාජ්‍ය සේවයේ වැදගත්කම. ඒවෙලාවේ තීන්දුවක් ගත්තා මේ ගහ පන්සලට දෙමු කියලා. එදත් මොකද වුණේ , එතනදී ගහ කපන්න රු.99000.00ක්

ගිහිල්ලා තියෙන නිසා දැව සංස්ථාව මේක කල් දැම්මා. නමුත් ගහ කපපු ළමයා හුම්බුළුවේ, එයාගෙන් ඇහුවහම ගහ කපලා ඩිපෝ කරන්නත් එක්ක රු. 5000.00 යි අය කරලා තිබුණේ. ගරු සභාපතිතුමනි, කිරුවානාපොළ සුසාන භූමියට අක්කර තුනක විතර ප්‍රමාණයක් තියනවා. මේකේ වැටුණු ගසක් ලබා දෙන්න කියලා මරණාධාර සමිතියෙන් ඉල්ලීමක් කරනවා නම් එම වැටිච්ච ගස ලබා දීම සභාවේ අපේ වගකීම. හැබැයි අද වන විට මේ තත්ත්වය වෙනස්. මේවා පවරාගන්න කියලා ඉල්ලීම කරාම හිටපු හුඟක් ප්‍රාදේශීය ලේකම්වරු ප්‍රකාශ කලේ මිනුම් කටයුතු වලට මුදල් නොමැති නිසා ඔබ තුමාලගේ බලයට ඇඟිලි ගසන්නේ නැහැ කියලා. දැන් මරණාධාර සමිතිවල සල්ලි තියනවා. ඒ නිසා පෞද්ගලික මිනින්දෝරුවෙක් හෝ යොදවලා මැණුම් කටයුතු කරලා සුසාන භූමි ටික පවරා ගත යුතුයි. දඹදෙණිය ආසනයේ අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ග්‍රාම සේවා වසම් 66 තුල සුසාන භූමි විශාල ප්‍රමාණයක් තිබෙන අතර , ලිඛිත අයිතියක් නොමැති වුවත් , අපි තමයි පරිහරණය කරන්නේ. මේවන විටත් සභාවේ ඉඩමවත් නිදහස් කරලා නැහැ. ඒ නිසා කරුණාරත්න මැතිතුමා මේ ගෙනාපු යෝජනාව කිරුවානාපොල සුසාන භූමියට පමණක් නොව මේ වසම් 66හි සියලුම සුසාන භූමිවලට ඒකාබද්ධ විය යුතුයි කියලා යෝජනා කරමින්, මෙම සුසාන භූමි මැනලා නිදහස් කරගන්න බැරිනම් මේ කරපු යෝජනාව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යොමු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. මම හිතන්නේ ඒකත්ඡන්දයෙන් කවුරුත් ඒක සම්මත කරයි. අලව්ව රෝහල අයිනේ තිබෙන කඩවල බදු මුදල් අය කරන්නේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන්. නමුත් අනෙක් සියල්ල කරන්නේ සභාවෙන් නිසා හිටපු ප්‍රාදේශීය ලේකම් සුසන්ත මහතාගෙන් මේ පිළිබඳ මම විමසුවා. එතුමා සභාවේ කාර්යක් තමයි සංවර්ධන කාර්යන් සිදු කරන එකයි , පුරවරය ලස්සනට තියා ගන්න එකයි කියලා ප්‍රකාශ කලා. එලෙස වගකීම තියනවා නම් එම බදු අය කරන ඉඩම්වල අයිතිය යන්නත් ඕනා සභාවට. ඒ නිසා ගරු සභාපතිතුමනි , අපේ ගරු කරුණාරත්න මැතිතුමා ගෙන ආ යෝජනාවට ග්‍රාම නිලධාරී වසම් 66 හි සභාවට පවරා නැති සියලු ඉඩම් සම්බන්ධව නිවැරදි තීරණයක් අරගෙන කඩිනමින් පවරා දෙන්න කියන ඉල්ලීම කරන්න කියලා මම මේ ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේ සුසාන භූමි වැඩසටහනට මමත් අදහස් කිහිපයක් දක්වන්න ඕනි. අපේ කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවට මම හිතන්නේ ඒ සුසාන භූමිය විතරක් නෙවේ වසම් 66 ම මේ කටයුත්ත කරන්න ඕන. හැබැයි අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මෙතෙක් ප්‍රාදේශීය සභාව සතුව ඉඩම්වලින් 1/3 වත් අපේ නමට ලියවිලා නැහැ. ඒකට හේතුව විශේෂයෙන්ම අපේ මොහාන් මන්ත්‍රීතුමා දන්නවා ඇත්තටම මේ ඉන්න භූමියේ පවරාදීම් සිදු කරලා නැහැ. ඉතින් මම හිතන්නේ මගේ නෝනා රාජකාරි කරන කාලය තුළ අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සතු ඉඩම් බලහත්කාරයෙන් මිනිස්සු අල්ලගෙන හිටපු ඒවත් අපි ලබා ගත්තා. විශේෂ කැපවීමක් කරා එතුමිය මොහාන් මන්ත්‍රීතුමා දන්නවා. විශේෂයෙන්ම උදාහරණයක් ගත්තහම මේ නිසා තොග ගබඩාව අවුරුදු ගණනනාවකින් සත පහක්වත් අරන් තිබුනේ නැහැ. මං හිතන්නේ එතුමිය ඇරෙන්න PL පරීක්ෂා කරන්න කවුරුත් දැනන් හිටියේ නැහැ. එතුමිය හැමදාම කරේ රජය සතු ඉඩම් කවුද අල්ලන් තියෙන්නේ, මොකද කරේ කියන එක තමයි, එතුමියගේ රාජකාරිය වුනේ. ඒ නිසා මම මේ අවස්ථාවේ සිහිපත් කරනවා කෝටි 2යි ගාණකට බදු ආදායමක් දීලා තමයි මේ සමූපකාර අලුත් ගොඩනැගිල්ල ආපහු ඒ ගොල්ලන්ටම දීලා තියෙන්නේ. උදාහරණයක් ගත්තහම මෙතන ලොරිබොඩි ගහපු සමූපකාර ගොඩනැගිල්ලත් ගරු මොහාන් මන්ත්‍රීතුමා ඒකත් රජයේ ඉඩමක්. එතකොට සමූපකාරය තමයි වෙන තුන්වන පාර්ශවයකට මම හිතන්නේ සුළු මුදලකට රු.30000/- කට විතර බදු දෙනවා.රජයේ බදු ආදායම ලැබුන් නෑ. හැබැයි ඒකත් හොයාගෙන ආපහු ඒකටත් බද්දක් ගැහුවා. රජයට බද්දක් ගහලා තමයි ඒගොල්ලො කටයුතු කරලා ඒක ගත්තේ. විශේෂයෙන් ගත්තහම තැපැල් කාර්යාලයේ සේවා පියස, අද හදලා තියන තැන. එක අල්ලාගෙන තිබ්බේ තැපල් කාර්යාලයෙන්. ඒකටත් මිනුම් කටයුතු කරලා ඒකේ කටයුතු වලදී වෙනම කොටසක් කරලා දාලා තියෙනවා.ඒවගේම ඩිපෝව. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සතු ඉඩම ඩිපෝ එකෙන් කොටු කරගෙන ඒක අරන් තියනවා. ඒ නිසා මේ වගේ අනන්ත අප්‍රමාණ බදු ගන්න පුළුවන් , රජයේඉඩම් සභාව සතු ඉඩම් මේ බල ප්‍රදේශයේ තියනවා. ඒ නිසා අපේ වගකීම තියෙන්නේ ඒ කටයුත්ත මේ සභාව නතු කරගන්න. ඒ නිසා පසුගිය සභා වාරයේ මන් හිතන්නේ අපේ ලේකම් මහත්මිය මූලික කරගෙන මේකේ මිනුම් කටයුතු කරලා ඉවරයි. එවගේම අපේ ක්‍රීඩාංගනය අපේ නමට තිබ්බට ඒකේ කිසිම අයිතියක් අපිට නැහැ. ඒකත් මිනුම් කටයුතු කරන්න ඕනි. ඒ වගේ අනන්ත අප්‍රමාණ දේවල් කරන්න තියනවා. ඒ නිසා ඔබ තුමා වහාම 26 දෙනාගේම අනුමැතිය අරගෙන කරුණාකරලා

අපිට හැකි ඉක්මනින් මේ සුසාන භූමි ටික පවරා දෙන ලෙස ප්‍රාදේශීය ලේකම්තුමියට බල කරලා ලිපියක් යවන්න. මන් හිතන්නේ අපේ සුසාන භූමි 20 ගාණක් පමණ පවරාගෙන තියනවා. තව කොටසක් කරන්න ඉතුරු වෙලා තියනවා. අවාසනාවකට එතුමියට විශ්‍රාම යන්න උනා. එතුමිය රාජකාරී කරන කාලසීමාවේ ගැටලු ගණනාවක් තිබුණා. උදාහරණයක් ගත්තහම, අග්බෝව පොල් සංවර්ධන ඉඩම, අග්බොවේ ගොවි සමිතියට තමයි බදු දීලා තිබුණේ. හැබැයි බද්ද මේ ගොල්ලෝ ගෙව්වේ නැහැ. ලක්ෂ දෙක හමාරක් හිඟ බදු තිබුණා. එතකොට බදු නිලධාරියා විදිහට කළ යුතුව තිබුණේ බදු අය කර ගැනීම. හැබැයි මන් කවුද කියලා පුද්ගලයා කියන් නෑ. සේරම දන්න හොඳට හඳුනන කෙනෙක්. ඊට එහා පැත්තේ ඉඩමක් තියනවා ඊට එහා පැත්තේ ඉඩමක් තියෙන කෙනාට ළිදක් නෑ.පොල් සංවර්ධන අධිකාරියේ ඉඩමේ හිඳෙන් නැති ළිඳක් තියෙනව. මේ ගොල්ලො තුන්වෙනි පාර්ශවයක් විදිහට බදු දෙනවා.ඒ පුද්ගලයට ලක්ෂ 2යි ගාන අය කරගෙන මේ ළිඳයි පොල් ටිකයි කඩාගෙන මේ වැඩ ටික කරන්න. හැබැයි ප්‍රාදේශීය ලේකම්තුමිය ආපු ගමන්ම ඒක නීති විරෝධී කටයුත්තක් ලෙසට තහනම් කරා. ඒක කවුරුත් ගෙදර ගෙනිච්චෙ නැහැනේ. රජයේ බදු ආදායම අරගෙන ලබා දුන්නා මං මේ කියන්නේ පොඩ්ඩක් විතරයි. ඒ නිසා අපිට සභාව මැදිහත් වෙලා කරන්න පුළුවන් වැඩ ගොඩාක් තියනවා. ඒ නිසා එවැනි කටයුතු වලදී මේ අපේ 13 දෙනාත් ඔබ තුමන්ලාගේ 13 දෙනාත් ඍජුව හිට ගත යුතුයි. සම්බන්ධීකරණයේ දී ඍජුව කතා කල යුතුයි. බය නැතුව අපේ මොහාන් මන්ත්‍රීතුමා කීවා වගේ මේ හැමදෙනාම ඇවිල්ලා තියෙන්නේ අපේ ප්‍රදේශයේ තියන අපේ මිනිස්සු වෙනුවෙන් කරන්න තියෙන යුතුකම් ටික කරන්න. ඒ නිසා කරුණාකරලා ඔබතුමා ලිපියකින් දැනුවත් කරන්න මේ ටික පවරලා දෙන්න කියලා එහෙම නැත්තම් සම්බන්ධීකරණය වෙලා අපි 26 දෙනාම කතා කරමුයි කියලා මා යෝජනා කරනවා. බෙහෙවින් ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි, සුසාන භූමි ගැටලුව සම්බන්ධව අදහසක් දක්වන්න ඕනි කියලා හිතුනා. අපේ ලේකම්තුමිය දන්නවා ඇති වඩුවාව කොට්ඨාසයේ තියන ග්‍රාම සේවා වසම් 5ම තියන හැම සුසාන භූමිවල ගැටලු .ඒ සුසාන භූමි ගොඩක් දේවල් සමහර ඒවාවල ගස් පෙරලිලා,කපාගන්න විදියක් නැහැ. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටත් ලියුම් දුන්නා.ඒ ගොල්ලෝ දෙන්නේ නැහැ.ඒවගේ ගොඩක් ප්‍රශ්න තියනවා.ඉතින් ඒවා අනිවාර්යයෙන්ම ජනතාවට ලොකු පීඩනයක් ගෙන දෙන ප්‍රශ්නයක්.ඒ ප්‍රශ්න වලට මහජන නියෝජිතයින් හැටියට අපි ඒවාට අනිවාර්යෙන් පිළිතුරු සැපයිය යුතුමයි. එහෙම නැත්තම් අපිට තව දුරටත් ඒ බිම්වල දේශපාලනය කරන්න බැහැ.ඔවුන්ගේ පොදු අවශ්‍යතා සියලු දෙනාගේම පොදු අවශ්‍යතාවය. මනුස්සයෙක් මිය ගියපුවහම භූමදානය කරනවා.දැන් මේ වෙනකොට පොල්ගහවෙලට හරි නාරම්මලට හරි කියන තැනට හරි ගිනිච්චොත් ලොකු මුදලක් අය කරන්න ඕනි. ගමන්ගාස්තු ඒ ඔක්කෝම. නමුත් මිනිස්සුන්ට තියෙන පොදු තැන මිනියක් භූමදානය කරන්න ගිහාම ලොකු අපහසුතාවයකට පත් වීම ලොකු ප්‍රශ්නයක්. ඉතින් මේක අනිවාර්යෙන්ම මූලික වෙලා විසඳිය යුතුයි. එවාගේම තමා වඩුවාවේ සායන මධ්‍යස්ථානයක් තියනවා. සායන මධ්‍යස්ථානවල ප්‍රශ්නය ගොඩාක් දුරට කතා කරාම, ප්‍රාදේශීය ලේකම් යටතේ තියෙන්නේ. මන් හිතන්නේ, සායන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමේ බලතල තියෙන්නේ ප්‍රාදේශීය සභාවටයි. නමුත් ඒ ඉඩම ප්‍රාදේශීය ලේකම් යටතේය. ඊට පස්සේ අපි ප්‍රාදේශීය ලේකම් තුමියට ලිපියක් ඉදිරිපත් කළා. මේ ඉඩම මධ්‍යම සෞඛ්‍ය අමාත්‍යංශයට පවරා දෙන්න කියලා. හැබැයි ලේකම්තුමිය මේ ඉඩම රජයට අයිති නෑ LRC ඉඩමක් කියලා කියනවා. හැබැයි ඒක අවුරුදු ගාණක් තිස්සේ එතෙන ඉන්න වෛද්‍යවරයා රජයේ ඉඩමක් නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට එළඳා බදු ගෙවනවා. හැබැයි ඒක පවරලා දෙන්න ගිහාම නැවත කියනවා LRC ඉඩමක් කියලා. ඒ වගේ රජයේ ඉඩම් සම්බනධ ලොකු ප්‍රශ්න ගැටලු ගම් ප්‍රදේශවල තියනවා. මන් හිතනවා, අපි ජනතාව වෙනුවෙන් මෙතෙනට ඇවිල්ලා තියෙන්න නිසා මන්ත්‍රීකණ්ඩායම විදිහට එකට හිටගෙන මේ සම්බන්ධව පෙනී සිටිය යුතුයි. ඒ ඔවුන්ගේ අවශ්‍යතාවය ඉෂ්ට සිද්ද කරලා දෙමුයි කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, කරුණාරත්න මන්ත්‍රීතුමාගේ යේජනාව වටිනා යෝජනාවක් .ඒක අත්පත් කරගත්තහම සභාවට වටිනවා. හැබැයි මම ඒක නෙවෙයි කියන්නේ.මම ඊට එහා ගිය දෙයක් කියන්නේ. අපි අලුතෙන් අත්පත් කරගන්න ඒවා වගේම දැන් තියෙන සුසාන භූමි වැටවල් එහෙ මෙහෙ දුවනවා. ඒ හින්දා ඒක රැක ගන්න දැන් මේ තියන ටිකට අනිවාර්යයෙන් වැටක් දාලා ලකුණු දාලා තියන්න ඕනි, නැත්තම් සුසාන භූමි නෙමේ නම් මෙලහකටත් අල්ලලා. ඒකනිසා අල්ලන ප්‍රමාණය අඩුයි. මං කියන්නේ තියන ටිකත් රැකගන්න ඕනි. අපි දන්නවා අවුරුද්දකින්

විතර පස්සේ සමහර ක්‍රීඩා පිටි තියෙන්නේ වැට නියමිත තැන නෙමේ. ඒ නිසා කරුණාරත්න මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතා වටිනවා. ඒ වගේම තියන ටික සභාපතිතුමනි වැටක් ගහලා කොහොම හරි මායිම් කරන්න ඕනි නැත්තම් ඇත්තටම අල්ල ගන්නවා. අපේ මිනිස්සුන්ගෙ හැටි ඔහොම තමා. පාරක් තිබ්බොත් නියරට කපනවා වගේ. අල්ල ගන්නවා වැඩකුත් නැහැ. ඒක නිසා මේ වෙලාවේ අර තියන සුසාම් භූමි වල අනිවාර්යයෙන් වැටවල් ගහල හරි මායිම් දාලා ආයේ අල්ලන්න බැරි වෙන්න තියන ටිකවත් රැකගන්න බලමුයි කියලා මං විශේෂ යෝජනාවක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි,කරුණාරත්න මැතිතුමා ගෙනාපු යෝජනාව ඉතා වටිනා අදහසක්. අපේ කොට්ඨාසයේ සුසාන භූමි කීපයකට මැදිහත් වෙලා ඉන්නවා මේ සියලු සුසාන භූමි රජයේ කැලෑවලට තමයි අහුවෙලා තියෙන්නෙ. ඒ නිසා එතන ගැටලු සහගත තැන් තියෙනවා. යත්තල්ගොඩ සුසාන භූමියේ යම් කිසි ආදාහන කටයුත්තක් කරපු වෙලාවට මේක අයිති කැලේට කියලා කැලෑ දෙපාර්තමේන්තුවෙන් කියනවා. ඉතින් ඒවායේ මායිම් නැහැ. ඒවගේම මෑතකදී අවුරුදු තුන හතරකට කලින් පොල්කටු කන්ද කැලෑව මැනලා මැනුම් කටයුතු සිද්ධ කළා. ඒ වෙලාවේ ලොකු තේක්ක ගස් 3,4ක් සුසාන භූමියට ආවා. ඒවායෙහි අයිතිය කැලෑ දෙපාර්තමේන්තුවට තියෙනවා කියලා කියනවා, හැබැයි අපිට ඇවිල්ලා තියෙන්නේ. රත්තරන්හේන සුසාන භූමිය ඒකත් ඒ වගේ සම්පූර්ණ කැලේට මැදි වෙලා තියෙන්නේ. සමහර වෙලාවට ගස් අතුරුදහන් වෙනවා. මේවා අපේ සභාවේ තියෙන වත්කම්. ඉදිරි කාලයේ මන් හිතන්නේ මේ ගස් ප්‍රයෝජනවත් වෙයි කියලා. ඒවා නිසා ඒවායේ ප්‍රයෝජන ගන්නත් ඉදිරි කාලයේ සුසාන භූමිවල පැවැත්ම සඳහා අරුණ මන්ත්‍රී තුමා කීවා වගේ අනිවාර්යෙන් මායිම් ගල් දාලා සලකුණු කරලා තිබ්බොත් අපිට ඒවා ඉදිරියට ප්‍රයෝජනවත් වෙයි. ඒ නිසා වැටවල් දානවා කියන එක ලේසි වෙන් නෑ. ඒ නිසා අඩුම ගාණේ මායිම් ගල් ටිකක් දාලා සකස් කරලා ඒ ප්‍රමාණය වෙන් කර ගත්තොත් හොඳයි කියලා මමත් හිතනවා. ඒ වගේම අපේ කරුණාරත්න මැතිතුමාගේ යෝජනාවට මගේ සහයෝගය ලබා දෙනවා.

**ගරු උප සභාපතිනි එම්.සී.එම්. නන්දසේන මැතිනිය**

ගරු සභාපතිතුමනි, මන් හිතන්නේ අපේ මන්ත්‍රීතුමන්ලා සියලු දෙනා සුසාන භූමි ගැටළුව පිළිබඳ දන්නවා. අපි ගිය සතියේ මඩවල සුසාන භූමියේ ප්‍රබල ගැටලුවක් තියනවා. ගරු සභාපතිතුමා මම සමඟ ගිහිල්ලා මේ ස්ථානයේ පරීක්ෂණයකුත් කරා. ඉදිරියේදී කාර්මික නිලධාරී මහත්වරු යවලා ඔය කියන ගැටලු ටික නිරාකරණය කරන්න එතුමන් වැඩ සැලසුමක් සකස් කර ගෙන යනවා. ඉතින් මන් හිතන්නේ, පසුගිය කාලවකවානුව තුළ තිබුණු ගැටලු මේවා. ඒවාට විසඳුම් ලැබිලා නැහැ. අපි නොදැනුවත්වම මඩවල ගත්තහම මිනිස්සු බදු යටතේ තවත් ප්‍රකාශයක් කරනවා, මම බදු ගත්තා කියලා තවත් පුද්ගලයෙක් ප්‍රකාශ කරනවා. ඒ වගේ ගැටලු ගණනාවක් ගම්වල සුසාන භූමි සම්බන්ධයෙන් තියෙනවා. මන් හිතන්නේ ඉතාමත්ම අගය කරන්න ඕනි ඔබ සියලු දෙනාගේම මේ ඉදිරිපත් කිරීම. ඒ නිසා අපි හැමොම එකතු වෙලා අර පසුගිය කාලයේ තිබුණු ගැටලු දිගින් දිගටම ආව නිසා තමයි අලුත් ප්‍රාදේශීය සභාව තුළ විසඳුම් අපිට සොයන්න සිදු වෙන්නේ. ඒ නිසා මමත් මේකට යෝජනාවක් එකතු කරමින් අපේ ගරු සභාපති තුමා ඒ වෙනුවෙන් වැඩසටහන් දියත් කරනවා, ඒ සඳහා අපේ සියලු දෙනාගේම සහයෝගය ලබා දෙමුයි කියලා ඉල්ලා සිටිනවා. සියලු දෙනාටම ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, සුසාන භූමි පිළිබඳ කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව හොඳ යෝජනාවක්. මෙතනදී අපේ ගරු මොහාන් මන්ත්‍රීතුමා සහ අතුකෝරල මන්ත්‍රීතමා සඳහන් කළා වගේ මේ සුසාන භූමිවල ගැටලු ආවේ එදා ඉඳලා තමයි. අපි හුඟක් එදත් කතා කළා ඒ වගේම රජයේ ඉඩම් සම්බන්ධයෙන් අපි කතා කරොත් එහෙම බෝයවලාන පොලීසිය ඉදි කරලා තියන ස්ථානය මේකේ අයිතිය තියෙන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයටයි. එතකොට මේකේ ගරු හිටපු සභාපතිතුමා රත්නායක මැතිතුමා කෘෂිකාර්මික කටයුතු සඳහා ගොඩනැගිල්ලක් ඉදි කළා. එතකොට ඒක සභා අරමුදලින් තමා කළේ. එතකොට ප්‍රාදේශීය සභාවේ කිසිම කෙනෙක් මේ ඉඩම් කැල්ල පොලීසිය දෙනකොට දන්නෙත් නැහැ. ඒවගේම සියලුම පොදු සංවර්ධන කටයුතු සඳහා නැබඩවතුර ගමේ අය මේ පොදු ගොඩනැගිල්ල ගත්තා. එතකොට එහා පැත්තේ පර්චස් ගාණක් ගමේ අයට සභාව වෙන් කෙරුවා. හැබැයි අද ඒ ගොඩනැගිල්ල ඉදි කර ගන්න විදිහක් නැහැ. ඒ පොදු තැන නැහැ , ඒ නිසා ප්‍රදේශයේ මිගාර් මන්ත්‍රීතුමා මේ ගැන හොයලා බලනවා

නම් හොඳයි. එම හදා ගත්තු පොදු තැන අපි කාටවත් දැනුම් නොදී ඒ ස්ථානය පොලීසියේ රාජකාරී කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම්තුමිය දීලා තියනවා. ඒක මන් හිතන්නේ, පොලීසිය ඉදි කිරීම පිළිබඳව ගැටලුවක් නැහැ. නමුත් රටේ ගමේ පොදු තැන ගමේ මිනිස්සුන්ට තිබුණ තැන නැති කරලා. ඒ කරපු එක වැරදි ක්‍රියාවක්. අපේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු හෝ ප්‍රාදේශීය සභාවේ කිසිම කෙනෙක් දන්නේ නෑ. අපේ මන්ත්‍රීවරුන්ට මතක ඇති වැඩේ ඉවර කරලාඅපෙන් අවසර ගන්න ආවා. ඉතින් ඒ වගේ ප්‍රශ්න තියනවා. අපි කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවෙන් ප්‍රයෝජන ගමු. අපේ හැම කොට්ඨාශයකම අපේ මන්ත්‍රීවරු ඉන්නවා. ඒ නිසා ඒ කොට්ඨාශවල තියෙන සුසාන භූමිවල මායිම් ලකුණු කරන්න සියළු දෙනාම ඉල්ලීම් ලිපියක් ලබා දීලා ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න කියලා විශේෂයෙන්ම මා ඉල්ලා සිටිනවා. ඒ වගේම අපේ මඩවල සුසාන භූමිය ගැන සඳහන් කලා. මම හිතන්නේ ප්‍රදේශයට තියෙන අක්කර දෙකක ප්‍රමාණයෙන් යුත් විශාල සුසාන භූමියක්. ඒ සුසාන භූමිය බදු දීම පිළිබඳව ගැටළුවක් නෑ. බදු දීමෙන් යම් කිසි ආරක්ෂාවකුත් ලැබෙනවා. ඒකේ වැට මායිම් ටික දාලා බදු ගන්න කෙනාට ශුද්ධ පවිත්‍ර කරලා ඒකේ ඵලදාව ගන්නකොට පවත්වාගෙන යන්න කියලා කියන්න. මේකේ හොඳ ඉඩ පරාසයක් තියෙන නිසා මඩවල ආදාහනාගාරයක් සෑදීම සම්බන්ධයෙන් පසුවට යෝජනා කරනවා. ඒ නිසා මේ සියලු කටයුතු සොයා බලා සුසාන භූමිවල මායිම් ලකුණු කරලා අපේ ජනතාව වෙනුවෙන් තියෙන දේවල් ආරක්ෂා කර ගන්න කටයුතු කරමුයි කියලා විශේෂයෙන්ම ඉල්ලීම් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව හොඳයි. සුසාන භූමි ගැටළු හැම කෙනාටම තියනවා. අද වෙනකොට මේක හරියට කරගෙන යන්න අපි සියළු දෙනාගේම උදව්ව අපි සියළු දෙනාටම තියනවා. අපි ඒ නිසා නවතල්වත්ත සුසාන භූමිය වටේට ගෙවල් ටිකක් තියනවා. ඒකෙත් මායිම් ගල් දාන කතාව කිව්වා නම් හොඳයි. ඒ මැදින් පාරකුත් යනවා. ඒ පාර ලියාපදිංචි වෙලා , විදුලිය ගිහිල්ලා තියනවා. ඒ කාලේ හිටපු අය අවසර දීලා තියනවා. අපිට ඒවාට හරස් වෙන්නත් බෑ. නමුත් ඒ තියෙන ටික හරි රැක ගන්න ඕනෑ කියන එකයි මගේ මතය. අනිත් එක තමයි තවතල්වත්තට ඇතුළු වෙන කන්ද උඩින් තමයි ගම ආරම්භ වෙන්නේ. එතැන් සිට නවත්ලවත්ත රෝහල දක්වා පොදු කොටසක් තියනවා. ඒක LRC කියලා කියනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය කියලා කියනවා. මෙහා පැත්තේ පොඩි කැලයක් තියනවා. නවතල්වත්ත ඉතිරිවෙලා තියෙන ප්‍රමාණය ඉක්මනට පවරා ගන්න. මේ වෙනකොට අල්ලපු ඉඩමේ ඉදි කිරීමක් කරලා තියනවා. ඒකත් අපිට අහිමි වෙන්න යනවා. ඒ නිසා අපි නීත්‍යානුකූලව අපි සියළු දෙනා මැදිහත් වෙලා ඒවා වෙන්කර ගත්තහම අනාගතයේ ඉන්න අයට අපි ඉතුරු කරලා තියලා යන එක ලොකු දෙයක් කියලා මම අදහස් කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාවට අදාලව අපේ මන්ත්‍රීතුමන්ලා උප සභාපතිතුමිය ඇතුළු ගොඩක් පිරිසක් අදහස් දැක්වුවා. ඇත්තටම ප්‍රාදේශීය සභාව විදිහට සුසාන භූමි පවරා ගැනීම සඳහා මේ වන විට අපි ක්‍රියාත්මක වෙලා තියනවා. ඒ කියන්නේ ප්‍රාදේශීය ලේකම්තුමියට කරුණු ඉදිරිපත් කරලා පවරා දෙන්න කියලා ඉල්ලීම් ලිපිය යොමු කරලා තියනවා. පොඩි ප්‍රමාණයක්නේ පවරා තියෙන්නේ. ඒ නිසා කිරුවානාපොල විතරක් නෙවේ සියළුම පවරා නොමැති ඉඩම් පවරා ගැනීම් සඳහා මේ වෙනකොටත් අදාල කටයුතු කරලා තියෙන්නේ. අපිට දැන් තියෙන්නේ හැමෝම එකතුවෙලා ප්‍රාදේශීය ලේකම් තුමියට බල කරලා හරි මේ කටයුත්ත කරගන්න එක, ඊට අදාල නීත්‍යානුකූල කටයුතු ටික කරලා තියෙන්නේ. ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති කිරිවානාපොල පොදු සුසාන භූමිය අලව්ව ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා වූ යෝජනා පිළිගැනීම සුදුසු බවට පැමිණ සිටි ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**05.04 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව - අංක 07/03/05/04 – II දරණ යෝජනාව.**

ගරු සභාපතිතුමනි, මගේ දෙවන යෝජනාව

02. කිරිවානාපොල ඉදි කර ඇති ජල පොම්පාගාරයේ සහ ජල ටැංකියේ වැඩ අවසන් වී ඇති නිසා මහජනතාවට ජලය ලබා ගැනීමට කඩිනම් කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය දැනුවත් කිරීමට යෝජනා කිරීම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා .

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මෙම ජල ව්‍යාපෘතිය ආරම්භ කලේ 2017 හි. හිටපු ගරු ශාන්ත බණ්ඩාර මැතුතුමාටත් ,හිටපු ගරු ශමල් සෙනරත් මැතිතුමාටත් , හිටපු ගරු විපක්ෂ නායක මොහාන් මැතිතුමාටත් , හිටපු ගරු මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාටත්, මටත් තමයි දඹදෙණි ආසනයේ ආරාධනා පත්‍ර ලැබුනේ, ඒක විවෘත කරන්න ගියා. ඒකට හිටපු ආමාත්‍ය හකීම් මැතිතුමාත් සහභාගී වුනා. එතැනදී මේ අලව්ව ප්‍රාදේශීය කාර්යාලයේ ජල ව්‍යාපෘතිය තිබුනේ. ග්‍රාම සේවා වසම් 54කට පමණයි. 12කට ජල ව්‍යාපෘතිය නැහැ. ඒ සම්බන්ධයෙන් හිටපු ගරු එස්.එම්. ජයතිලක මන්ත්‍රීතුමා එදා ලිපියක් හදාගෙන ගියා. ස්තුතිවන්ත වෙනවා. හකීම් ඇමතිතුමා එම ලිපිය අතේ තියාගෙන රැස්වීම ආමන්ත්‍රණය කලේ. ඒ අවස්ථාවේදී අලව්ව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 12ක් මේකට ඇතුළු වෙලා නැති බවට ලිපිය කියවමින් ඉංජිනේරුවරයාට කතා කරලා වහාම මේවා ඇතුළු කරන්න කියලා කීවා. දකුණු කෝරලේ ග්‍රාම සේවා වසම් 08 කුත් නැගෙනහිර කෝරලේ වසම් 4 කුත් අයිති උනේ නැහැ. ඉතින් ගරු සභාපතිතුමනි, ගනේකන්ද ව්‍යාපෘතිය පටන් ගත්තා. අපේ කිරිවානාපොල ව්‍යාපෘතිය 2019 මාර්තු මාසයේ පටන් ගත්තේ. මන් මැදිහත් වෙලා ස්වාමීන් වහන්සේලා තුන් නමක් වඩම්මවලා පිරිත් කියලා තමයි ඒක ආරම්භ කළේ. ඒ කටයුත්ත අවුරුදු තුනකට තමයි ගිවිසුම් උනේ.ඒක කොහොම හරි ඉදි කළේ මධකලපුවේ ද්‍රවිඩ සමාගමක්. මතක විදිහට ඒකේ නායකයා හිටියේ ගජනාදන් කියලා. ඒ කටයුත්ත හැකි ඉක්මනින් ඉෂ්ට සිද්ධ කළා. එහෙම ඉන්න අතරේ පොඩි ගැටලුවක් උනා. ඒක ගැන කියයි හිටපු විපක්ෂ නායක තුමා තමයි බේරලා දුන්නේ. එහෙම තමයි ගොඩනැගිල්ල ඉදි කළේ. ඉදිකරලා 2014 අපි ඒකට ජලය ගන්න ඉල්ලුම් පත්‍ර දුන්නා. මමත් ඒ ඉල්ලුම් පත්‍රය අරගෙන ජල සම්පත් මණ්ඩලයට භාර දුන්නා. භාර දුන්නහම, රු.10150.00 ක් ගෙවන්න කීවා. කාණුව කපනවා කීවා. ඉල්ලුම්පත්‍රය භාර දීලා ගෙදරට එන්න හම්බ වුණේ නෑ. මට දුරකතන ඇමතුමක් දීල ඇහුවා ඔබ තුමාගේ ගේ තියෙන්නනේ කිරුවානාපොළ ජල පොම්පාගාරයට පහළින්ද , ඉහළින්ද කියලා. මම කිව්වා මගේ ගේ තියෙන්නේ නාරම්මල පැත්තේ ඉදලා දෙවෙනි ගේ කියලා. එහෙනම් කණගාටුයි. ඔබ තුමාට ජලය ලැබෙන්න නැහැ. තවම ජල සම්පත් මණ්ඩලයට කොන්ත්‍රාත්කරු භාර දුන්නේ නැහැ කියන කතාව කීවා. ඊට පස්සේ එතනින් පහළ අයට ජලය දුන්නා. ගනේකන්ද ජලය තමයි දුන්නේ. 2014 තමයි මේකේ වැඩ අවසන් වුණේ. 2025 වෙනකොට මේක කැලෑ වැහිලා. ඉදිරියට ජල ප්‍රශ්නය උග්‍ර වෙනවා. දැන් දවස් තුනකට පෙර මහරච්චිමුල්ල ටවුමට ආසන්න වෙනකල් පාර දිගට ජලය ගලා ගෙන යනවා. පළමු දවසේ බලපුවාහම එකේ මෝටරයක් වැඩ කරනවා. කවුදෝ පුද්ගලයෙක් ෆයිල් එකක් අරගෙන හිටියා කියලා ළඟ ගෙදර කෙනෙක් කීවා. කොහොම හරි එයා ස්වීච් එකක් දාලා යන්න ඇති. දවස් තුනක් එක දිගට වතුර ගියා. ඊට පසුව දෙන්නෙක් ඇවිත් ඒක ඕෆ් කරලා ගියා. ඉතින් මේක හරි අපරාධයක්. මේ ටැංකිය විශාල එකක්. මේකේ වල් බිහිවෙලා. ඒ නිසා මේක ඉක්මනින් ඉටු කරලා දෙන්න කියන අධිෂ්ඨානය මත තමයි යෝජනාව ඉදිරිපත් කලේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මගේ මතකය හරි නම් අපි කිරුවානාපොල රැස්වීමකට ගියාම ඒ ප්‍රදේශයේ ජනතාව ඉල්ලීමක් කලා. වෙන කිසි දෙයක් එපා අපිට වතුර ටික තමයි ඕන කියලා. පානීය ජල ප්‍රශ්නය උග්‍ර වෙනවා. ඒ ගැනත් අවධානය යොමු කරන්න. සභාවේ තීරණයක් හෝ මහජන අධිකාරිය පොළඹවලා හෝ වතුර දෙන්න කියන මතයේ හිටියා. 2013 වර්ෂයේ හිටපු ශාන්ත බණ්ඩාර ඇමතිතුමා ඒ කාලයේ මේ ජල යෝජනා ක්‍රමය සම්බන්ධව ඉන්දියානු ණය ආධාර යෝජනා ක්‍රමයට ඇතුලත් කරමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කලා. 2015 යහපාලන ආණ්ඩුව ඇවිල්ලා තියෙන වෙලාවෙත් එතුමන් නැවත ඒ ආණ්ඩුවේ රාජ්‍ය ඇමතිවරයෙක් ලෙස පත්

උනාට පසු විෂයභාර ඇමතිවරයාට කතා කරලා, ජනාධිපතිතුමාගෙන් සහ අගමැතිතුමාගෙන් ඉල්ලීමක් කරලා මේ ඉන්දියානු ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කලා. හැබැයි මේක එනකොට අපිව දැනුවත් කරලා තිබුනා. මේ ඉන්දිය කම්පැණියකින් ඇවිල්ලා හුඟක් කට්ටිය මේකේ වැඩ කරයි. රිංගන්න පුළුවන් තැනින් රිංගලා යයි. එයාලගේ වැඩේ වාසියකට කර ගන්න බලයි. ඒ නිසා සභාව උනන්දු වෙලා වැඩ කරන්න. මේකට මුල්ගල තිබ්බේ අප්‍රේල් මාසයේ 28 වෙනිදා. ඒ කටයුත්ත කරලා එස්.එම්.ජයතිලක මන්ත්‍රීතුමා ඉල්ලීම කරලා ඒ ඉල්ලීම් ලිපිය දීලා සභාගත කරනකොට ජනතාව ඉදිරියේ ප්‍රකාශ කරලා මේ වැඩකටයුත්ත යනකොට 2018 හෝ 2019 අවුරුද්දේ කිරිඇල්ල මහත්තයා උනන්දුවෙන් කටයුතු කරපු කෙනෙක් එතුමා සමඟ මන්ත්‍රීවරු කීපදෙනෙක් මාව මුණ ගැසෙන්න ආවා . දැන් මහරච්චිමුල්ල ජල ටැංකිය ඉදි කිරීම සඳහා හිටපු ප්‍රා.ලේකම් සුසන්ත ජයතිලක මහතා භූමිය වෙන් කරලා ඉවරයි. මේකේ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම මත වැඩක් . නමුත් ඒක හිටපු සභාපති සන්ධ්‍යා කුමාර මැතිතුමාගේ ගෝලයා සහ එතුමා මැදිහත් වෙලා වතුර ටැංකිය ඉදි කරන්න දෙන්නේ නැ. එවෙලාවේ මන්ත්‍රීතුමන්ලාට මම එහෙම එකක් කරන්න බැහැ කීවා. ඒකට තීන්දුව අරගෙන තියෙන්නේ. මහජන නියෝජිතයෝ හැටියට. බල ප්‍රදේශයේ ග්‍රාම නිලධාරී වසම් 66 සියලු දෙනාටම ජලය ලබා දීම සිදු කරන්න ඕන. කරුණාරත්න කළුආරච්චි මහතාට කතා කරලා කීවා අඩගහන්න කාන්තවන්ට .අපි හැමදාම රැස්වීම්වලට ගිහාම කාන්තාවෝ තමයි වතුර ඉල්ලලා කෑගහන්නේ .එවෙලෙහි 100 ක් විතර රැස්වෙලා හිටියා. මම එම ස්ථානයට යද්දි වතුර ටැංකිය ඉදි වෙනවට අකමැති මහතා එතනින් හෙමින් සීරුවේ ගියා. ඉන්පසු පස් පිඩැල්ල කපලා තීන්දුව දුන්නා වතුර ටැංකිය ඉදි කරන්න කියලා. මේ වතුර ටැංකිය හදන්න ආපු කම්පැණිය මේ වැඩය අවසන් වෙනතුරු කකුල ආපස්සට ගන්න එපා කියලා කරුණාරත්න කළුආරච්චි මහතාට කිව්වා. වතුර ගමට, මහජන අධිකාරියට ඕන විදිහට කරන්න ඉඩක් නෑ කීවා. හැබැයි ඒකේ ටැංකිය හදලා ඔක්කොම වෙලා ඉවරයි. ඔබතුමාට කියන්න අපි ප්‍රාදේශීය ලේකම් කාරයාලයේ තිබ්බ පළමු සාකච්ඡාවේදී ඇහුවා අපිට වතුරත් අවශ්‍යයි, හැබැයි ඔබ කපන්නේ ප්‍රාදේශීය සභාව සතු මාර්ගවල ඉවුරයි, කපලා ඉවුරේ නලය එලලා ඒ නලය හරියට තලලා, හරියට නිවැරදි ආකාරයට බොරළු යොදලා නිවැරදි ආකාරයෙන් භාර දෙනවද ඒකේ වගකීම නැත්නම් සභාවේ හැටියට දරන්නද හැබැයි සභාවට දරන්න මුදල් නැහැ කීවා. එතනදී පැහැදිලිව කීවා, මෙතන නලය එලන සෑම මාර්ගයක්ම කපලා ඉවරවෙලා අවසානයේදී ඒක නිවැරදි කරනකොට ප්‍රාදේශීය සභාවේ කාර්මික නිලධාරී මහත්වරුන්ගේ අධීක්ෂණය යටතේ කරනවා කියලා පොරොන්දුව මත කළේ. හැබැයි ගොරොක්ගස්දෙණියේ පාර කැඩෙන්න ගිහිල්ලා දුන් නෑ. උසස් ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රමිතියට ආවෙ නැත්නම් අපි කපන්න එපා කීවා. අද ප්‍රශනේ බලන්න සභාපතිතුමනි, සභාවේ එහා පැත්තේ, මෙතනින් උඩට ගොඩ වෙන්න බැහැ එයාලා කාපට් කරපු පාර කැපුවා. එදා හිටපු අමාත්‍ය නාමල් ආපු වෙලේ ගමේ මනුස්සයින්ගේ ඉල්ලීමට කරපු දෙයක්. හැරෙන තැන කපලා දැම්මා. ඔබලා ජේනවා ඇති කාන්තාවෝ යතුරු පැදි ගණනාවක් පෙරලා ගත්තා. එතකොට මෙතන වැරැල්ලගම පාර කපන්න දුන් නෑ. අන්තිමට ඩේසි නෝනා ගෙනල්ලා මෙතන එකඟ කරගන්න සභාවේ අපිට සම්බන්ධ වෙන්න වුණා. එහෙම සිද්ධ වෙලා යතාවත් වෙච්චි නැති තැන්වල ප්‍රශ්න ගොඩක් තියනවා. දැන් මේ වතුර ටැංකිය ඉදි කරලා තියනවා නම්, ඒ බල ප්‍රදේශයේ අවභාතාවයට ජලය ලබා දෙන්න. ගනේකන්ද විශාල ටැංකියෙන් අවශ්‍ය කරන ජලය මුදා හරිනවා නම් මේ වතුර ලබා දීමට ගම්වාසීන්ගේ ඉල්ලීමට කරපු ටැංකියට ඇයි වතුර දෙන් නැත්තේ. ඇයි ප්‍රදේශවාසීන්ට වතුර බෙදන්නේ නැත්තේ කියන එක බරපතල ප්‍රශ්නයක්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මෙතන ඉන්න මන්ත්‍රී මණ්ඩලය හැටියට ඒ ගැන සොයා බැලීම සම්බන්ධයෙන් අපිට වගකීමක් තියනවා . දඹදෙණි ආසනයේ අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 66 න් අලව්වට වතුර තිබුණා. ඒක රණසිංහ ප්‍රේමදාස මැතිතුමා 80 ගණන්වල යුගයේ විජේකෝන් ඇමතිතුමාගේ කාලයේ ගෙනාපු ජල යෝජනා ක්‍රමයක්. ඒකේ දෙවන දිගුව තමයි ක්‍රියාත්මක කළේ. මේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න සියල්ල සිදු වෙලා ඉවරනම්, වතුර ටැංකියත් හදලා ඉවරනම්, ඒ කටයුත්තේ අවසාන ටික ක්‍රියාත්මක නොකර තියාගෙන ඉන්නේ ඇයි කියන එක සොයා බැලීමේ වගකීමක් අපිට තියනවා. ඒ හින්දා මිත්‍රත්වයක් හිතවත්කමක් තියෙන්න පුළුවන්. නමුත් එදා කිරිඇල්ල මහතාට පැහැදිලිව කීවා මට උදව්ව කරන්නේ බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මිසක් ඔබේත් මගේත් මිත්‍රත්වයට නෙමේ. කරන වැඩේ හරියට කරන්න. ඒ අනුව ටැංකිය හදලා ඉවරයි. වතුර ටැංකියෙන් අවශ්‍ය කරන ජලය මුදා හැරීම සම්බන්ධව ගැටලුවක් මතුවෙලා තියෙනවා නම්, ඒ බල ප්‍රදේශයේ ඉන්න මහජන නියෝජිතයෝ හැටියට ඔබ සියලු දෙනාටම මේක ප්‍රශ්නයක්. මේක තනිවම කරන්න, කරුණාරත්න කළුආරච්චි මහතාට තනිවම බලා ගන්න කියන්න බැහැ. ඒ නිසා ගරු සභාපතිතුමනි, සභාවේ අවධානය යොමු කරලා ඔබ මේ බල ප්‍රදේශයේ වසම් 66 ට වගකියන ප්‍රධානියා. සමහර වෙලාවට අලව්ව

කොට්ඨාසයේ මාත් ඉන්නවා ඔබත් ඉන්නවා කියලා අදාල නෑ. ඔබතුමාට තමා ප්‍රශ්න එන්නේ. ඒකට උත්තර සපයන්න වෙනවා. ඒ නිසා ඔබ ජල සම්පත් මණ්ඩලය සමඟ කතා කරලා එහි තීන්දුව අහලා තීන්දුව ක්‍රියාත්මක කරන්න බැරි හේතුව මොකක්ද අහන්න. එහෙම නැත්නම්, ඒ ඔබේ වගකීම ඉෂ්ට කරන්න කියන ඉල්ලීම මම ඔබෙන් ඉල්ලනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, කරුණාරත්න මැතිතුමා ගෙනාපු යෝජනාවට මමත් මැදිහත් වුණා. අපේ මේ යන ජල ව්‍යාපෘති සියල්ල සම්බන්ධව සොයා බලන්න කියලා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක ගුණසේන මැතිතුමා විසින් මට පොඩි වගකීමක් පවරලා තියනවා. ප්‍රාදේශීය සභා පාරවල්වල මේ ජල දිගුව ගෙනියන්නේ කොහොමද ඒවාට අලාභ හානි වෙනවද කියලා සොයා බලන්න. එතකොට මේ අපේ මන්ත්‍රීතුමා මතු කරපු ඒ ජල පොම්පාගාරයෙන් කන්දෙගෙදර කොට්ඨාසයේ කොස්ගහමඩ තියනවා ජල ටැංකියක්, ඒකටත් මේ පොම්පාගාරයෙන් වතුර යනවා. ඒ නිසා පසුගිය මැතිවරණ සමයේ ප්‍රදේශයන්වල යද්දී මිනිසුන්ට ආමන්ත්‍රණය කරද්දී අපිට මේක ආපු ගැටලුවක්. ඊට පස්සේ අපි මේ සම්බන්ධව මෙහෙ ඉන්න ප්‍රාදේශීය ඉංජිනේරු මලිත් මහතාත්, මුළු පළාතම බලන ඉංජිනේරු සමරකෝන් මහතාත් සමඟත් කතා කරා. ඇත්තටම මේ වෙලා තියෙන්නේ කලින් කරපු ව්‍යාපෘතිය අතරමඟ නැවතුණා. ඒකට හේතුව තමයි, ආසියානු සංවර්ධන බැංකුවෙන් කෝටි 304 ක් පානීය ජලය වෙනුවෙන් ආධාරයක් දුන්නා. ඒ දීපු මුදල ආගිය අතක් නෑ අවභාවිතා වෙලා. පසුගිය දවස්වල මේ පිළිබඳව කෝප් කමිටුවෙත් කතා කළා. එතකොට මේක ආසියානු සංවර්ධන බැංකුවෙන් ජල සම්පාදන මණ්ඩලයට නඩු දැම්මා. ඒ නඩුව ඉවර වුණේ 2024 ජූලි මස 13 වෙනිදා. ඊට පස්සේ අපේ අතිගරු ජනාධිපති තුමා ආවට පස්සේ මේ පිළිබඳ සාකච්ඡා කරලා නැවත මුදල් යොදලා ක්‍රියාත්මක කළේ නැවත මල්ලැහැව බෝයවලාන ව්‍යාපෘතිය කිලෝමීටර් 35 ක් ආවරණය වෙනවා. ඒකෙන් මන්ත්‍රීතුමාලා ගොඩාක් ඉන්න ප්‍රදේශ ආවරණය වෙනවා. මේ සම්බන්ධයෙන් දුන්න උත්තරය තමා, මේක තාම ව්‍යාපෘතියෙන් ජල සම්පාදන මණ්ඩලයට භාර දීලා නැහැ කියන එක. පසුගිය කාලයේ මේ සම්බන්ධව කුරුණෑගල ඉන්න දිස්ත්‍රික් ඉංජිනේරු, මැනේජර් හැටියට කටයුතු කරන නිලධාරිනිය, ඒවගේම නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී වෙත මේ ප්‍රශන්ය යොමු කරලා තියනවා. ඉතින් ඉක්මනින් මේ පැවරීම් කටයුතු කරගන්න යන බව ප්‍රකාශ කලා. එතනින් පස්සේ මේ කොස්ගහමඩම දක්වාත්, මෙතනින් ඉස්සරහට වෙන්නොරුව, වෙන්නොරුව කන්ද යනාදී ප්‍රදේශවලටත් ඉල්ලනවා. අපේ මන්ත්‍රීතුමන්ලාගේ ගමේ ඉන්න ඔක්කොගෙන්ම ඉල්ලීම් ඉල්ලගෙන ගියපාර සම්බන්ධීකරණ කමිටුවටත් යෝජනා ටිකක් පෙළ ගැස්සුවා. මඩවල පන්සල ආශ්‍රිතව, කිරිවානාපොල පැත්තට වතුර යන්නැතුව බෝයවලාන - මල්ලැහැව ජල දිගුවේදී අපිට ප්‍රශ්නයක් අවා. ඊට හේතුව සොයා බැලුවහම මඩවල පාසලට අඟල් 02 ක පොඩි බටයකින් වතුර දෙනවා. ඉතින් එතනට විතරයි වතුර යන්න පුළුවන්කම තියෙන්නේ. අපි වළං හදන ගම්මානයට මීටර් 380 ක දිගුවක් දාලා අමාරුවෙන් වතුර අරගත්තා. බෝයවලානට ගෙනල්ලා කතා කරාට පසුව, මැනේජර් විදිහට කටයුතු කරන නිලධාරීතුමිය ඇතුළු සියලු නිලධාරීන් ටික සමඟ අපි නැබඩවතුර, බෝගමුව පැත්තෙන් , කිරිවන්පොලෙන් නිරීක්ෂණය කරමින් ඇවිල්ලා මඩවල හන්දියේ සිට කිරිවන්පොල දක්වා නැවත ආයේ මිලිමීටර් 160 කින් යුත් විශ්කම්භය සහිත පයිප්පයකින් මඩවලත් කිරිවන්පොලත් ආවරණය වෙන්න ඒ වගේම බෝයවලාන ව්‍යාපෘතියෙන් අපේ මිගාර් මන්ත්‍රීතුමා කරපු ඉල්ලීමත් සමඟ නැබඩවතුර ග්‍රාමයට , පැපොල්ගස්ඉන්න, ඉහළගම පහළගම ඒකේ කිලෝමීටර් 2ක් බෝයවලාන පොලීසිය පැත්තෙන් ගිහිල්ලා හතරමං හන්දියෙන් දාලා කිලෝමීටර් 2ක් ජල දිගුව අරන් යන්න ඔවුන් පොරොන්දු වුණා. ඒ නිසා අපි විශාල ව්‍යාපෘති ගණනාවක් මේ වෙනකොට අතිගරු ජනාධිපතිතුමාගේත් වත්මන් ආණ්ඩුවේත් ප්‍රමුඛත්වයෙන් සිදු කරගෙන යනවා. දැනට කුරුණෑගලින් ලොකු බලපෑමක් කරනවා පොල්ගහවෙල අලව්ව ව්‍යාපෘතියට . දැන් ඒකට පොල්ගහවෙල - පොතුහැර ව්‍යාපෘතියත් සම්බන්ධ කරලා යනවා. දැනට කුරුණෑගල නගරය පාවිච්චි කරන්නේ දැදුරු ඔයේ වතුර. හැබැයි මා ඔයේ වතුර දැදුරු ඔයේ වතුරවලට වඩා ගුණාත්මකබාවයෙන් උසස් කියලා ඒගොල්ලෝ පොඩි උනන්දුවකින් ඉන්නවා, පොතුහැර ජල දිගුව කුරුණෑගලට ගෙනියන්න. හැබැයි අපේ ප්‍රාදේශීය ඉංජිනේරු මහත්වරු සියලු දෙනා අපිට දැනුවත් කළේ ඔයාලා ඉක්මන් වෙන්න එතකොට අපිට මේ පොල්ගහවෙල පොම්පාගාරයේ තියන වතුර ටික ගනේකන්ද ටවර් එකට පුරවලා ඒකෙන් අපි ඉක්මනට මේ පැත්ත ආවරණ කරගමුයි කියලා. එතකොට අපේ යත්තල්ගොඩ ප්‍රදේශයට මේ වෙනකොට රත්තරන්හේන මඟ, යත්තල්ගොඩ මඟ කැන්දහේන ජල දිගුව ඉදිරියට මීටර් 1700 ක් ගෙනියනවා.ඊළඟට අපි යෝජනාවක් ගෙනාවා කැකුලාවල නැවතිලා තියන දිගුව තල්වත්ත දක්වා ප්‍රධාන පාරේ දිගුවක් අරන් යන්න, ඒවා ටිකක් ලොකු

ව්‍යාපෘති. ඒ නිසා අපි ගම්වල ඊයෙත් ක්‍රියාත්මක වුණා. අදත් තුඹුල්ල ප්‍රදේශයේ ක්‍රියාත්මක වෙනවා. මගේ උපන්ගම ඉඹුල්ගොඩ. මීටර් 768 ක වතුර බටයක් ඇවිත් අවුරුදු හතරක් විතර ඇල්හේන බෝක්කුව තියන තැන ලොකු බටයක වතුර පුරවලා නිකන් තිබ්බා. හැබැයි එතන ඉඳලා මීටර් 300 ක් තිබ්බේ බණවත්ත කියන තැනට. ගෙවල් 44ක් බණවත්ත ප්‍රදේශයේ තියනවා. ඒකෙන් ගෙවල් 39කට වතුර නෑ. එක ගෙදරක් තියනවා ළිං 11ක් කපලා රොඩු දාලා වහලා තියනවා. යට අඩි 6/7ක් යනකොට ගල තිබ්බේ. ඒ අවස්ථාවේ ජනාධිපතිවරණයටත් කලින් අපි මැදිහත් වෙලා ඒ ජල දිගුව ගන්න ක්‍රියාක්මක වුණා. ඒක ක්‍රියාත්මක වෙනකොටත් ප්‍රදේශයේ හිටපු මන්ත්‍රීවරයෙක් අපි මැදිහත් වුණා කියලා අපිට අකුල් හෙලුවා. ඒවෙලාවෙහි අපි කිසිම දේශපාලන බේදයකින් තොරව ඒ වැඩේට මැදිහත් වුණේ, මම විශේෂයෙන්. හැබැයි
ඒ ගොල්ලෝ ජනාධිපතිවරණයෙන් පස්සේ කිලෝමීටර් එකක ව්‍යාපෘතියක් පෙළගස්සලා දුන්නා. ඒ කිලෝමීටරය ඇල්හේන බෝක්කුව කියන තැන ඉඳන් මීටර් 300ක් කියන්නේ යකඩ ඉන්නක් ගහලා බටේ හිල්කරත් බණවත්තට වතුර ටික විදිනවා. මම ඒක දිස්ත්‍රික් ඉංජිනේරු මහතා ගෙන්නලා පැහැදිලි කරලා පෙන්නුවා. අපි මැදිහත්වෙලා බණවත්තට විතරක් ක්‍රියාත්මක කරගන්න තිබුණා එත් මම ඒ ජනතාවට කීවා අපි ඇතුළේ පාරවල් ටික ශ්‍රමදානයකින් කරගමු ඒකට සමිති උපයෝගි කරගමු ආධාර ඉල්ලගමු. ඒ ජල දිගුව මීටර් 300ක් දක්වා ගෙන ගියා. ඒකේ ප්‍රතිඵලයක් විදිහට තුඹුල්ල සමගි මාවත, උඩගන්කන්ද පාර ළඟ නැවතිලා තිබ්බ දිගුව වැවේගෙදර දක්වා ගෙනිච්චා. තුඹුල්ල, ඒකෙන් වතුර නැතිම ගල්ඇන්ද පාර ප්‍රදේශය. ඊළඟට තල්ගස්යාය පාර, සමගි මාවත මේවාගේ විශාල ජනතාවක් ආවරණය වෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමාගේත් අවධානයට යොමු කරන නිසා තමයි මම මේ අදහස කීවේ. ගරු සභාපතිතුමා දන්නවා මම මේ වැඩේ ස්වේච්ඡාවෙන් බැඳිලා කරන්නේ කියලා. මල්ලැහැව බෝයවලාන ව්‍යාපෘතියෙන් හෙණ්ඩුවාවත්තේ පාරවල් 08 ක විතර යනවා. හැබැයි වීරගල ඒකකයත්, සුමති ඒකකයත්, පූජනීය පෙදෙසත් කියන්නේ වතුර නැතිම ඒකක තුනක්. හැබැයි මේක කලින් ඇඳලා තිබ්බ සැලැස්මක් නිසා ඒක නැතුව තිබ්බා. ඒ ප්‍රදේශයේ ඔක්කොගේම අත්සන් ලේඛන අරගෙන දළ සටහන් ඇඳලා ඒ ඔක්කොම ෆයිල් 11ක් කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලයට ගෙනහිල්ලා අද සමත් වෙලා තියනවා කිලෝමීටර් 11ක් අනුමත කරගන්න. ඒකේ හෙණ්ඩුවාව, හෙණ්ඩුවාවත්ත, කැන්දගොල්ල ඊට පස්සේ පන්ගොල්ල ප්‍රදේශයත් ආවරණය වෙන්න සියලු කටයුතු කරලා තියනවා. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවලට ඔබතුමාගේත් අවධානය යොමු කරන්න. අපෙත් ඒකට මැදිහත් වීම කරලා. මේ ජනතාවට ජලය කියන්නේ විශ්වයේ තියන ජීවය ඊළඟට අපේ ජීවය ජලය අපි කාටවත් ජලය නැත්නම් ජීවත් වෙන්න බැහැ. ඒකට අපි සියලු දෙනා ඒකරාශී වෙලා කටයුතු කරමු කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. ඒ. කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි.උද්ධාල ගරු මන්ත්‍රීතුමා ප්‍රකාශයක් කළා ආසියානු සංවර්ධන බැංකුවෙන් ණය ආධාර ගන්නවා කියලා. මේ ව්‍යාපෘතියට ඉන්දියානු ආධාර දුන්නේ. සත පහක් බැංකුවලින් දුන්නේ නැහැ. මේක සම්පූර්ණයෙන්ම ආධාරයක්. අපේ ව්‍යාපෘතිය.ක් තව එකක් පොතුහැර හඳුගොල්ල දැන් ඉදිකරන විශාල දිගුවක් ඒකේම ටැංකියයි පොම්පාගාරයයි වැඩ ඉවරයි. ඒකටත් හඳුගොල්ල, ගනේකන්ද, මහරච්චිමුල්ල, කිරිවානාපොල කොටසක් තමයි ටැංකිය. ඒවා ට සම්පූර්ණයෙන්ම ඉන්දියානු ආධාර තමයි දුන්නේ. එතකොට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම සේවා වසම් 10ක් හෝ 12කට, වීරඹුගෙදර ග්‍රාම සේවා වසම් 14කට, ඒකෙන් තමයි පොතුහැරටත් දුන්නේ. මේක සම්පූර්ණයෙන්ම ඉන්දියානු ආධාර මත එකක්. අරුණ ජයලත් මන්ත්‍රීතුමා දන්නවා. නැතුව මේක සම්පූර්ණයෙන් ආසියානු සංවර්ධන බැංකුවේ ආධාරයක් නෙවේ. මේක ඉන්දියානු ආධාර දුන් ව්‍යාපෘතියක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඇත්ත වශයෙන්ම කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ගොඩාක් වටිනවා. මේකේ මූලාරම්භය තමයි 2012. මේක එවකට හිටපු ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ශාන්ත බණ්ඩාර මැතිතුමාගේ යෝජනාවක්. මේ ප්‍රදේශයට ජල ප්‍රශ්නය තියන නිසා එතුමා ජල සම්පාදන මණ්ඩලයත් එක්ක එකතු වෙලා ව්‍යාපෘතියක් හැදුවා. ඒ ව්‍යාපෘතිය හැදුවහම ඒකේ මුදල විශාලයි. 2020 තමයි මේක පටන් ගත්තේ. යහපාලන ආණ්ඩුව තුළ තමයි ක්‍රියත්මක වුණේ. ඉන්දීය රුපියල් මිලියන 22000ක් වටිනා ව්‍යාපෘතියක්. අපේ රටට දරන්න බැරි හිතන්නවත් බැරි ව්‍යාපෘතියක්. මේ ව්‍යාපෘතිය පාර්ලිමේන්තුවේ ණය ආංශික කමිටුවට යොමු කරා. ඒකට යොමු කරපුවහම මෙම ව්‍යාපෘතිය ඉන්දියාව භාර ගත්තා. මෙම ව්‍යපෘතියට ඉන්දියන් රුපියල් 22000ක් වෙන් කරා. මේක ආධාරයක් නෙවේ. බොහොම අඩු පොලියට දෙන ණය ආධාර දෙන

ව්‍යාපෘතියක්. මේ ව්‍යාපෘතිය වසම් 66න් පොල්ගහවෙල ඔක්කොම, වීරඹුගෙදර ප්‍රදේශීය ලේකම් කොට්ඨාසයේ ඔක්කොම, නාරම්මල වසම් 10ක් විතර ආවරණය වෙනවා. මගේ දැනුම අනුව කරඳන පාලම ළඟ මුලින්ම ඩැම් එක හැදුවේ. ඊට පස්සේ කොස්ගහමඩ, ගනේකන්ද ජල ටැංකිය හැදුවා. හිටපු රවුෆ් හකීම් ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2015 පොතුහැර මුල්ගල තිබ්බා. අපි සියලු දෙනා ගියා. ඊටපස්සේ මේ ව්‍යාපෘතිය ක්‍රමානුකූලව ඉදිරියට ගියා. 2019 හිටපු ජනාධිපති අතිගරු ගෝඨාභය මැතිතුමාගේ යුගයටත් ආවා. නමුත් යම්කිසි කාලයකදී මේ රටේ ආර්ථික අර්බුදයේදී ව්‍යාපෘතිය නතර වුණා. ඒ වෙනකොට මේක වටිනා ව්‍යාපෘතියක්. මට මතකයි 2020/2021 වනවිට අකිල මැතිතුමාගේ ගම් පෙදෙසට වතුර දුන්නා. අපේ ගල්ගමුව මහරච්චිමුල්ල පාරේ වතුර ටික ගියා. මඩවල හුම්බුළුව පාසල පැත්තට ඒවගේම ප්‍රදේශ ගණනාවකට ගියා. ව්‍යාපෘතිය 90%ක් විතර ඉවර කරලා තිබුණේ. නමුත් මේ රටේ තිබ්බ ප්‍රශ්න හා එවකට ආපු ආර්ථික අර්බුදයත් එක්ක හිර වුණා. මගේ දැනුම අනුව, හැබැයි ඉන්දීය කම්පැණි එකකට තමා ටෙන්ඩර් එක ගියේ. එහෙම මෙම ව්‍යාපෘතිය ඇවිල්ලා හඳුනාගත් කඳු 12 කට උස නිසා වතුර දෙන්න බැහැ. ඒත් ඒකටත් යම්කිසි ව්‍යාපෘතියක් සකස් කරලා තියනවා. එතන ටැංකියක් හදලා උඩට pump කරලා ගන්න පුළුවන් ක්‍රමවේදයක්. වැත්තෑකන්ද ගත්තොත් මාසයක් පැච්චොත් වතුර නැහැ. ඒවගේම මාරගල්කන්ද, මේක දවසින් දෙකෙන් ඉවර කර ගන්න පුළුවන් ව්‍යාපෘතියක් නෙමේ. මේක දැවැන්ත ව්‍යාපෘතියක්. හිටපු ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමා මේ ව්‍යාපෘතියට මුදල් සොයාගෙන ක්‍රියාත්මක කිරීම සම්බන්ධව ස්තූතිවන්ත වෙන්න ඕනි. ඉන්දීය රජයට අපි ගරු කරන්න ඕනි. යහපාලන ආණ්ඩුවේ හිටපු ජනපිපති අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාටත්, හිටපු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඇතුළු කැබිනට් මණ්ඩලයටත් ස්තූතිවන්ත වෙන්න ඕනි. 90%ක් ම මෙම ව්‍යාපෘතිය නිම කරලා තිබ්බට 2025 ඇති වූ ආර්ථික අර්බුදයත් එක්ක භාණ්ඩ මිල වැඩි වුණා. එතකොට කම්පැණි එක කීව මේ පවතින ගණන් එක්ක කරන්න බෑ. නැවත ඇස්තමේන්තු ගත කරන්න කියලා. මේ හේතුව නිසා මේක ප්‍රමාද වුණේ. දැන් මේකේ ඉතිරි දිගුව ගෙනියනවා. අපිට සන්තෝෂයි මොකද අපේ ප්‍රදේශයේ ජනතාවට ජලය දෙන්න ඕනි. මේක වටිනා පිංකමක්. ඉතින් ගරු සභාපතිතුමාගේත් වර්තමන රජයේත් මැදිහත් වීම මත මේ ව්‍යාපෘතිය ගෙනියන්න පුළුවන් හැමතැනකටම වතුර ටික දෙන්න. මේ රාජ්‍ය ව්‍යාපෘතියක් ඉදිරියේදී පොතුහැරටත් යයි. හැම පුරවැසියාටම වතුර දෙන එක ආණ්ඩුවේ කාර්යභාර්යක්. ඒක නිසා කරඳන පාලම කියන්නේ දැවැන්ත ජල ප්‍රමාණයක් එක්රැස් කරන තැනක්. මේක සාර්ථක ව්‍යාපෘතියක්, මේක නිම වෙන්න කාලයක් ගත වෙයි. මම මේකේ ප්‍රශ්නයක් දකිනවා. ගරු සභාපතිතුමනි, මේක අත්දැකීම් තියන කම්පැණිවලට බෙදලා දෙන්න ඕනි. එතකොට මේ ව්‍යාපෘතිය ඉක්මනින් ක්‍රියාත්මක වෙනවා. අධිවේගී මාර්ගය හදනවා වගේ. එක පිරිසක් දෙපිරිසක් කරන්න ගිහාම බොහෝම කාලයක් යනවා. අපිට ඉක්මනින් ප්‍රතිඵල ගන්න බැරි වෙනවා. එදා 2015 මුල්ගල තිබ්බහම ඒ වැඩෙත් ඒ විදිහට කෙරුවනම් 2020, 2021 වන විට ඔක්කොටම වතුර ටික යනවා. මේකේ වෙලා තියෙන්නේ වගකීම් ටික බෙදලා දීලා නෑ. එකම කම්පැණියක් කරගෙන ගියේ ඒකයි වැරැද්ද. මන් බලපොරෙත්තු වෙනවා මේ ව්‍යාපෘතියෙන් ග්‍රාම නිලධාරී වසම් 66 ටත්, පොල්ගහවෙල, නාරම්මලටත් ජලය දෙන්න ඕනි කියලා. ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා අපේ 26 දෙනාගේම මැදිහත් වීමෙන් ඒකමතික තීන්දුවක් තියලා මේක ජල සම්පාදන මණ්ඩලයට යවලා විෂය භාර අමාත්‍යවරයාට, අතිගරු ජනාධිපතිතුමාට යොමු කරලා මේක කඩිනම් කරලා දෙන්න කියලා. මේ දැවැන්ත ව්‍යාපෘතිය නිර්මාණය කරපු ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමාව අගය කරනවා. ඒ වගේම මේකට දායක වුණු සියලු දෙනාටම ස්තූතිවන්ත වෙනවා. වර්තමානයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක ගුණසේන මැතිතුමාටත් ස්තූතිවන්ත වෙනවා. මේ ව්‍යාපෘතිය ඉදිරියට ගෙනියන්න සියලුදෙනාටම ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ. නාරද සිරිවර්ධන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, කරුණාරත්න මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් මාත් කරුණු කිහිපයක් කතා කරන්න ඕනි. මේ ජල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ලොකු දායකත්වයක් නොදුන්නට අරුණ මන්ත්‍රීතුමා ප්‍රකාශ කාළ වගේ 2012 දී ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමා ආරම්භ කළේ. අදියරෙන් අදියර තමා මේක ඉදිරියට ආවේ. මම මේකට පොඩි දායකත්වයක් දුන්නා. මඩවල ප්‍රදේශය ගැන කතා කරපු නිසා මඩවල පාසලට සති දෙකක් පායනකොට ළිඳ හිදෙනවා. එතකොට එදා ඉඳලා මම තමයි මඩවල පාසලට ජලය සැපයුවේ. එතකොට අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේ තමයි විදුහල්පති වෙලා හිටියේ. මම ඒක වසර තුන හතරක් මගේ වාහනවලින් කරා. මට ලොකු උවමනාවක් තිබුණා ඒ ප්‍රදේශයට ජලය ලබා දෙන්න.

මන් මේ ගැන කීප සැරයක්ම ශාන්ත බණ්ඩාර මැතිතුමාට මතක් කරා. නමුත් මේක අදියරයෙන් අදියරට තමා ජලය සැපයීම සිදු කරේ. හයේ කණුවේ හුම්බුළුව ප්‍රදේශයටත් ඉස්සර ජලය නැහැ. ඒ ප්‍රදේශයට ඇවිල්ලා ඊට පස්සේ මඩවල ප්‍රදේශයට ආවට පස්සේ මඩවල පාසලට වතුර ගියේ නෑ. ඒකට ගමේ අය සමඟ අපි මැදිහත් වෙලා තමයි ඒ වැඩේ කරේ. මම ඒ අවස්ථාවේදී අපේ ගෞරවනීය ස්වාමීන් වහන්සේත් එක්ක කතා කළා බට දාල නළ ළිදක් හදන්න. කීපදෙනෙක් එකතු වෙලා අඩි 200ක් යනකල් නල ළිඳ ගැහුවා ගල්කුඩු විතරයි. මේකේ ගල විතරයි ඒක නිසා වැඩේ නැවැත්තුවා. මඩවල විජේසූරිය මහතා කීවා පාසලට මෙහා පැත්තේ පොඩි ඉඩම් කෑල්ලක් තියනවා. මම ඉඩම දෙන්නම් කියලා. ඒකේ වතුර තියනවා ළිඳක් කපමු. ඊටපස්සේ මම බැකෝ එක ගෙනත් දාලා සම්පූර්ණයෙන් ළිඳක් කැපුවා. ඒ ළිඳෙන් තමා පාසලට වතුර දෙනකල් ගත්තේ. ඒකත් හිඳුණ කාලේට මම ආයෙත් වතුර සැපයුවා. එහෙම තමයි අපේ ප්‍රදේශයට අපි වගකීම ඉෂ්ට කළේ. ගරු ශාන්ත බණ්ඩාර මැතිතුමා මැදිහත් වෙලා තමයි ඉන්දියානු ආධාර ක්‍රමය යටතේ මෙම ව්‍යාපෘතිය කරේ, හොඳ කරපු අයට හොඳ කියන්න ඕනි. ඒක කියන්න තමයි ඕනි කළේ. ස්තූතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය සහ අපේ මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි. අපේ කරුණාරත්න මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව, ඇත්තටම මේක ඉදි කරලා අවසන් වෙලා තිබුනා නම් ඒක ප්‍රදේශයේ ජනතාවට පවරලා වතුර දෙන් නැත්නම් ඒක ජාතික අපරාධයක්. ඒ කියන්නේ රාජ්‍ය නිලධාරී යාන්ත්‍රණය ජල සම්පත් මණ්ඩලය ඇතුළේ පුදුමාකාර ආකාර්යක්ෂමතාවයක් තියනවා. ඒ හින්දා මේ නිලධාරීන්, මහජන නියෝජිතයින් ගෙන්නලා කියන කතාව නෙමේ ඇතුළේ තියෙන්නේ. ඒ නිසා උද්ධාල මන්ත්‍රීතුමා සභාපතිතුමා තේරුම් ගත්තේ නැත්නම් ඔයාලත් ඉස්සරහට ලොකු අමාරුවකට වැටෙනවා. ඒ හින්දා මේ ජල ව්‍යාපෘතිය සම්බන්ධව තමුන්නාසේලාට අපි උපදේශයක් දෙන්නේ. ගරු සභාපතිතුමා මේ කියපු කාරණා හොඳට දන්නවා. ඒ එක්කම තමා අපේ අග්බෝවේ හිටියා හොඳ මන්ත්‍රීතුමෙක්. නන්දසේන මන්ත්‍රීතුමා එතුමාව එහෙම දන්නවා. ඉතින් මෙම ව්‍යාපෘතිය පිළිබඳව සම්පූර්ණයෙන්ම හොඳ අවබෝධයක් මට තියනවා. මේක අදියර තුනකින් අවසන් වුණේ. මේක ශාන්ත බණ්ඩාර මැතිතුමාගේ යෝජනාව. ඒක පිළිබඳව කාටවත් කතා කරන්න බැහැ. විවාද නෑ. ලිපිලේඛන ඕනි නම් තියනවා. එතුමා යෝජනාවක් හැටියට පාර්ලිමේන්තුවට දාලා ව්‍යාපෘති වාර්තාවත් එක්ක පාර්ලිමේන්තුවේ ණය අධීක්ෂණ ආංශීකරණ කාරක සභාවට දාලා ඉන්දියාවෙන් තමා ණය දුන්නේ. මේක ණය ආධාරයක්. නිකම් දුන්නේ නැහැ සුළු පොලියකට දුන්නු මුදලක් මේක. ලක්ෂ 10 ඒවා මුදලින් 22000ක්. මේ ව්‍යාපෘති මුදලින් දඹදෙණි ආසනයම ආවරණය වෙනවා. කටුගම්පල වසම් 10ක්, කුලියාපිටිය වසම් 14ක් ආවරණය වෙනවා. මේක අදියර තුනක්. කුරුණෑගල මේකට නෑ. එතකොට මේක අදියර තුනක් කියන්නේ, පළමු එක තමා ටැංකි 5ක් ඉදි කිරීම, දෙවනි අදියර ප්‍රධාන මාර්ගවල නල ටික අරන් යන එක, තුන්වන අදියර තමා ගම්මාන ඇතුළට දෙන එක. ඒ දෙනකොට වසම් පනස්හය ඇතුළේ ලෙව්දෙණිය තිබුන් නෑ. ඊට පස්සේ නිලධාරීන් ගෙන්නලා ඒක සාකච්ඡා කරලා ඒක ඇතුළත්කර ගත්තා. ඊටපස්සේ මේකේ තව තියනවා අවසාන අදියර කියලා එකක් ඒ ජල ඒකකයකට රුපියල්5/6 ක මිල වැඩිවීමක්. ඒ තමා කඳු ආශ්‍රිත ටික. ජලය යන්න පුළුවන් උපරිම තැනට ගිහිල්ලා එතනින් එහාට පීඩනය මදිනම් එතනට ටැංකියක් ඉදි කරලා පොම්ප කරලා ඉහළ ස්ථානයකට එතනින් ජලය බෙදා හරිනවා. ඒ අයට, පහළ ජලය භාවිතා කරන අයට වඩා වැඩියෙන් ජල ඒකකයක මිල රු.5කින් වෙනසක් තියනවා. ඒ අනුව යමින් ශාන්ත බණ්ඩාර මැතිතුමාගේ අදහසක් තිබුණා, දඹදෙණි ආසනයේ විදුලිය නැති ගෙවල්වලට සම්පූර්ණයෙන්ම විදුලිය දීලා අවසන් කරන්න. එතුමා ඡන්දය මට එපා කියලා ප්‍රසිද්ධ වේදිකාවල, රූපවාහිනියේ එහෙම කීවා. එතුමා විදුලිය දීලා අවසන් කළා. මෙතුමාගේ අවශතාවයක් තිබුණා දඹදෙණි ආසනයේ සියලු දෙනාටම ජලයත් දීලා ඉවර කරන්න ඕනි කියලා. ඒ අනුව තමයි මේ ව්‍යාපෘතිය සම්බන්ධ කළේ. විවිධි දේශපාලන පෙරලීන් එක්ක විවිධ ආණ්ඩු එක්කත් සම්බන්ධ වුණා. ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමත් එක්කත් හිතවත්, එතුමා එක්කත් මේ ව්‍යාපෘතිය නතර කරන් නැතුව ඉදිරියට අරගෙන ආවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමත් ජනාධිපති වෙලා ආවා, එතුමත් මේ ව්‍යාපෘතිය පහලට දැම්මේ නැහැ ඉදිරියට අරගෙන ආවා. ඒ හින්දා උද්ධාල මන්ත්‍රීතුමා කීවා වගේ අපි ආසියානු සංවර්ධන බැංකුවෙන් ජල ව්‍යාපෘතියක් සම්බන්ධව අහපු පළමු අවස්ථාව. එහෙම අක්‍රමිකතා වෙලා තියෙනවා නම්, පැහැදිලිව උද්ධාල මන්ත්‍රීතුමා ගරු සභාපතිතුමා, ඔබ තුමාලා මේ දූෂණය වංචාව පිටු දකින අය ඒ නිසා පැහැදිලිවම අධිකරණයට ගෙනල්ලා මේ පිළිබඳව හොඳට සොයා බලන්න. මේ කියන්නේ පොඩි ගාණක් නෙමේ. රාජ්‍ය අහිංක මිනිසුන්ගේ බදු මුදලින් හම්බෙන

සල්ලි, ණයක් හැටියට ගෙවන්න අරගෙන දූෂණය කරලා වංචා කරලා තියනවා නම් ඇත්තටම මේවා අල්ලලා ගෝල්ෆේස් එකට ගෙනහිල්ලා ඒ අය අල්ලලා ගල්ගහන්න ඕනි. පරීක්ෂණ කරලා අසියානු සංවර්ධන බැංකුවේ කවුද මේකට ඉන්නේ, මේවා උනේ කොහොමද කියලා මන්ත්‍රීවරු හැටියට අපිට දැන ගන්න හෙළි කරන්න. මේවා සුළු දේවල් නෙමේ. බරපතල චෝදනාවක් වගේම බරපතල ගනයේ දූෂණයක් වෙලා තියේ නම්, හැබැයි එහෙම නැතුව පසුගිය ආණ්ඩුවේ සියලු දෙනාටම කරන මහා අයහපත් විදිහේ නින්දිත චෝදනාවක්. මේ සම්බන්ධයෙන් වැඩ කරපු මිනිස්සුන්ට ගෞරවනීයබාවයට කැළැල්ලක්. ඒක ගැලපෙන්නේ නැහැ. අපි හැමවෙලාවේම නිහතමානීව මොන පක්ෂයේද කියලා නැහැ අපි ඕනම මතයක් දරන අය හොඳ දෙයක් කරා නම් අපි අගය කරන පිරිසක්. එදා අතිගරු ජනාධිපති අනුර කුමාර මැතිතුමාටත්, ගරු සභාපතිතුමාටත් සර්වජන ඡන්ද බලය හිමි මිනිස්සු අද ජනමතයක් දීලා තියනවා. ඒකට සියලු දෙනාම යටයි. ඒකට ගරු කරන්න ඕනි. විපක්ෂව හිටියට අපි ඔබ තුමන්ලා ගේන යෝජනාවලට අදහස්වලට හරිදේට ශක්තියක් දෙනවා. ගරු සභාපතිතුමා ඔබ තුමා දන්වා හිටපු ලේකම් තුමිය සහ හිටපු සභාපතිතුමාගේ කාලයේ මේ ජල ව්‍යාපෘතිය සම්බන්ධව ඉස්සරලා හිටියේ නිලධාරිතුමෙක් ඊට පස්සේ නිලධාරීතුමියක්, පාර කඩන ඒවා සම්බන්ධව ගනේකන්ද පොළට උඩින් ප්‍රශ්නේ. පාර හැමදාම කඩලා මිනිස්සු පුදුමාකාර විදිහට ප්‍රශ්නවලට මුහුණ දෙනවා. ඒවා පිළිබඳව කතා කරපුවාහම කරන්නේ එකක්, ක්‍රියාවෙන් කරන්නේ තව එකක්. පාර කැඩුවහම මෙහෙම මෙහෙම තලන්න කීවහම තලන යන්ත්‍රය තියෙන්නේ ලොරියේ. අපි ඕවා එදා කතා කරා අහක බලන් හිටියේ නැහැ. ව්‍යාපෘතිය භාරව පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාගේ නියෝජිතයා හැටියට උද්ධාල මන්ත්‍රීතුමා ඉන්නවා නම් ඒ ගැන හොයලා බලන්න. දැන් මේ මිලියන 22000 ඉවරයි කියනවා අපේ රටේ ආර්ථික අර්බුදයත් එක්ක භාණ්ඩවල මිල වැඩි වීමත් සමඟ හොයලා බලන්න, මේ මුදල් වියදම් කරලා තියෙන්නේ මොනවටද කියලා අහන්න. ඒගොල්ලෝ කියන කතා අහලා විතරක් ඉන්න එපා. අපිත් ඔය කතා අහලා තියනවා. දැන් මේ මුදල් වැඩිපුර වියදම් කරලා තියනවලු විදේශ සංචාරවලට, ඒගොල්ලන්ට අධ්‍යාපනික දැනුම ලබා ගන්න. ඒ හින්දා ජල ව්‍යාපෘතියේ ඉන්න නිලධාරීන් මේ මුදල් කාබාසිනියා කරලා තියනවා. දේශපාලනික නායකයාගේ කෝණයෙන් බලන් නැතුව, හොඳට හොයලා බලන්න දේශපාලන නායකයෝද හොරකම් කරලා තියෙන්නේ නිලධාරීන්ද කියලා. දේශපානල මතවාද සමඟ මේ ජල ව්‍යාපෘතියේ මතවාද සට්ටනය කරගන්න එපා. එහෙම වුණොත් නිවැරදි දේ හොයන්න බැහැ. අපි එක තැනක හිටියොත් අපේ මනස වැඩ කරන්නේ එක දිහාවකට තමා, අපිට නිවැරදි දේ කරගන්න බැහැ. ඒ හින්දා අපිට ඔබ හැම වෙලාවේම හතුරෙක් හැටියට පේනවා නම්, අපිට ඔබව හඳුන ගන්න බැහැ. හොඳ දේ හඳුන ගන්න බැහැ. ඒ නිසා නිලධාරීන් ෆයිල් දිග්කරලා පෙන්නුවහම වියදම් වුණා කියලා පිළිගන්න එපා. අපිටත් ඕවා කරා. අන්තිමට ඇත්ත සොයා බැලුවහම කාරණේ ඕක නෙමේ. හෙට ආණ්ඩුව වෙනස් කරලා බලන්න. ඔය කතා කරන ජල ව්‍යාපෘතියේ නිලධාරීන් කතා කරන රෙකෝඩින් එකයි අපිත් එක්ක කත කරන රෙකෝඩින් එකයි අරගෙන බලන්න සම්පූර්ණ චෝදනාව ඔබතුමාලට එල්ල කරනවා. අර බඹරගල හන්දියේ පාර කැඩුවා, පස් දෙනෙකුට වැඩිය පෙරලිලා අතපය කඩා ගත්තා. මම සභාවේ මේ ගැන කතා කරලා තියනවා. ඒක හදන්න කීවා අදත් හදලා නැහැ. කාපට් එක හරියට තලලා දාලා නැහැ. පොරමඩල කනිෂ්ඨය ළඟ පාර කැඩුව. අද ඒකේ පිළිවෙලක් නැහැ. මෙතන පරමාඋල්ලට ඇතුළේ පාරට යන තැන ටැංකියක් ගහලා තියනවා පස් දාලවත් හදා ගන්න බැහැ. පාරටත් උඩින් ටැංකියක් ගහලා තියනවා. බඹරගල හන්දියේ ජල ටැංකියට මං ලියුමක් දීලා හදලා තියනවා. අපේ ප්‍රාදේශීය සභාවේ තාක්ෂණික නිලධාරී මහත්වරු බැලුවා කියනවා, බලනකොට එපැයි කාණුවේ ටැංකිය හදලා තියෙන්නේ කියන්න. අද මහමෙව්නාවේ පාරේ වතුර බහින් නැහැ. මහපාරවල් කඩාගෙන වතුර පාර යනවා. මේවා වීඩියෝ කරලා රෙකෝඩ් කරලා පෙන්නුවා. ප්‍රාදේශීය සභාවෙන් ලියුම ගහලා අයින් කරනවා කීවා තාම නැහැ. ඒ හින්දා ජල ව්‍යාපෘතියේ ඉන්න අපි යෝජනා කරපුවා අපිට බැහැ කියලා ඔබතුමාලට හා කියනවා. සිරිපුර වත්තේ ජල ව්‍යාපෘතිය පවරා ගන්න කියලා මෙතුමායි මමයි කිරිඇල්ල මැතිතුමා ඉන්න කාලේ පුදුම විදිහට කීවා. අරක කියනවා මේක තියනවා කියනවා ගිවිසුමක් තියනවා කියනවා. ෆිනෑස්ස් ඒකේ සම්බන්ධයක් තියනවා කියනවා. දැන් කියනවා ඔබතුමාලට පුළුවන් කියලා. බලගලවත්තේ උඩහට වතර දෙන්න කියලා නිලධාරීන්ට කීවාහම එතකොට පීඩනය මදි කියනවා. ඒ වතුරවලට මොකද වුණේ. ජාතික ජන බලවේගය ආපුවහම ප්‍රෙෂර් එක් ඩබල් වුණාද? මේවා අවබෝධයෙන් තේරුම් ගන්න. එහෙම නැත්නම් ඔබතුමන්ලා දේශපාලනික වශයෙන් අනාථ කරනවා. අපි අත්දැකීමෙන් කියන්නේ. ෆයිල් එකක් දිගැරගෙන කියනවා අපි ෆයිල් එක ඉල්ලුවහම ෆයිල් එකේ තියෙන්නේ වෙන මොනවත්. ඒ හින්දා උද්ධාල මන්ත්‍රීතුමා මේ ජල ව්‍යාපෘතිය කියලා කියන්නේ දැලි පිහියෙන් කිරි කන එකක්. සමහරවිට

ඔබතුමා ඇති වෙලා නැති වෙලා යන්නත් පුළුවන්. ඔබ තුමා අපේ සහෝදර මන්ත්‍රීවරයෙක් මිත්‍රයෙක් අපිත් එක්ක දේශපාලනය කරපු සහෘදයෙක්. ඒ හින්දා අවධානයෙන් මේ පිළිබඳව හොයලා බලලා හැමදේම පිළිබඳව හරස් ප්‍රශ්න අහන්න මේ මිලියන 22000ට මොනවටද වියදම් කළේ කියලා. ඒගොල්ලෝ පාටි දාපුවා, සංචාර ගියපුවා, අධ්‍යාපනික වැඩසටහන්වලට, පුහුණු වැඩසටහන්වලට දාගෙන ඇති. මේ ව්‍යාපෘතියේ අරයාගේ ගෞරවය ගන්නවද ශාන්ත බණ්ඩාර මැතිතුමාගේ ගෞරවය ගන්නවද කියලා නෙවේ. ඔයාලගේ ආණ්ඩුව තියෙන්නේ අපි ඔබලාට සහයෝගය දෙනවා. එතුමා මේ ආණ්ඩුව ඉස්සරහට ගෙනියන්න ගත්තු එකටම අපි ගෞරව කරනවා. ඔයාලා අපි සියලු දෙනා වැඩ කරලා කොටසකට වතුර දුන්නා නම්, සභාපතිතුමාගේ ආසනයටනේ වතුර දෙන්නේ ව්‍යාපෘති කරලා, නැතුව අහහරු ලෝකෙට නෙමෙනේ. ආණ්ඩුවක් හැටියට වතුර දීලා ඉවර වුනොත් මේ විපක්ෂය මන්ත්‍රීවරුනට ආයේ මේ වතුර ප්‍රශ්නය එන්නේ නැහැ. පාරක් හදලා ඉවර වුණොත් ඒ ප්‍රශ්නේ එන්නේ නැහැ. ප්‍රියන්ත මන්ත්‍රීතුමා අපේ පැත්තේ පාරවල් ඔක්කොම හදනවා නම් මම කැමතියි. මට පාරේ යන්න පුළුවන්නේ. මට ප්‍රශ්න එන්නේ නැහැනේ එතනින් ඉවරයි. එහෙම හිතන්න ඕනි. දේශපාලනය කරන කාලෙට දේශපාලන මතවාද ගොඩ නගමු. අපි සියලුදෙනාම ආවේ මහජනතාවට සේවය කරන්න. දේශපාලන මතය වෙනයි. අපේ මතය වෙනයි. හැබැයි මොන මතයකින් හරි එන්නේ මහජනතාවට උදව් කරන්න. අපි තුන්ගොල්ලෝ, දෙගොල්ලෝ හැම පක්ෂයම කරන්නේ මහජනතාවට සේවය කරන එක. අවසාන අරමුණ ඕකනේ. මොන මතවාද හරි කිය කිය හරි අවසාන අරමුණ මහජනතාවට සේවය කිරීම. ඉතින් ජනතාවට සේවය කරන එකේ දී එකතු වෙලා තමුන්නාසේලාට උදව් කරන්න කැමතියි. අපි සහයෝගය දෙනවා. අපි තැන තැන දේශපලනය කරන් නැහැ. හැබැයි දේශපාලන උපායමාර්ග භාවිතා කරනවා. ඒක දේශපාලනය මිසක් දේශපාලන කපටිකම් නෙවේ. අපේ අය වරද්දගෙන තියනවා. සමහර අය දේශපාලඥයෝ හරි කපටි කියලා කියනවා හැබැයි දේශපාලඥයින් තමයි දේශපාලන කපටිකම දේශපාලන උපායශීලීත්වයට පරිවර්තනය කරගෙන තියෙන්නේ. අපිත් උපායන් භාවිතා කරනවා. ඔයගොල්ලොත් එහෙමයි. හැබැයි ඒක සමාජ සේවයට ප්‍රදේශීය සභාවේ ගමන් මඟට ඒවා බාධා පමුණුගන්න ඕනි නැහැ. හැමවෙලාවේම දේගපාලන මතයක් දරන මිනිහා හොරෙක් වංචාකාරයෙක් කියලා කියන්න ඕනි නැහැ. සමහර වේදිකාවල ජනතා විමුක්ති බලවේගයෙන් කීවා ප්‍රාදේශීය සභාවේ වැඩ කරන්න බැහැ රුපියලක්වත් නැහැ හොරකම්කරලා තියෙන්නේ කියලා. මං වේදිකාවල කීවා ඡන්දෙ වෙලාවේ, මෙතෙක් මේ ප්‍රාදේශීය සභාවේ ජනතා විමුක්ති පෙරමුණෙන් මන්ත්‍රීවරු දෙදෙනෙක් ඉදලා තියෙනවා හැම පක්ෂයකම මන්ත්‍රීවරු ඉදලා තියනවා මේ ලේකම් තුමිය ඉස්සරහා කියන්නේ හිටපු ලේකම්තුමියත් හොඳට වැඩ කළා ප්‍රදේශීය සභාවේ එක නිලධාරී කෙනෙක්වත් වංචාවලට උදව් කරලා නැහැ .මේ ප්‍රාදේශීය සභාවේ වගකීමෙන් අදත් මන් කියනවා එක රුපියලක්වත් මේ කිසිම මන්ත්‍රීවරයෙක් වංචා කරලා නැහැ. වංචාවකට දායක වෙලත් නැහැ. යම්කිසි වචනයකින්වත් සහයෝගය දීලා නැහැ. සමහර වෙලාවට මේ සභාවේ තමන්ගේ නායකයාට විරුධව කතා කරලා තියනවා. නාගරික සංවර්ධන පනත ගෙනල්ලා මේ බලතල උදුර ගන්නකොට ගෝඨභය මැතිතුමාට විරුද්ධව මං කතා කළා. ලංකාවම ප්‍රාදේශිය සභාවේ බලතල ගන්නකොට මේ චමින්ද විරුද්ධ වුණා. අද වගේ නෙවේ ගෝඨාභය මැතිතුමාලට සුපිරි බලයක් තියෙන වෙලාවේ කෑගැහුවේ. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු වෙලාවේ බැසිල් මැතිතුමත් එකක රණ්ඩු වුණා. කහවත්ත පාර ගොඩ කරන්න කියද්දි වෙල් නිසා කරන්න බැහැ කීවා. මං කීවා කිලෝ මීටර් එකක් තියෙන්නේ ගම ඇතුළට ට්‍රැක්ටරයක් ගන්න අපිට අඩි අටක පාරක් තියෙන්නේ මේක ගොඩ කරන්න ඕනි කියලා ගොවිජන සේවා පනත අන්තිමට පැත්තකට විසි කරලා ප්‍රදේශීය සභාව දන්නෙත් නැතුව ගොවිජන සේවා එකවත් දන්නේ නැතුව කිලෝ මීටර් 2 ½ ක් ගොඩ කරලා නිකන් හිටියා. සමහර වෙලාවට මේක නීතිපොත ඇතුළේ යන්න බැහැ. ප්‍රායෝගික වෙන්නත් ඕනි. ඒවා ගලපගන්න ඕනි. එදා මං කීවේ පාරක් දානවා ගොවිජන සේවා එකට අඩි 12ක් තියනවා. ග්‍රාම සේවක වාර්තාවේ අඩි 11.8යි, 10.9යි කියලා ලියනවා. මේක පටලගෙන ගිහිල්ල ගොවිජන සේවා පරණ අයට දැම්මා. පොරමඩල පාර ඇල පල්ලේ දැම්මා, මං බැකෝ එකක් ගෙනිහිල්ලා පාර කපලා පාලමේ කාණු දෙක බැන්දා සල්ලි මදි වෙලා ලැල්ල දාන්න බැරි වුණා එක බැම්මක් වැටුණා. අදට වුරුදු 08 ක් විතර. මේක දාගෙන යනකොට ගොවිජන සේවා එකේ නිලධාරීන් ආවා ප්ලෑන් එක ගේන්න කි.යලා ඒක බැලුවා අඩි 8යි. අවුරුදු 30 ක් විතර තිබ්බ අඩි 12 අඩි 06 ට වැට ගැහුවා. නීතියට ගිහාම වුණ දේ. නීතියෙන් නොදා කටයුත්ත කරා නම් අදත් අඩි 12 තියනවා. ඉස්සර ප්‍රාදේශීය සභාවේ අජිත් මන්ත්‍රීතුමා ,නන්දසේන මන්ත්‍රීතුමා මං දැකලා තියනවා. කෑම එක අරගෙන කාටහරි දීලා යනවා. එතුමා මත්ද්‍රව්‍ය සම්බන්ධව තදින් කතා කරපු කෙනෙක්. එතුමාට අපි හයියට හිටියා. එතුමා JVP කියලා තනි කරේ නැහැ.ඒ නිසා අලව්ව ප්‍රාදේශීය

සභාවේ දැන් ඉන්න මන්ත්‍රීවරු කාටවත් දූෂිතයෝ වංචාකාරයෝ කියලා චෝදනා කරනවට මම තදින් විරුද්ධයි. මේ නිලධාරීන් කරලත් නැහැ. මේ ප්‍රාදේශීය සභාව බොහොම අඩු සම්පත් වලින් ක්‍රමවේදයකට ගිහිල්ලා තියනවා. ඔබතුමාලගේ නායකය සභාපතිතුමා දන්නවා සභාව යන්න ඕන විදිහ. දේශපාලන වේදිකාවේ විපක්ෂය කීවාට මෙතෙන්ට ආවහම සහෝදරයෝ වගේ අපි කටයුතු කරනවා. දේශපලන මතවාද හප්ප ගත්තේ නැහැ. කරුණාරත්න මන්ත්‍රිතුමා ගෙනාපු යෝජනාව මෙතෙක් කාලයක් ප්‍රමාද කිරීම පිළිබඳව හොයලා බලන්න .ජාතික අපරාධයක් ඒ හරහා රජයට වෙන පාඩුව හොයලා බලන්න. විශේෂයෙන්ම ජල සම්පත් මණ්ඩලයේ නිලධාරීන් කියන එක පිළිගන්න එපා. උද්ධාල මන්ත්‍රීතුමා ගරු අශෝක මැතිතුමාටත් කියන්න මේ අවබෝධය දෙන්න. හරස් ප්‍රශ්න අහලා ෆයිල් බලලා කටයුතු කරන්න එතුමාට බලය තියනවා. ඒගොල්ලෝ මේ වෙලාවේ හොරෙක් බේරන්න හොරෙක් අල්ලනවා. ඒ කියන්නේ හොරෙක් බේරන්න හොරෙක් නිර්මාණය කරනවා. එතකොට සැබෑ හොරා හැංගෙනවා අර නිර්මාණය කරන හොරා දිහාවට අවධානය යනවා. එහෙම ඒවත් තියනවා. ඒක නිසා ඒවාත් කල්පනා කරන්න. ගරු සභාපතිතුමනි ඔබතුමා ජල සම්පත් මණ්ඩලයේ නිලධාරීන් සියලුදෙනා  මෙතෙන්ට ගෙන්නලා මන්ත්‍රීතුමන්ලාත් සමඟ සාකච්ඡාවක් දාලා දෙන්න. ලිඛිතව ලියලා. එතකොට ඔබතුමාලට හයියක් වෙන්න අපි අහන්නම්. අපිත් එක්ක කතා කරනවා ගිවිසුම ගහනවා ක්‍රියාත්මක කරලා නැහැ. ඒගොල්ලෝ බොරුව කරන්නේ. රවට්ටන එක කරන්නේ. එහෙනම් සියලු දෙනාටම මෙතුමාගේ යෝජනාව ඉක්මනින් ක්‍රියාත්මක කරන්න හේතුවාසනා වේවායි කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

අපේ ගරු මන්ත්‍රී කරුණාරත්න මැතිතුමා ගෙනාපු යෝජනාවෙන් ලොකු කතිකාවතකට යන්න පුළුවන් උනා. හැබැයි ඒක හොඳයි. අපේ නවක මන්ත්‍රීවරුන්ට මේ සියලු වපසරියන් ගැන දැනගන්න අවබෝධයක් ගන්න හොඳ අවස්ථාවක් . කතා නොකරම නිකම්ම ගියොත් අපේ අලුත් අය හැදෙන් නැහැ. ඒ නිසා සියලු ඒ දේවල් ඇවිල්ලා ගැටිලා නිවැරදි දේත් එක්ක හිටගන්න ඕනි. ඒක තමා මේ සභාවේ ක්‍රමය. ඉතින් මම දන්නවා ගරු උද්ධාල මැතිතුමා පසුගිය කාලවල ජල සම්පත් මණ්ඩලයේ ඉහළ නිලධාරීන් සමඟ විශාල කාර්යභාර්යක් කරා. ප්‍රායෝගිකව ඇත්තටම අපිට කරලා පෙන්නුවා. එතනින් එහාට දිගුව ගෙනියන්න ලොකු දායකත්වයක් දීලා ඒකේ ප්‍රතිඵල පෙන්නලා තියනවා. ඉතින් මං විශ්වාස කරනවා එතුමාට නිලධාරීන් සමඟ විශාල සම්බන්ධකම් තියනවා. අපි එකතු වෙමු. නිල වශයෙන් දැනුම දීලා එකතු කරගෙන මේ කාර්යය විතරක් නෙමේ පොම්පාගාරය වැඩෙත් එකතු වෙලා කරමු. මෙතනින් එහාට වෙන දේවල් වලට සම්බන්ධ වෙලා එකතුවෙලා සාර්ථක කරන්න සහයෝගය දෙමුයි කියලා මතක් කරමින් ඒ යෝජනාව සභා සම්මත කිරීම සඳහා ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කර ඇති කිරිවානාපොල ඉදි කර ඇති ජල පොම්පාගාරයේ සහ ජල ටැංකියේ වැඩ අවසන් වී ඇති නිසා මහජනතාවට ජලය ලබා ගැනීමට කඩිනම් කිරීම සඳහා ජල සම්පත් මණ්ඩලය දැනුවත් කිරීම සිදු කළ යුතු බවට පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**<u>05.05 ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් කරනු ලබන යෝජනාව අංක 07/03/05/05 දරණ යෝජනාව</u>**

2025 වර්ෂයේ සභා අරමුදල් යටතේ තුන්වන හා හතරවන කාර්තුවලට අදාලව ක්‍රියාත්මක කිරීමට නියමිත පහත සඳහන් ව්‍යාපෘති වලට අදාල වැය ශීර්ෂ හා ප්‍රසම්පාදන තත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට යෝජනා කරමි.

2025 වර්ෂයේ සභා අරමුදල යටතේ තුන්වන සහ හතරවන කාර්තුවලට අදාලව ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති

| A | B | C | E | G | I |
|---|---|---|---|---|---|
| අනු අංකය | ව්‍යාපෘති නාමය | ක්‍රියාත්මක ග්‍රාම නිලධාරී වසම | ඇස්තමේන්තු මුදල රු. | වැය ශීර්ෂ අංකය | ප්‍රසම්පාදන තත්වය |
| 1 | හෙණ්ඩුවාව සිට නල්ලූර දක්වා මාර්ගය සංවර්ධනය කිරීම (NWP ALP B9 /5 0/7) | හෙණ්ඩුවාව | 500,000 .00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |
| 2 | ලෙව්දෙණිය මාවත්ත මාර්ගය සංවර්ධනය (NWP ALP C01/2 /3/1) | ලෙව්දෙණිය | 1,000,000.00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |
| 3 | පල්ලෙකැකුලාවල ඕලුස්සාව මාර්ගය සංවර්ධනය කිරීම (NWP ALP D03/20 /6/) | වැත්තෑව | 500,000.00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |
| 4 | පරමාඋල්ල ගංගොඩ මාර්ගය සංවර්ධනය කිරීම (NWP ALP B9 /18/) | පරමාඋල්ල | 500,000.00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |
| 5 | ගල්පොත්තේපොල බෙලිවත්ත මාර්ගය සංවර්ධනය කිරීම (NWP ALP C10/6) | ගල්පොත්තේපොල | 500,000.00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |
| 6 | හෙණ්ඩුවාවත්ත 1 වන පටුමග සංවර්ධනය කිරීම (NWP ALP C04/10/2) | හෙණ්ඩුවාවත්ත | 500,000.00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |
| 7 | හඟවත්ත හැඩිපන්නල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම(NWP/ALP/C01/2/2) | ලෙව්දෙණිය | 500,000.00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |
| 8 | කළල්පිටිය සරණ සේවා විහාර මාවත සංවර්ධනය කිරීම(NWP/ALP/B8/20/1) | නුගවෙල | 1,000,000.00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |
| 9 | වෙලන්ගොඩ කන්ද මාර්ගය සංවර්ධනය කිරීම(NWP/ALP/D03/19/01) | පල්ලේකැකුලාවල | 500,000.00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |
| 10 | මඩවල සිට තුඹුල්ල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම(NWP/ALP/B9/40/3) | තුඹුල්ල | 500,000.00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |
| 11 | උඩගන්කන්ද තල්ගස්යාය මාර්ගය සංවර්ධනය කිරීම(NWP/ALP/D/11/6) | උඩගන්කන්ද | 500,000.00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |
| 12 | කුඩුමුල්ල හරහා මැදිකැලේ වත්ත මාර්ගය(NWP/ALP/A6/4/4) | කොහොලාන | 500,000.00 | 3-3-309-4 | ප්‍රජා පාදක සංවිධානයක් මගින් |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය**
ගරු සභාපතිතුමනි, මෙහි ව්‍යාපෘති අංක 3හි ව්‍යාපෘතියෙහි ග්‍රාම නිලධාරී වසම වෙනස් විය යුතුයි. ඒක පල්ලේකැකුලාවල විය යුතුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**
ගරු සභාපතිතුමනි, ඒ වගේම ව්‍යාපෘති අංක 05 ගල්පොත්තේපොල බෙලිවත්ත මාර්ගය සංවර්ධනය කිරීම . ඒක ඔබතුමාගේ යෝජනාවක්ද? කියලා දැනගන්න කැමතියි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමිය, ඒක අයවැය යෝජනාවක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඇත්තටම ව්‍යාපෘති අංක 12 කුඩුමුල්ල හරහා මැදිකැලේ වත්ත මාර්ගය සම්බන්ධව මේකේ යෝජනාවක් තියෙනවා. ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඒ සඳහා නායකත්වය කරන්න කොට්ඨාසයේ මන්ත්‍රීවරයා විදිහට මට අවස්ථාව ලබා දෙන්න කියලා. ඡන්දෙන් පත්වුණු කොට්ඨාසය දිනපු මන්ත්‍රීවරයා විදිහට. ඒක අවශ්‍ය වන ආණ්ඩු පක්ෂයේ කවුරු හරි ඉන්නවා නම් සම්බන්ධ වුණාට කිසි ගැටලුවක් නෑ. ජනතා මතයටත් හිස නමලා මේ සම්බන්ධව මූලිකත්වය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා, තුමියන්ලා සියලුදෙනාටම සභා අරමුදල්වලින් ඉදිරියේදී මේවාට සම්බන්ධ කරගන්න කටයුතු කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ. අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**
ගරු සභාපතිතුමනි, ගල්පොත්තේපොල බෙලිවත්ත මාර්ගය සංවර්ධනය කිරීම කියන ඒකේ බෙලිවත්ත මාර්ගය කියලා නම් කරලා තියෙන්නේ කොතන ප්‍රදේශයද? කියලා දැන ගන්න කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේකේ කුඩුමුල්ල හරහා මැදිකැලේ වත්ත කියලා මාර්ගයක් නැහැ. ඒක නිසා ඒකත් අපි සංශෝධනය කරගන්න ඕනි. මැදිකැලේ වත්ත කියලා එකක් තියනවා කුඩුමුල්ල හරහා මැදිකැලේ වත්ත කියලා එකක් නෑ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමනි, ඒ ටිකට අවධානය යොමු කරලා හරියට නිරවුල් කරලා දෙන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මේවා ගිය අවුරුද්දේ ගත්ත යෝජනා වෙන්න ඇති .මේකේ හෙණ්ඩුවාවත්ත 1 වන පටුමග සංවර්ධනය කිරීම කියලා තියනවා. ඒක තාම හොයාගන්න බැරි වුණා. ඒකේ වීරගල ඒකකය, සුමති ඒකකය කියලා ඒකක තියෙන්නේ. මේ පිළිබඳව දැනුවත් කළොත් හොඳයි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, අපි මෙහෙම කරමු. මේ වසම්වල ඉන්න ග්‍රාම නිලධාරී මහත්වරු මේවා හරියටම දන්නවා. සංවර්ධන නිලධාරී මහත්වරුත් දන්නවා. ඒ නිසා ඒ අය සම්බන්ධ කරගෙන නිරවුල් කරගමු. මේ හැම එකේම ගැසට් කරපු අංකයක් තියනවා මේක මැප් එකෙන් බලන්න පුළුවන් කියලා වැඩ අධිකාරී මහතා දැනුවත් කරනවා. ඒ නිසා අවුලක් නැහැ හරියටම පුළුවන් බලාගන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අතුකෝරල මන්ත්‍රීතුමා කියනවා කාරණාවක්. එතුමා කොට්ඨාසයේ මන්ත්‍රීතුමා ඒ නිසා එතුමාට ඒ යෝජනාව නැත්නම්, අවශ්‍ය විදිහට සංශෝධනයක් කරන්නවත් අවස්ථාවක් දෙමු.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, හරි අපි ඒ අවස්ථාව දෙමු. බෙලිවත්ත මාර්ගය කියන එක එහෙම ගැසට් කරලා තියන නිසා තාක්ෂණයත් සමඟ හොයා ගන්න පුළුවන්. මේ සංශෝධනවලට යටත්ව එකඟතාවය ලබා දෙන්න.

ඒ අනුව 2025 වර්ෂයේ සභා අරමුදල් යටතේ තුන්වන හා හතරවන කාර්තුවලට අදාලව ක්‍රියාත්මක කිරීමට නියමිත ඉහත සදහන් ව්‍යාපෘති වලට අදාල වැය ශීර්ෂ හා ප්‍රසම්පාදන තත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම සුදුසු බවට පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**<u>05.06 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්.එස්. ලක්ජය මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව - අංක 07/03/05/06 දරණ යෝජනාව.</u>**
**2025 සභා ව්‍යාපෘති සංශෝධනය කර ගැනීම සම්බන්ධවයි.**
2025 අයවැය යෝජනා යටතේ ප්‍රතිපාදන වෙන්කර ඇති බුජ්ජොමුව දුම්රිය ස්ථානය දක්වා අතුරු මාර්ගය (NWPALP CO2/15) සංවර්ධන ව්‍යාපෘතියට අදාල මාර්ගය විසින් පළාත් ප්‍රතිපාදන යටතේ කාපට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති බැවින් අදාල මාර්ගය සභා අරමුදල් මඟින් සංවර්ධනය කිරීම ප්‍රතිඵලදායි නොවන බැවින්, ඒ සඳහා වෙන්කර ඇති රු. 500000.00 ක මුදල අදාල කොට්ඨාශයටම අයත් බුජ්ජොමුව, බෝමළුව පන්සල මාර්ගය සංවර්ධනය කිරීම ලෙස ව්‍යාපෘතිය සංශෝධනය කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්.එස්. ලක්ජය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, බුජ්ජොමුව දුම්රිය හරස් මාර්ගය ¾ ක් විතර කාපට් කරල සංවර්ධනය කරලා තියෙන්නේ. මොකද බුජ්ජොමුව දුම්රිය ස්ථානය, අලව්ව දුම්රිය ස්ථානයට පස්සේ තියෙන ප්‍රධාන දුම්රිය ස්ථානයක්. එතකොට මේකේ සංවර්ධන කටයුතුවලදී ඇත්තටම කාපට් එකකට හරි තාර වගේ එකකට හරි ගියොත් වගේ හොඳයි කියන යෝජනාව සුදුසුයි කියන මතය දරනවා. මොකද ඒක ප්‍රධාන මාර්ගයක්. ඉතින් ඒකට කොන්ක්‍රීට් හෝ කුට්ටිගල් අතුරන යෝජනාවට වැඩිය ඒ යෝජනාවකට යන එක සුදුසු නිසාත්, බෝමළුව පන්සල මාර්ගයේ පවුල් 50, 60 කට වැඩිය ජීවත් වෙනවා ඒ නිසා මම යෝජනව වෙනස් කරලා ඒ මාර්ගය සංවර්ධනය සඳහා යෝජනාව ගේනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න

ඒ අනුව 2025 අයවැය යෝජනා යටතේ ප්‍රතිපාදන වෙන්කර ඇති බුජ්ජොමුව දුම්රිය ස්ථානය දක්වා අතුරු මාර්ගය (NWPALP CO2/15) යන සංවර්ධන ව්‍යාපෘතියට අදාල මාර්ගය පළාත් ප්‍රතිපාදන යටතේ කාපට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කර ඇති බැවින්, අදාල මාර්ගය සභා අරමුදල් මගින් සංවර්ධනය කිරීම ප්‍රතිඵලදායි නොවන බැවින්, ඒ සඳහා වෙන්කර ඇති රු. 500,000.00 ක මුදල අදාල කොට්ඨාශයටම අයත් බුජ්ජොමුව, බෝමළුව පන්සල මාර්ගය සංවර්ධනය කිරීම ලෙස ව්‍යාපෘතිය සංශෝධනය කිරීම සුදුසු බවට පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**<u>05.07 ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව - අංක 07/03/05/07 දරණ යෝජනාව</u>**
**<u>පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන 2025</u>**
**<u>පළාත් පාලන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම</u>**

**අනුමත ප්‍රතිපාදන මුදල - 10,000,000.00**

2025 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ අලව්ව ප්‍රාදේශීය සභාවට ස්කිඩ් ස්ටියර් ලෝඩර් යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බවත්, මේ සඳහා අමතර මුදලක් දැරීමට සිදු වුවහොත් එය සභාව මඟින් දැරීමටත්, ඒ සඳහා විවෘත මිල ගණන් කැඳවීමට භාෂා ත්‍රිත්වයෙන් පුවත්පත් දැන්වීමක් පළකිරීමට මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවටත් යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න.

ඒ අනුව, 2025 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ අලව්ව ප්‍රාදේශීය සභාවට ස්කිඩ් ස්ටියර් ලෝඩර් යන්ත්‍රයක් මිලදී ගැනීම සුදුසු බවත්, මේ සඳහා අමතර මුදලක් දැරීමට සිදු වුවහොත් එය සභාව මඟින් දැරීමටත්, ඒ සඳහා විවෘත මිල ගණන් කැඳවීමට භාෂා ත්‍රිත්වයෙන් පුවත්පත් දැන්වීමක් පළකිරීම සුදුසු බවටත් පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**<u>05.08 ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව - අංක 07/03/05/08 දරණ යෝජනාව</u>**

**<u>ලංසු ඇගයීම කමිටු සාමාජිකයින් පත් කිරීම</u>**

2025 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත කැප්පිටිවලාන සිට හෙණ්ඩුවාව පංගොල්ල දක්වා මාර්ගය හා තැලවිල්ල සකස් කිරීම ව්‍යාපෘතියේ(ඇස්තමේන්තු වටිනාකම 4,750,366.91) ලංසුපත් කැඳවා ක්‍රියාත්මක කිරීමට නියමිත බැවින් ඒ සඳහා ලංසු ඇගයීම් සාමාජිකයින් ලෙස පහත නිලධාරීන් පත් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| නිලධාරි | සේවා ආයතනය |
|---|---|
| කේ.ජී.නිහාල් ගාල්ලගේ මහතා (කමිටු සභාපති) - පළාත් පාලන ඉංජිනේරු | පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| එම්.පී.එම්.ඩබ්.එස්. දමයන්ති මිය (කමිටු සාමාජික) - නිර්මාණ වැඩ අධිකාරී | පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| වයි.එම්.එම්.ටී.බී. උඩවෙල මහතා (කමිටු සාමාජික) - වැඩ අධිකාරී | අලව්ව ප්‍රාදේශීය සභාව |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න.

ඒ අනුව, 2025 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ ක්‍රියාත්මක කිරීමට නියමිත කැප්පිටිවලාන සිට හෙණ්ඩුවාව පංගොල්ල දක්වා මාර්ගය හා තැලවිල්ල සකස් කිරීම ව්‍යාපෘතියේ (ඇස්තමේන්තු වටිනාකම 4,750,366.91) ලංසුපත් කැඳවා ක්‍රියාත්මක කිරීමට නියමිත බැවින් ඒ සඳහා ලංසු ඇගයීම් සමාජිකයින් ලෙස ඉහත නිලධාරීන් පත් කිරීම සුදුසු බවට පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**05.09 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. ප්‍රියන්ත උපුල් කුමාර කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව - අංක 07/03/05/09 දරණ යෝජනාව**

**සංවර්ධන යෝජනා සංශෝධනය කිරීමට ඉල්ලීම**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 අයවැය ලේඛනය මඟින් හැඩිපන්නල සිට හඟවත්ත මාර්ගයේ සංවර්ධනය වෙනුවෙන් යටිගල්ඔළුව ග්‍රාම නිලධාරී වසමට අදාලව වෙන්කර ඇති රු. 500,000.00 ප්‍රතිපාදන මුදල වෙන්කරගෙන අදාල මාර්ගයේ ආරම්භක ස්ථානයේ සිට මීටර් 20කට පමණ ඉදිරියෙන් කාපට් අතුරා නොමැතිව ඉතිරි වී ඇති කොටසේ යම් ප්‍රමාණයක් කොන්ක්‍රීට් කිරීමට යෝජිතව ඇත. එහෙත් ප්‍රදේශවාසීන්ගේ අදහස වී ඇත්තේ එකී මාර්ගයේ ඉතිරි වී ඇති සම්පූර්ණ කොටසම එකවර සංවර්ධනය කිරීම සුදුසු බවය. එබැවින් එම ප්‍රතිපාදන මුදල යටිගල්ඔළුව ග්‍රාම නිලධාරී වසමට අයත් එම මාර්ගයෙන් බෙදී යන අතුරු මාර්ගයක් වන හැඩිපන්නල ප්‍රජා ශාලාව අසලින් පලාගල පුරාණ විහාරය දක්වා ගමන් ගන්නා මාර්ගයේ මේ වන විට කොන්ක්‍රීට් කර නවතා ඇති ස්ථානයේ සිට ඉදිරියට කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට යෝජනා කරමින් ඊට අදාල සංවර්ධන යෝජනාව සංශෝධනය කර දෙන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ආර්. අනිල් කීර්ති බණ්ඩාර මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මෙතුමා කීව වගේම ඉතාමත් වැදගත් මාර්ගයක්. එම පාරේ වෙල මැද පොඩි පොඩි නියරක් තිබ්බේ. ඒ කාලේ හිටපු ගරු සභාපති රත්නායක මැතිතුමා දන්නවා, මැෂින් ගෙනල්ලා මුළු ප්‍රදේශයම ගොඩකරා. හැබැයි මගේ ප්‍රදේශය ගොඩ කිරීමට අහුවුන් නෑ මට තමා ගොඩ කරන්න උනේ. ඒ මේ මාර්ගයේ කිලෝමීටරයක් විතර ගොඩ කරේ මම. බෝක්කු බැදලා ඔක්කොම කරා. අන්තිමට පයාගල පන්සලට යන්න තියෙන කෙටිම පාර නැත්නම් දායකයෝ කිලෝමීටර් 2 1/2 ක් යන්න ඕනි. මම බෝක්කු බැදලා පාර පුළුල් කරලා තියනවා. මෙතුමා කොන්ක්‍රීට් කොටසක් දාලා තියනවා. සමිති ශාලාවෙන් එහා පැත්තට තව කොටසක් තියනවා ඉස්සරහට යන්න. හැබැයි ඔබතුමාට තව කාරණයක් කියන්න ඕන. ඔය වඩේ මුදලාලිලාගේ ගේ ළඟ අනිත් මන්ත්‍රීවරු දන්නෑ, ප්‍රියන්ත මන්ත්‍රීතුමා ඔබතුමා දන්නවා. ඒ බෝක්කුව හදන්න සල්ලි ආවා. අපේ කාලේ ආපුවහම හැඩිපන්නල කට්ටිය ඇවිල්ලා කීවා බෝක්කුවේ සල්ලි ටික අතුරු මාර්ගයකට දෙන්න කියලා. මං කීවා මම ඒකට විරුද්ධයි. වහාම අපේ ගමේ කාරක සභාව කැඳවන්න. ධර්මරත්න හේරත් මහතාත් හිටියා. මේ බෝක්කුව කැඩුනාට පස්සේ අවුරුදු 5ක් විතර ලයිට් කණුව උඩ තමා ගියේ. ඊට පස්සේ ශාන්ත බණ්ඩාර මහතාගෙන් ප්‍රතිපාදන අරන් හදන්න අවුරුදු 5, 6ක් විතර ගියා. ඔය බෝක්කුවත් ප්‍රධාන මාර්ගයෙන් කැඩිලා ගිහාම අවුරුදු ගණනකට හදාගන්න බැරිවෙයි මොකද ක්ෂණිකව සල්ලි හොයන්න නැහැ. ඕකත් ලයිට් කණු යොදලා තමයි යන්න වෙන්නේ කියලා. මේ පාරට සල්ලි දෙන්නම් බෝක්කුව කාපට් එකෙන් හදලා දෙන්නම් කියලා ධර්මරත්න හේරත් මැතිතුමා කීවා. ඔක ග්‍රාම නිලධාරී ළඟ ලොග් සටහන් පොතේ ලියලා තමා මම ඒ මුදල දෙන්න කැමති වුණේ. ඒවගේ හැඩිපන්නල කට්ටිය තමන්ගේ වැඩේ කරගන්නවා. ප්‍රධාන පාර අතෑරලා තමන්ගේ ගෙවල් පාර කර ගන්නවා. ඒ හින්දා වැඩේ හොඳ වැඩක් ඒත් කියන කතන්දර නෙමේ තියෙන්නේ. ඒ හින්දා ඒ ගැනත් අවධානෙන් ඔබතුමා ඉන්න. එහෙම නැති වුණොත් ජනතාවම තමයි අපිව ප්‍රශ්න කරන්නේ.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න.

ඒ අනුව, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 අයවැය ලේඛනය මඟින් හැඩිපන්නල සිට හඟවත්ත මාර්ගයේ සංවර්ධනය වෙනුවෙන් යටිගල්ඔළුව ග්‍රාම නිලධාරී වසමට අදාලව වෙන්කර ඇති රු. 500,000.00 ප්‍රතිපාදන මුදල වෙන්කරගෙන අදාල මාර්ගයේ ආරම්භක ස්ථානයේ සිට මීටර් 20කට පමණ ඉදිරියෙන් කාපට් අතුරා නොමැතිව ඉතිරි වී ඇති කොටසේ යම් ප්‍රමාණයක් කොන්ක්‍රීට් කිරීමට යෝජිතව ඇති අතර, ප්‍රදේශවාසීන්ගේ අදහස වී ඇත්තේ එකී මාර්ගයේ ඉතිරි වී ඇති සම්පූර්ණ කොටසම එකවර සංවර්ධනය කිරීම සුදුසු බවය. එබැවින් එම ප්‍රතිපාදන මුදල යටිගල්ඔළුව ග්‍රාම නිලධාරී වසමට අයත් එම මාර්ගයෙන් බෙදී යන අතුරු මාර්ගයක් වන හැඩිපන්නල ප්‍රජා ශාලාව අසලින් පලාගල පුරාණ විහාරය දක්වා ගමන් ගන්නා මාර්ගයේ මේ

වන විට කොන්ක්‍රීට් කර නවතා ඇති ස්ථානයේ සිට ඉදිරියට කොන්ක්‍රීට් කර සංවර්ධනය කිරීමට සහ ඊට අදාල සංවර්ධන යෝජනාව සංශෝධනය කිරීම සුදුසු බවට පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**05.10 ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව - අංක 07/03/05/10 දරණ යෝජනාව**

**අනුමත අරමුදල අදාල ප්‍රදේශයේම වෙනත් ස්ථානයකට යෙදවීම පිළිබඳව අනුමැතිය සම්බන්ධවයි.**

කන්දෙගෙදර දකුණ(986) ජාතික ජන බලවේග කමිටුව හරහා 2025/07/05 වන දින ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ලිපිය අනුව, කන්දෙගෙදර දකුණ කොසගහමඩ ප්‍රදේශයේ කපුහේන කන්ද නමැති ස්ථානයට සහා අරමුදලින් රු.ලක්ෂ 05ක් වෙන් වී ඇති බවත්, එය කොන්ක්‍රීට් යොදා පිළිසකර කිරීමට යොදා ඇත. එහෙත් දැනට මධ්‍යම රජයට යෝජනා කර ඇති පරිදි විල්ගමුව පාරේ දැනට කාපට් දමා ඇති කොටසේ සිට දෙවක්කර මංසන්ධිය තෙක් කිලෝ මීටර් 02 ක පමණ කොටස තාර දමා සංවර්ධනය කිරීමට අවධානය යොමුකර ඇති බැවින් අතර මැද කොන්ක්‍රීට් දා නැවත තාර දමන අවස්ථාවේදී එය අප්‍රයෝජන වැඩක් බවට පත් වීමේ ඉඩක් ඇති බැවින් එහි ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම පරිදි එම මුදලින් කොන්ක්‍රීට් දැමීමට සුදුසු කොටසක් තීරණය වී තිබෙන අතර, ප්‍රේමදාස මහතාගේ කඩය ළඟ සිට කනත්ත දෙසට ගමන් කරන මාර්ගයේ ආරම්භක ස්ථානයේ පටන් රු.ලක්ෂ 05 මුදලට උපරිම කළ හැකි කොටස අවසන් කර දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්. ලක්ෂ්මි කාන්ති ඥාණලතා මැතිනිය**

ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**

ගරු සභාපතිතුමනි, කපුහේන කොස්ගහමඩ මාර්ගය සංවර්ධනය කිරීමට ලක්ෂ 5ක් දාලා තිබුණා. පසුගිය දවස්වල ග්‍රාමීය සංවර්ධන යෝජනා ගන්නකොට කොට්ඨාස සභාවෙනුත් පෙළගැස්සුවා. ඒකෙදී අපේ ගරු ප්‍රාදේශීය සභාමන්ත්‍රී තුමාට දුන්නා කිලොමීටර් 5කට අඩු ප්‍රධාන පාරවල් යාවෙන මාර්ග කාපට් අතුරා සංවර්ධනය කිරීම කියලා. ඒකෙදී ආවේ කාපට් අතුරලා නෙවේ තාර දාන්න කියන එක. හැබැයි මේ ප්‍රධාන මාර්ගයත් ඔන්න ඔය සැලැස්මට ඇතුළත් කරලා අපිට කුරුණෑගලිනුත් පෙළගස්සලා කාර්යාලයටත් ඇවිල්ලා තිබුණා. ඒ නිසා ගම්වාසීන්ගේ ඉල්ලීමක් තියනවා ප්‍රධාන පාර ඒ විදිහට කාපට් හරි, තාර හරි දානව නම් මේ කඳු නගින ප්‍රදේශයක් නිසා මේකට යොදාගමු කියලා ඉක්මනින් ක්‍රියත්මක වුණොත් මේ ලක්ෂ 5 වෙනත් තැකනට යොදමු කියලා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න.

ඒ අනුව, කන්දෙගෙදර දකුණ(986) ජාතික ජන බලවේග කමිටුව හරහා 2025/07/05 වන දින ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් ලිපිය අනුව, කන්දෙගෙදර දකුණ කොසගහමඩ ප්‍රදේශයේ කපුහේන කන්ද නමැති ස්ථානයට සභා අරමුදලින් රු.ල්කෂ 05ක් වෙන් වී ඇති බවත්, එය කොන්ක්‍රීට් යොදා පිළිසකර කිරීමට යොදා ඇති අතර දැනට මධ්‍යම රජයට යෝජනා කර ඇති පරිදි විල්ගමුව පාරේ කාපට් දමා ඇති කොටසේ සිට දෙවක්කර මංසන්ධිය තෙක් කිලෝ මීටර් 02 ක පමණ කොටස තාර දමා සංවර්ධනය කිරීමට අවධානය යොමුකර ඇති බැවින් අතර මැද කොන්ක්‍රීට් දා නැවත තාර දමන අවස්ථාවේදී එය නිශ්ප්‍රයෝජන වැඩක් බවට පත් වීමේ ඉඩක් ඇති බැවින් එහි ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම පරිදි එම මුදලින් කොන්ක්‍රීට් දැමීමට සුදුසු කොටසක් තීරණය වී තිබෙන අතර, ඒ අනුව, කපුහේන කන්ද සිට කොස්ගහමඩ ජනපදය හරහා දෙවක්කර මාර්ගය සංවර්ධනය කිරීම(NWP ALP C05 / 5 /2) සංශෝධනය කරමින් ප්‍රේමදාස මහතාගේ කඩය ළඟ සිට කනත්ත දෙසට ගමන් කරන මාර්ගයේ ආරම්භක ස්ථානයේ පටන් රු.ලක්ෂ 05 මුදලට උපරිම කළ හැකි කොටස අවසන් කර දීම සුදුසු බවට පැමිණ සිටි ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**05.11 ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව - අංක 07/03/05/11 දරණ යෝජනාව**

**නව ජල නල පද්ධතිය එළීම සඳහා අතුරු බොරලු මාර්ගයක් පළුදු කිරීම සම්බන්ධව**

අලව්ව, ඉඹුල්ගොඩ, නො 16/1 ලිපියෙහි එස්.ආර්.ජී.පී.මදුවත්ත මහතා විසින් 2025.06.26 වන දින ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපියට අනුව, අලව්ව ගිරිඋල්ල මාර්ගයේ මල්ලැහැව හන්දියට පෙර අලව්ව සිට පැමිණෙන විට වම් අත දෙසට දිවෙන තුඹුල්ල පත්තිනි දේවාල මාර්ගයේ දැනට ජලනල එලා ඇති අතර, මෙම මාර්ගය මඟින් සම්බන්ධ වන දැනට ඉදිකර ඇති නිවාස 11 සඳහා දිවෙන බොරළු මාර්ගය හරහා ජලනල එළීම සඳහා 2025/06/13 වන දින අලව්ව, ජල සම්පාදන මණ්ඩලයෙන් ඉල්ලීම් කර අතර ඒ අනුව අලව්ව, ජල සම්පාදන මණ්ඩල කාර්යාලය හරහා 2025/06/24 වන දින මිනුම් කටයුතු සිදු කර ජල නල එළීම ඉදිරියට කරගෙන යාම සඳහා මාර්ගය පළුදු කිරිම සම්බන්ධව ප්‍රාදේශීය සභා අනුමැතිය අවශ්‍ය වී ඇත. මෙම ජල සැපයුම ලබා ගැනීම සඳහා සියලු දෙනාගේම ශ්‍රම දායකත්වය ලබාදීම හා මෙම මාර්ගය පළුදු කර ජලනල එළීම සම්බන්ධව විරුද්ධත්වයක් නොමැති බවත් මෙම කටයුත්ත කඩිනමින් සිදු කර ගැනීම උදෙසා ප්‍රාදේශීය සභා අය කිරීමෙන් නිදහස් කර මේ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**
ගරුසභපතිතුමනි, ඔය ඉල්ලීම ගිය සභාවට කලින් ආවේ. ඒ වෙලාවේ නීතියක් තියනවා සභාවට ඉදිරිපත් කරන්න ඕනි කියලා. ඕක ශ්‍රමදායකත්වයෙන් කරන්නේ. එතනදී කොන්ක්‍රීට් අතුරන්න බලාපොරොත්තු වෙනවා නමුත් ඊට කලින් මේ මාර්ගයේ ජල දිගුව යොදාගන්න එක ඇත්තටම හොඳයි. ඒවා පළුදු වෙන්නැ විනාශ වෙන් නැ. ඒ නිසා මෙම ඉල්ලීම් යෝජනාව ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඒ කාලේ අපේ අයත් ඔහොම ඉල්ලලා අවසර ගන්නවා. ඒ අරගෙන නලය ගහලා ඉවරවෙලා වතුර ටික ගෙදරට ගත්තයින් පසසේ තලන එකත් අමතක වෙනවා වලත් අමතක වෙනවා. ඒ හින්දා ඒවා හරියට තලන කටයුත්ත කරන්න කියන්න නැත්නම් ප්‍රාදේශීය සභාවට ප්‍රශ්න ගොඩාක් වෙනවා. ඒ ගැනත් උද්ධාල මන්ත්‍රීතුමා අවධානය යොමු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඇත්තතටම මේ සභාවට එන්න කලින් ගරු ලේකම්තුමියට ඉල්ලීම් කරලා ගෙවීම් කටයුතුවලින් නිදහස් කරලා ශ්‍රමදායකත්වය මත කරන ඒවා කරගත්තා. එවෙලෙහි ලේකම්තුමියට කීවා ජල සම්පත් මණ්ඩලයට යොමු කරන ලියුමේ ගහන්න කාණු කපලා එක්ස්කැවේෂන් කරලා ජල දිගුව දෙන්න කලින්, කාණු සකසලා ඒක හදලා ඉවර වෙලා අධීක්ෂණ නිලධාරී වැඩ අධිකාරි තුමා යවලා නිරීක්ෂණය කරලා වතුර දෙන තැනට ජල සම්පත් මණ්ඩලය දැනුවත් කරන්න කියලා. අත්දැකීම් තියෙනවා, ඒවගේ දෙක තුනක් එහෙම උනේ නැ මම මැදිහත් වෙලා කෙරුවා. ඒ නිසා වතුර දෙන්න එපා සකසලා දෙනකල් කියලා ලියුමක් ගහන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, උද්ධාල මැතිතුමාට කියන්න ඕනි ඔය කියපු පාරේ ගල් 3ක ට්‍රක් එකක් එරිලා නවත්තලා තිබුණා. මේ බටේ පුපුරලා ඇති. මේක මෙහෙම වෙලා තියෙන්නේ වැළිහිඳ උළු කඩේ ළඟ. තලන එක ඉතිහාසයේත් හරියට කරේ නැ. ඒ නිසා තලන එක හරියට කරන්න ඕනි අපරාදේ නැත්නම් පාරවල් කැඩෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අරුණ මන්ත්‍රීතුමා ඉදිරිපත් කර කාරණය පිළිබඳව මම ළඟ ෆොටෝ එකක් තියනවා. මම එනකොට දැක්කා මේක. මම සතියකට විතර කලින් මහමාර්ග ඉංජිනේරු ප්‍රධානියාට දැනුවත් කරා. ඒගොල්ලන්ට ප්‍රධාන පාරේ නම් එක්සකැවේෂන් කරලා සොයිල් එක දාන්න බැහැ අලුතෙන් සොයිල් දාන්න ඕනි. ඒගොල්ලෝ මඩ පිටින් දැම්මා. ඒක දැනුවත් කරා.

ඊට අමතරව අපේ ප්‍රාදේශීය සභා පාරවල් ටිකේ තියන ඔක්කොම අඩුපාඩු පිළිබඳව කුරුණෑගල ව්‍යාපෘති ඉංජිනේරුවරයා දනුවත් කළා. එයාලා පොරොන්දු වුණා. ජල දිගුව භාර ගන්න කලින් අපේ ප්‍රාදේශීය සභාවේ වැඩ අධිකාරි මහතාට පෙන්නලා ඉවරවෙලා නිවැරදි කරමු කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, උද්ධාල මන්ත්‍රීතුමාට කියන්න ඕනි එතුමා භාරව වගකීමක් තියනවා. පාර කපන්න අවසර ඉල්ලුවානේ ඒක ස්ථිර කරානේ. ඔබතුමා ඒක බලන නිසා වගකීමෙන් බලන්න. එතකොට කිසි ගැටළුවක් වෙන්නේ නැහැනේ. ඔබතුමා ඒක කරයි කියලා හිතනවා.

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමා, සතියකට විතර කලින් කුරුණෑගල ඉංජිනේරු මහත්වරු ගෙනල්ලා මෙම සියලුම තැන් පෙන්නලා එකඟතාවයක් හදාගෙන තියනවා, ඒකට උද්ධාල මන්ත්‍රීතුමා සම්බන්ධ වුණා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස්. ප්‍රියංකර ශ්‍රී රාජ් කුමාර සමරනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, බොහොම ස්තූතියි.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න.

ඒ අනුව, අලව්ව, ඉඹුල්ගොඩ, නො 16/1 ලිපියෙහි එස්.ආර්.ජී.පී.මදුවත්ත මහතා විසින් 2025.06.26 වන දින ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපියට අනුව, අලව්ව ගිරිඋල්ල මාර්ගයේ මල්ලැහැව හන්දියට පෙර අලව්ව සිට පැමිණෙන විට වම් අත දෙසට දිවෙන තුඹුල්ල පත්තිනි දේවාල මාර්ගයේ දැනට ජලනල එලා ඇති අතර, මෙම මාර්ගය මඟින් සම්බන්ධ වන දැනට ඉදිකර ඇති නිවාස 11 සඳහා දිවෙන බොරළු මාර්ගය හරහා ජලනල එලීම සඳහා 2025/06/13 වන දින අලව්ව, ජල සම්පාදන මණ්ඩලයෙන් ඉල්ලීම් කර අතර ඒ අනුව අලව්ව, ජල සම්පාදන මණ්ඩලය හරහා 2025/06/24 වන දින මිනුම් කටයුතු සිදු කර ජල නල එලීම ඉදිරියට කරගෙන යාම සඳහා මාර්ගය පළුදු කිරිම සම්බන්ධව ප්‍රාදේශීය සභා අනුමැතිය අවශ්‍ය වී ඇත. මෙම ජල සැපයුම ලබා ගැනීම සඳහා සියලු දෙනාගේම ශ්‍රම දායකත්වය ලබාදීම හා මෙම මාර්ගය පළුදු කර ජලනල එලීම සම්බන්ධව විරුද්ධත්වයක් නොමැති බවත් මෙම කටයුත්ත කඩිනමින් සිදු කර ගැනීම උදෙසා ප්‍රාදේශීය සභා අය කිරීමෙන් නිදහස් කර මේ සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට පැමිණ සිටි ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**<u>05.12 ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව - අංක 07/03/05/12 දරණ යෝජනාව</u>**

**<u>ලංසු ඇගයීම් කමිටු සාමාජිකයින් පත් කිරීම</u>**

2025 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ මිලදී ගැනීමට නියමිත ස්කිඩ් ස්ටියර් ලෝඩරය සඳහා මිලගණන් කැඳවීමට නියමිත බැවින්, ඒ සඳහා ලංසු ඇගයීම් කමිටු සාමාජිකයින් ලෙස පහත නිලධාරීන් පත් කිරීම සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| නිලධාරි | සේවා ආයතනය |
|---|---|
| ආර්.එම්.සී.ප්‍රියනන්ද මහතා - කමිටු සභාපති (යාන්ත්‍රික ඉංජිනේරු) | යන්තෝපකරණ අධිකාරිය, නො.95, දකුණු රවුම් පාර, කුරුණෑගල |
| ඩබ්.ඊ. නිරෝෂන් මහතා - කමිටු සාමාජික (යාන්ත්‍රික ඉංජිනේරු) | පළාත් පාළන දෙපාර්තමේන්තුව |
| වයි.එම්.එම්.ටී.බී.උඩවෙල මහතා - කමිටු සාමාජික (වැඩ අධිකාරී) | අලව්ව ප්‍රාදේශීය සභාව |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න.

ඒ අනුව, 2025 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රධාන යටතේ මිලදී ගැනීමට නියමිත ස්කිඩ් ස්ටියර් ලෝඩරය සඳහා මිලගණන් කැඳවීමට නියමිත බැවින්, ඒ සඳහා ලංසු ඇගයීම් කමිටු සාමාජිකයින් ලෙස ඉහත නිලධාරීන් පත් කිරීම සුදුසු බවට පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟත්වයෙන් සභා සම්මත විය.

**<u>05.13 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී.අතුකෝරල මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව - අංක 07/03/05/13 දරණ යෝජනාව</u>**
**<u>අලව්ව රජයේ රෝහලේ ගිලන් රථය සම්බන්ධවයි.</u>**
අලව්ව රජයේ රෝහලේ ගිලන් රථය සඳහා එක් රියදුරකු පමණක් ඇති බවත් අදාල රියදුරු නිවාඩු යන දිනවලදී ඒ සඳහා වැඩ ආවරණ රියදුරකු නොමැති බවත් පෙනී ගොස් ඇති අතර, මේ සම්බන්ධයෙන් වසර ගණනාවක් සිට දැනුවත් කළද ඊට නිසි වැඩපිළිවෙලක් යොදා නොමැති බවට මෑත කාලයේදී සිදු වූ සිදුවීම්වලින් තහවුරු වී ඇත. හදිසි අවස්ථාවලදී ගිලන්රථ රියදුරකු නොමැති අවස්ථාවක අසාධ්‍ය රෝගීන් රැගෙන යාමට යාබද රෝහල්වලින් ගිලන්රථ ලබා ගැනීමට සිදුවන අතර ඒ සඳහා ගතවන කාලය රෝගීන්ගේ ජීවිත අවධානමකට ලක්වන බව පෙනී යයි. මේ සඳහා අදාල ආයතන හා නිළධාරීන් දැනුවත් කර කඩිනමින් වැඩපිළිවෙලක් සකසා දෙන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සී.පී. අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා ක්ෂණිකව න්‍යාය පත්‍රයට මේ සම්බන්ධව ඇතුළත් කරාට. ඇත්තටම මේක ඉතාමත්ම ඛේදනීය තත්වයක්. ඊට හේතුව විදිහට දකින්නේ අපි වසර ගණනාවක් ඉඳලා අපේ පාලන යටතේ තිබ්බ කාලවලදීත් මේ ප්‍රශ්නය පැන නැගුණා. මේ සම්බන්ධව ප්‍රශ්නයක් පැන නැගුණ හැම අවස්ථාවකදීම පැලැස්තර විසඳුමක් ලබා දීලා තියනවා. හදිසි අවස්ථාවකදී අපි ගියපුවහම, ගමේ රෝහලේ හදිසි ප්‍රතිකාර ගන්න එන්නේ මාලිමාවේ පාර්ශිකයෝද පොහොට්ටුවේ අයද එතකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයද කියලා බලලා ලෙඩ හැදෙන් නෑ. ඒ නිසා පසුගිය කාල සීමාව දවසේ දවස් තුනකට විතර කලින් විශේෂයෙන් අපේ ගරු යත්තල්ගොඩ මන්ත්‍රීතුමාගේ පුත්‍රරත්නය හදිසි ආපදාවකට ලක්වෙනවා. වයස අවුරුදු 18ක් විතර වෙනවා. ඇත්තටම එතුමා අසාධ්‍ය තත්තවයේ ඉඳලා තමයි රෝහලට ගෙනාවේ. පැය 2ක් විතර යනකල් අපිට බැරිවුණා ගිලන් රථයක් ගෙන්න ගන්න. ප්‍රධාන කරුණ තිබ්බේ මේ රෝහලේ රියදුරු නිවාඩු ගිහිල්ලා, ඉතින් අසාධ්‍ය හෘදයාබාධයක් කියන්නේ තප්පර ගාණකින් ජීවිතක්ෂයට පත්වෙන අවස්ථාවක්. එතෙන්ට රාත්‍රියේදී ආව වෛද්‍යවරුන්ට කතා කරාට වැඩක් නැහැ. මේක පරිපාලන ප්‍රශ්නයක්. ඉතින් හැමතැනටම කතා කරා පැය දෙකකට විතර පස්සේ තමයි ගිලන් රථය ඇවිල්ලා කුරුණෑගල අරන් ගියේ. වාසනාව තිබ්බා ඒ දරුවාගේ ජීවිතය රැකගන්න. ඉතින් අනිත් සිද්ධියක් මතක් වෙනවා හිටපු වයඹ මහ ඇමති දයාසිරි ජයසේකර මැතිතුමාගේ කාලයේ කපුවරල මංසන්ධියේ බට්ටා රථයක ලොරි රථයක් වැදිලා 16 දෙනෙක් එතෙන තුවාල ලබනවා. මම ක්ෂණිකව ඇවිල්ලා වාහන නවත්තලා ලෙඩ්ඩු අරගෙන ගියත් ඒ දවසෙත් ගිලන් රථ රියදුරා නිවාඩු ගිහින් හිටියේ. විනාඩි 45 ක් යද්දි එක අයෙක් මිය දෙනවා. ඒ මිය දෙන්නේ ගිලන් රථයක් නැති අඩුපාඩුව නිසා. ඉතින් මම කියන්නේ එදා ඉඳලා මේකතිබ්බ ප්‍රශ්නයක්. ඉතින් ඊට පස්සේ බොහොම අමාරුවෙන් දයාසිරි ඇමති තුමාට කතා කරලා කුරුණෑගලින් ගිලන් රථ 3ක් ගෙනල්ලා තමයි ලෙඩ්ඩු ටික කුරුණෑගල මහරෝහලට යැව්වේ. මන් හිතන්නේ අපි කිව්වා වගේ මේ නිලධාරින්ට තීන්දු තීරණ ගැනීමේදී ජීවිත ගැන අබමල් රේණුවක තරම්වත් තකන්නේ නැහැ. ආණ්ඩුව අපහසුතාවයට පත් කරන එකක් නෙමේ සියලුදෙනාගේම රෝහල. සමහරවිට ඔබතුමාටත් යන්න අවස්ථා එයි. මම ඒ අත්දැකීම වින්දා, මට හෘදයාබාධය හැදුණු වෙලාවේ. රෝහලේ කාර්ය මණ්ඩලයේ නොයෙකුත් ආකාරයේ ප්‍රශ්න

තිබ්බා. පැය දෙකක් තිස්සේ මගේ ඊ.සී.ජී. ගත්තේ නැහැ. මගේ නෝනත් කෑගහලා කීවහම තමා උදේ ඊසීජී එක ගත්තේ. ඒක පෙන්නුවහම හොඳයි කීවා. මට බෙත් දුන්නේ ග්‍රැස්ටරයිටික්ස් කියලා. මම පැය 17ක් හිටියා, ඒ බෙත් දීලා තිබුණේ. පාන්දර දෙකට මට ආපහු හෘදයාබාධය ඇති වුණා කියලා නෝනා කියනවා. මගේ මනස දන්නේ ග්‍රැස්ටරයිස්ටික්ස් වලට බෙත් ගත්තේ කියලා. හැබැයි එතනෙට ඇවිල්ලා ඊ.සී.ජී. වත් ලබා ගත්තේ නැහැ . පැය දෙකකට පස්සේ බෙත් දෙනවා. මගේ ප්‍රෙෂර් අඩු වෙන් නෑ 180-200 යි, ඉතින් මගේ නෝනා තේරුම් ගත්තා. නිදාගෙන හිටපු වෛද්‍යවරයාට හොඳටම දෝෂාරෝපණය කරලා මරන්නද හදන්නේ කියලා. ඒ වෙලාවේ ඇවිල්ලා ඊ.සී.ජී. පටිය ආපහු ගන්නවා. බොහෝම කලබල වුණා, මට හොඳටම අමාරුයි. ඉතින් ඒ වෙලාවේ දෙයියනේ කියලා ගිලන් රථය තිබ්බා. ගිලන් රථය තිබ්බේ නැත්නම් මා මිය දෙනවා. මට බොහෝම අමාරුයි කැනියුලා එකවත් ගහගන්න බැරුව ගියා. වෛද්‍යවරු සහ කාර්ය මණ්ඩලයට වඩා පරිපාලනමය ප්‍රශ්නයක් තියෙන්නේ. ඉතින් මා ඉතාම ගෞරවයෙන් ඉල්ලනවා ඔබ තුමාගෙන් ඒ අවස්ථාව ඔබට මට තව කෙනෙකුට උදා වෙන්න පුළුවන්. ඒ නිසා මේ දරුවට වුණ කටයුත්ත තව කෙනෙකුට නොවෙන්න වගබලා ගන්න ඕනි. මේකට අවශ්‍ය නම්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ රියදුරු නිත්‍ය රියදුරු නොමැති දවසකට රාත්‍රියට ගන්න පුළුවන්. මේක පොඩි ප්‍රශ්නයක්. එහෙම නැත්නම් කුරුණෑගලින් සෞඛ්‍ය වෛද්‍ය අධ්‍යක්ෂකවරියට නිවාඩු ගැන ඕටී එකක් යන එක විතරයි වෙන්නේ. මේක ඉතාම බැරෑරුම් තත්වයක්. යත්තල්ගොඩ මන්ත්‍රීතුමා අපි හිත්දා කතා කරනවා හැබැයි මේ සම්බන්ධව අහිංසක මිනිස්සු කීදෙනෙක් මිය දෙන්න උනාද කියලා කොහෙන්වත් ආවේ නැහැ. මා ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මාධ්‍ය සොයුරට, මේ ප්‍රශ්නය අපේ මාධ්‍යයේ මතු කරන්න. මේක ජනාධිපතිතුමාගේවත් ආණ්ඩුවේ ප්‍රශ්නයක්වත් නෙවේ. මෙතන ගොඩාක් වෙලාවට තියෙන්නේ රජයවල් වැටෙන්නේ, ඒ වගේම රජයේ ප්‍රතිපත්ති තීන්දු වෙනස් කරනනේ නිලධාරීන්, දූෂණය වංචාව එන්නේ එතෙනින්. ඒ නිසා මේ සම්බන්ධව කටයුතු කිරීම අංක එක වෙන්න ඕනි, උපතේ ඉදලා මරණය වෙනකල් අපි කටයුතු කරන ආයතනයක් අපේ ප්‍රාදේශීය සභාව. ඔබතුමාට තනි තීරණ ගන්න බැහැ. හැබැයි ඔබ තුමාට පුළුවන් 26 දෙනාගේම අනුමැතිය අරගෙන වයඹ සෞඛ්‍ය වෛද්‍ය සේවා අධ්‍යක්ෂතුමාට, ඔබතුමාගේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට, ආණ්ඩුකාරතුමාට කතා කරන්න. මේක ඉතාමත්ම බැරෑරුම් කර්තව්‍යක පුණ්‍ය කටයුත්තක් නිසා මම මේ අවස්ථාවට ඔබ සියලුදෙනාගෙන්ම ගෞරවනීය අපේක්ෂාව ඉල්ලා සිටිනවා ප්‍රාදේශීය සභාව වෙනුවෙන් ජනතාව එවලා තියෙන්නේ මෙවැනි මිනිසුන්ගේ අහිංසක දේවල් ජීවිත ආරක්ෂා කර ගන්න.ඒ නිසා මේ පොඩි දෙයින් ජීවිත කීයක් වැනසෙනවාද කියන එක අපි දන්නේ නැහැ. ඒ නිසා ඒ ගැන විශේෂ අවධානය යොමු කරලා කටයුතු කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. හදිසි දැනුම් දීමකින් මේක සභාගත කිරීම සම්බන්ධව අපේ ගෞරවනීය ප්‍රණාමය ඔබතුමාට පුද කරන ගමන් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් මට කතා කරන්න සිද්ධ වෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාත් දැනුවත්. එදා නම වෙනිදා රාත්‍රියේ මගේ දරුවා හදිසියේ රෝගී වෙනවා. එයාට හුස්ම ගන්න බැරුව දැඩි අපහසුතාවයට පත්වෙනවා. ඊටපස්සේ මගේ වාහනෙන් ක්ෂණිකව අලව්ව රෝහලට අරගෙන යනවා. ඒ ඉන්න අතරේ අතුකෝරල මන්ත්‍රීතුමා කතා කරලා දැනුවත් කළා. මගේ සහෝදරයා කීවා අපි මෙතෙනට එන් නැතුව දරුවාව වරකාපොල රෝහලට යමු කියලා. හැබැයි දරුවාගේ තත්වය අවධානම් කියලා හිතුණා. ඒ නිසා මූලික ප්‍රතිකාරයක්වත් ගන්න අලව්වට එක්කන් යමු කීවා, ගිලන්රථය තියනවානේ කියන අදහසින් මම කීවේ. ඊටපස්සේ අපි මේ ස්ථානයට ඇතුළත් වුණා. ඇත්තටම කාර්ය මණ්ඩලය ගැන මම මොකුත් කියන් නැහැ. ඒගොල්ලෝ ඉතාම ඉක්මනින් ටොලියක් ගෙනල්ලා දරුවාව අරගෙන ගිහිල්ලා වෛද්‍යවරයා හෙදියන් විශාල කැප කිරීමක් කරා. ඒගොල්ලෝ පුළුවන් උපරිමය කරා මේ දරුවාව රැකගන්න. බෙහෝම කණගාටුයි අලව්ව ප්‍රදේශයේ එක ෆාමසියක් නැහැ. උණ බහින ඇතුළත් කරන වේදනා නාශක කරලක් ගන්න, ඒවගේම රෝහලෙත් එක් වේදනා නාශක කරලක් නැහැ. ඇත්තටම කණගාටු වෙනවා ඒ වෙලාවේ මා දැඩි අපහසුතාවයට පත්වුණා. මම දන්න දෙවිවරු ඔක්කෝටම ඉල්ලීම් කරලා කනලව් කරා මගේ දරුවාගේ ජීවිතය බේරලා දෙන්න කියලා. මොකද දෙමාපියෙක් වශයෙන් මා අදටත් කම්පා වෙලා ඉන්නේ. මොකද මේ දරුවාගේ මොළයට විෂ බීජයක් ගිහිල්ලා කොන්දෙන් වතුර අරගෙන චෙක් කරා 50% ක් විතර විෂ බීජය මොළේ වර්ධනය වෙලා. තව දින 14ක් ප්‍රතිකාර කරන්න ඕන රෝහලේ. ඉතින් මූලික ප්‍රතිකාර ටික වුණාම දරුවාව ගෙනියන්න ඕනිකමක් තිබ්බේ, හැබැයි ගෙනියන්න අවස්ථාව උදා වුණේ නැහැ. ගිලන් රථය කුරුණෑගලින් මෙහෙට එනකොට පැය දෙකක් ගියා . මෙතුමා කතා කරලා

දඹදෙණියෙන් ගෙන්නන්න හැදුවා. ඒවගේ ගොඩාක් උත්සාහ කරා. නමුත් ඒ අවස්ථාවත් මඟ හැරුණා. පැය දෙකකින් විතර වගේ ගිලන් රථය ආවා. මේ ගිලන් රථයට දරුවාව දාගත්තා. ඉතා කණගාටුයි කියන්න ඒසී එක වැඩ නැහැ. ඔක්සිජන් නැහැ. කිසිම කිසිදෙයක් ඇතුළේ නැහැ. පරණ ලොරිබොඩියක් හා සමානයි. මම ඇහුවා ළමයාට අමාරු වුණොත් ඔක්සිජන් ටිකක් දෙන්නේ කොහොමද කියලා. ළඟම තියන රෝහලට දානවලු. ළඟම කියන්නේ පොල්ගහවෙල ඊළඟට ආයේ තියෙන්නේ කුරුණෑගල. දෙන්න ඔක්සිජන් නැහැ හුස්ම ගන්නේ අපහසුවෙන්. අඩුම ඒසි එකවත් වැඩ නැහැ. ඒ ඇම්බියුලන්ස් එකේ ගියක් එකයි මගේ කාර් එකේ ගියත් එකයි. හැබැයි ඒක කරන්නත් මෙතනින් අවසරයක් නැහැ. කුරුණෑගලට ඇතුළත් කළ වෙලේ ඉදන් ප්‍රතිකාර සියල්ල නිසි ආකාරව සිද්ද කළා. එහි වෛද්‍යවරුන් ඇතුළු හෙද කාර්ය මණ්ඩලයට ස්තුවන්ත වෙනවා. ඒ කරපු කැපකිරීම ගැන අලව්වෙත් ඒ කාර්ය මණ්ඩලයට ස්තුතිවන්ත වෙනවා. නමුත් රියදුරෙක් නැහැ කියන ගරු සභාපතිතුමනි කණගාටුවට කරුණක්. රූකාන්ත ගුණතිලක මහතා ඇතුළුව අපි පැය 04ක් ඉදල තමයි ගිලන්රථය අරගෙන ආවේ. ඒ ගිලන්රථයට ඉන්නේ එක රියදුරයි තව එක්කෙනෙක් යොදව ගන්න බැහැ කියන්නේ කණගාටුදායකයි. ගිලන් රථයක් නැහැ කීවානම් සාධාරණයි. රියදුරෙක් නැහැ එයා නිවාඩු කියන එකට වඩා. ගරුසභාපතිතුමනි, ඒ නිසා මින් ඉදිරියට මෙවැනි දේවල් වෙන්න ඉඩදෙන්න එපා. අතුකෝරල මන්ත්‍රීතුමා කීවා වගේ යත්තල්ගොඩ දුම්රිය අනතුරේදී සෙනඟ ඇද්දේ ට්‍රැක්ටර්වලින්.ඒ වාගෙන් ඇදපු වෙලාවේ කීපදෙනෙක් ගිලන් රථයක් නොමැතිවීම නිසා මියැදුණා.
ඒ අනතුරෙන් 21ක් මැරුණා. අපිට අයිති අපේ රෝහල මේකනේ. ඒ නිසා මෙතන හරි ආකාරව තිබුණා නම්, දඹදෙණිය වරකාපොල ගෙනියන්න ඕනි නෑනේ. කුරුණෑගලවත් යන්න ඕනිකමක් නෑ. ඒ නිසා ඔබතුමා මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරලා ගිලන්රථ සේවාව නිසි ආකාරව පවත්වාගෙන යන්න අවස්ථාව සලසා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වගේම මේ වෙලාවේ ඒ දරුවා වෙනුවෙන් ප්‍රතිකාර කරන වෛද්‍යවරුන් සහ හෙදියන් ඇතුළු කාර්ය මණ්ඩලයටත් මගේ ගෞරවනීය ප්‍රණාමය පුද කරන අතර ඔබතුමාලත් ඒ වෙනුවෙන් කරපු කැපකිරීම සම්බන්ධව ගෞරවනීය ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මම ප්‍රථමයෙන්ම යත්තල්ගොඩ මැතිතුමාගේ පුතාට ඉක්මන් සුවය ප්‍රර්ථනා කරනවා. ඊළඟට යත්තල්ගොඩ මන්ත්‍රීතුමා ඔක්කොමලා වරදක් කරලා තියනවා. ඔයාලා ඔක්කොමලා දන්නවා අලව්ව රෝහලේ තත්වය. රෝහල ගැන තරුණයෝ මුහුණුපොතේ දාන්නේ "අලව්ව රෝහල ඉරක් ඇදලා ජයරත්න මල්ශාලාව" කියලා. මම එහෙම කියන එකක් නෙවේ තරුණයෝ දාන දෙයක්. සමහර අය අලව්ව රෝහලට ඇඩ්මිඩ් වෙන්න භයයි. අපි කෙලින් කතා කරන්න ඕනි. එදා කඩිනමින් වරකාපොල ගෙනිච්ච නම් ඔය තත්වය උදා වෙන්නෑ. ඒත් මෙතන පැය ගාණක් තියාගෙන හිටපු වෙලාවේ, මාහරගමට ගෙනිච්ච නම්. ඔයාලා හිතන විදිහ හරි. ඊළඟට ගිලන් රථය තිබ්බොත් රියදුරු හිටියොත් ඊටත් වඩා ලොකු ප්‍රශ්නයක් මෙතන තියනවා. පොඩි උණක් හැදුනත් කඩිනමින් කුරුණෑගල රෝහලට ලියනවා. සාමාන්‍ය ලෙඩෙකුත් මෙයාලා ට්‍රාන්සර් කරනවා. එහෙම වරදකුත් මෙතන තියනවා. ඒ නිසා මුලින්ම කරන්න ඕනි පරිපාලනය වෙනස් කරන එක. විශේෂයෙන්ම ඔබතුමාලා පාර්ලිමේන්තු මන්ත්‍රීතුමාට කියලා හොඳ වෛද්‍යවරයෙක් ගේන්න ඕනි. මේක විධිමත් කරන්න ඕනි. ප්‍රතිකාර ගත්තොත් මාහරගම වරකාපොල රෝහල් හොඳින් සිද්ධ කරනවා. සුපිරි රෝහල්. ඉතින් ඒ මට්ටමටවත් ගේන්න අපි ඔක්කොම එකතු වෙලා කටයුතු කරමු. ඊට උදව් කරන්න ඕනි. ඒ වගේම ගිලන් රථ රියදුරෙක් ගන්න. ඔබතුමාගෙන් පළාත් වෛද්‍ය අධ්‍යක්ෂකතුමාටත් ලියලා මන්ත්‍රීතුමාත් මැදිහත් වෙලා ඒ කටයුත්ත කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති පී.ජී.අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමන්ලා, මේ සම්බන්ධයෙන් පෞද්ගලිකව මම දැනුවත් වෙලා හිටියා එතුමා මට කතා කළා. මම අදාල පාර්ශවයන් සමඟ කතා කරලා අවසානයේ සම්බන්ධ කරගන්න පුළුවන් වුණේ කුරුණෑගල රෝහලෙන්. මට පොරොන්දු වුණා පැය කාලෙන් ගිලන් රථයක් එවනවා කියලා. ඒ වෙලාවේ රෑ 10ත් පහුවෙලා. ඉතින් මටත් පුළුවන් පෞද්ගලික සම්බන්ධීකරණයක් හදලා දුන්නා. මට ආයෙත් කතා කරලා කීවා දරුවාට ලොකු හානිකර තත්වයක් නැහැ කියලා. මම ඒකත් දැනුවත් වුණා. ඇත්තටම මන්ත්‍රීවරුනි නිකන් පැවස් දෙක නිකන් මැහුම් දෙකක් ගහන්න ඕනි තුවාලෙට අපි මොකද කරන්නේ ඒත් රෝහල් යනවා. අපි අලව්ව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු හැටියට ගරු මන්ත්‍රී තුමනි, තුමියනි මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අශෝක ගුණසේන මැතිතුමාත් දැනුවත් කරමින් සියලු මන්ත්‍රීවරුන් මෙම කාරණා ටික

ලිඛිතව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරමු. ඒ හරහා මේක දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරමු. නිලධාරීන් සමඟ පමණක් මේක සාකච්ඡා කරලා විසඳ ගන්න බැහැ. ඒ නිසා ඒකට අදාලව සභාවේ මට්ටමෙන් අපි හැමෝම අත්සන් කරලා ප්‍රාදේශීය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යෝජනාව ඉදිරිපත් කරලා එතනින් ඉහළට ගෙන යමු. ඒ සඳහා අදාල ක්‍රියාමාර්ග ඉදිරියේදී මම ගන්න කටයුතු කරනවා. කවුරුත් දැනුවත් තත්වයක් මේක. ඒ නිසා ඒක වළක්වා ගන්න ඉදිරියේදී කටයුතු කරමුයි කියන ඉල්ලීම කරනවා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු උප සභාපතිතුමියනි, ගරු මන්ත්‍රීතුමන්ලා තුමියන්ලා, මේ සඳහා එකඟත්වය ලබා දෙන්න.

ඒ අනුව, අලව්ව රජයේ රෝහලේ ගිලන් රථය සඳහා සඳහා අදාල ආයතන හා නිලධාරීන් දැනුවත් කර කඩිනමින් වැඩපිළිවෙලක් සැකසීම සුදුසු බවට පැමිණ සිටි ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**06.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම - නැත**

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තා සහ වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම**

**(07.1) ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූනි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි,අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූනි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා .

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූනි මස ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට පැමිණ සිටි ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**(07.2) 2025 ජූනි මාසය -ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූනි මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූනි මාසය ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සමන්ත ලක්ෂ්මන් යත්තල්ගොඩ මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2025 ජූනි මස ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට පැමිණ සිටි ගරු මන්ත්‍රී මණ්ඩලයේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**08.** **වෙනත් කරුණු ඉදිරිපත් කිරීම.**

**8.1 නිවාඩු අනුමත කිරීම.**

**අද දින සභාවට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හට අද දිනය නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.**

1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. චමින්ද මාල් මැතිතුමා
2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.පී. සිරිල් ජයවර්ධන මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සුසිල් ප්‍රේමසිංහ මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මා ස්ථිර කරනවා

ඒ අනුව, 2025.07.11 වන දින මහ සභා රැස්වීම සඳහා සහභාගී නොවූ ඉහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හට එදින නිවාඩු අනුමත කිරීම සුදුසු බවට පැමිණ සිටි සියලු ගරු මන්ත්‍රී මණ්ඩලයේ ඒකඟත්වයෙන් සභා සම්මත විය.

**8.2 අදහස් දැක්වීම**

**8.2.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමනි, අලව්ව නගර සංවර්ධන කටයුත්ත ක්‍රියාත්මකයි. පසුගිය කාලයේ සභාව නැති කාලයේ කතා කළා. ඒ කාලේ ඉල්ලීමක් තිබ්බා. මේ ව්‍යාපාරික ප්‍රජාවගෙන් පාරට වතුර ගහන්න කියලා. එවෙලෙහි ලේකම් තුමිය කතා කරපු වෙලාවෙහි, සභාවේ තියන ආර්ථික මට්ටමත් එක්ක හැමදාම වතුර ගහන්න බැහැ. මේ සංවර්ධන කටයුත්ත ආරම්භ කරාම ඒකට වෙන් වෙන්න මුදල් එක්ක කියල වතුර ගහන්න ඉඩ දෙමු කියන ඉල්ලීම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා ඉන්න වෙලාවේ කීවා. දැන් මාර්ග සංවර්ධන කටයුතු ක්‍රියාත්මකයි. අධික දූවිල්ලක් ව්‍යාපාරික ස්ථාන ඇතුළේ හමාගෙන යනවා. ඒ නිසා මං ඉල්ලීමක් කරනවා මාර්ග සංවර්ධන අධිකාරියේ නිලධාරීන් සමඟ සාකච්ඡා කරලා අඩුම ගානේ උදේටයි හවසටයි බවුසර් 2ක් භාවිතා කරලා මේ වතුර ටික ගහන්න කියන්න කියලා.

**ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**
ගරු මන්ත්‍රීතුමාලා, මම ගිහිල්ලා කතා කරලා විසඳගත්තා,කාණු තිබ්බ තැන් ගොඩ කරලා. නැත්නම් වලවල්නේ තිබ්බේ. මේ කරපු ඉල්ලීමත් කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. උද්ධාල අරුණසිරි මැතිතුමා**
ගරු සභාපතිතුමනි, මොහාන් මන්ත්‍රීතුමා කරපු යෝජනාව සම්බන්ධයෙන් මමත් හොයලා බැලුවා. ඔතන කාණු පද්ධතිය පිළිබඳ හොයල බැලුවහම ඒගොල්ලෝ කියන්නේ,වතුර ගහන්න භාරගෙන තියෙන්නේ.අවම ලංසුවකට දීලා තියෙන්නේ කියලා.ඒකෙන් කරන්නේ කියනවා. ජොෂ්ඨ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව හොඳයි. ඒ ගැනත් හොයලා බලමු කියලා ඉල්ලා සිටිනවා.

**8.2.2 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එච්. සදෙව් ලක්ජය මැතිතුමා**
ගරු සභපතිතුමනි, යත්තල්ගොඩ කොට්ඨසයේ බෝවල වසමේ මේ මස 17 වෙනිදා ජංගම සේවයක් පවත්වනවා. ඒ සඳහ ආරධනා පත්‍ර ලැබිලා ඇති ඉතින් ඒ සඳහා සහභාගී වන ලෙස ඔබතුමන්ලාට ආරාධනා කර සිටිනවා.

**8.2.3. ගරු සභාපති පී.ජී. අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා**

ගරු මන්ත්‍රීතුමන්ලා, දැනුම් දීමක් තියනවා.කාරක සභා සඳහා කැඳවනකොට පරිසර කමිටුවත්, මුදල් කමිටුවත් පවත් වන දිනයන් මාරු කරනවා. මොකද කමිටුවෙන් එන සමහර දේවල් මුදල් කමිටුවෙන් සම්මත කර ගන්න අවශ්‍ය නිසා.

අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ ගරු උප සභාපතිතුමිය ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියළු නිලධාරීන්ටත් ස්තූතිය පල කරන අතර අද දිනට නියමිත මහා සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 1.00 ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

පහත සඳහන් සංශෝධනයන්ට යටත්ව, ඉහත සඳහන් වාර්තාව ස්ථිර කරන ලද බව සහතික කරමි.

සංශෝධන -

01. 2025.07.11 දින මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන

- මහ සභා රැස්වීම් වාර්තාවේ 14 පිටුවෙහි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කළ අංක 07/03/05/05 – II දරණ යෝජනාවට අදාලව අදහස් ප්‍රකාශ කිරීම යටතේ ඉදිරිපත් කළ සංශෝධන

(I) "2014 අපි ඒකට ජලය ගන්න ඉල්ලුම් පත්‍ර දුන්නා." සහ "2014 තමයි මේකේ වැඩ අවසන් වුණේ. " යන ප්‍රකාශයන්හි 2014, 2024 ලෙස සංශෝධනය කිරීම.

(II) "මමත් ඒ ඉල්ලුම් පත්‍රය අරගෙන ජල සම්පත් මණ්ඩලයට භාර දුන්නා. භාර දුන්නහම, රු.10150.00 ක් ගෙවන්න කීවා. ". යන ප්‍රකාශයේ මුදල රු.30150.00 ක් ලෙසද සංශෝධනය කිරීම.

2025.07.11
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී.

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.